# පරම උල්පත හා මුදුන

‘දහම් නවෝදය’
මෙම ප්‍රකාශන අධ්‍යයනයේ දී
අපගේ 4වන ප්‍රකාශනය,
‘ශුද්ධාත්ම පිය සටහන්’
අංක 12 සිට ප්‍රකාශනය අග දක්වා
අධ්‍යයනය කරමින්
ජේසු සමිඳුන්ගේ අනාවරණයන් හා
එතුමන්ගේ ක්‍රියාවන් අධ්‍යයනය සඳහා
**පළමු** තැන දෙන්න, ප්‍රමුඛතාවය දෙන්න.

“ආගම යන්නෙන් මා අදහස් කරන්නේ අප අපේ නිර්මාතෘ හා සමග මුහුණට මුහුණ ලා සිටුවන සියලු ම ආගම්වලට ආධාරක වී ඇති ආගම මිස විධිමත් ආගම හෝ පාරම්පරික ආගම නො වේ. එය හිංදු ආගම ඉක්මවා යන, අයකුගේ ස්වභාවය වෙනස් කරන, නොලිහෙන ආකාරයෙන් කෙනකු තුළ වූ සත්‍යයට ඔහු බැඳ තබන, පාරිශුද්ධත්වයට පත් කරන ආගමකි. එය තමා සහ තම නිර්මාතෘවරයා අවබෝධ කරගෙන තමා සහ තම නිර්මාතෘවරයා අතර නියම සම්බන්ධකම වටහා ගන්නා තුරු ආත්මය නොඉවසිල්ලෙන් තබන පූර්ණ ප්‍රබෝධය ලබා ගැනීම සඳහා ඕනෑ ම පරිත්‍යාගයක් වැඩි යැයි නොසලකන මනුෂ්‍ය ස්වභාවයේ ස්ථිර සාර අංගය වේ.” (**මහත්මා ගාන්ධි**)

(**ආචාර්ය ශ්‍රී ක්‍රිෂ්ණ ක්‍රිපලානිගේ ‘All Men Are Brothers’, ‘එක මවකගේ දරුවෝ’** ඇසුරෙනි)

**

“ඔබ මගේ සහෝදරයා ය. මම ඔබට ආදරය කරමි. ඔබ ඔබේ පල්ලියේ වැඳුම්-පිදුම් කරනවා දකින්නට, පන්සලේ දණ නමාගෙන සිටිනවා දකින්නට, දේවස්ථානයේ යාච්ඤා කරනවා දකින්නට මා කැමති ය. ඔබත් මාත් අපි සියලු දෙනා ම එක ම ආගමක දරුවෝ වෙමු. ඊට හේතුව හැම ආගමක් ම ශ්‍රේෂ්ඨතමයාණන්ගේ අතින් විහිදී ගිය ඇඟිලි වීම ය.” - ලෙබනන් ජාතික කවියකු හා දාර්ශනිකයකු වූ **ඛලීල් ජිබ්රාන් - (ගුණදාස ලියනගේ ‘දෙව්දුරු අරටු’** ඇසුරෙනි.)

**

“මේ ගතකරන දිවියෙන් එහා, කාලයට එහා, සියලු මැනීම්වලට එහා වන යම් කිසිවක් ඇද්දැ යි මිනිසා සැම කල්හි ම සොයා ඇත. සනාතනත්වය, අමරණීයත්වය සත්‍යය ලෙසින් ම අපිරිමිත වූ අනාමික වූ දෙය - මෙය මිනිසා සොයා ඇත. .... අතිශයින් පරිශුද්ධ වූ නමක් නොමැති වූ සියල්ලෙහි ප්‍රභවය හා පරම සත්‍යය වනුයේ යමක් ද එය අනාවරණය වීම ය, ආගම යන්නෙහි නියම තේරුම.” (**ජේ. ක්‍රිෂ්ණ මූර්ති** )
(‘**මනුෂ්‍ය වර්ගයාගේ කථාන්තරය**’ - **ආචාර්ය මහින්ද පලිහවඩන**)

# පරම උල්පත හා මුදුන

## මෙය ලොව පුරා ප්‍රකාශ කිරීමට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙන ආදරයේ පණිවුඩයකි.

“ලොව පුරා මාගේ නාමයට ඉතා ආදරයෙන් ක්‍රියා කරමින් සහාවේ ඉදිරි ගමන් මඟ දෙවි පියාට අවනත වීමට ඇති අවංක ආශාවෙන් ක්‍රියාත්මක වන්නා වූ සැම සංඝයකට ම නුඹලාගේ මෙම ප්‍රකාශන යොමු කරපන්න. ඔවුහු එය වඩවඩාත් ලෝකයේ ගැළවීම සඳහා බෙදා හරින්නට මඟ බලා සිටින්නෝ වෙති. මන්ද, මාගේ වචනය මාගේ පණිවුඩය ඔවුහු සොයමින් ලත වන්නෝය. **මෙය මාගේ ශුද්ධාත්මානුභාවය තුළ ලියැවෙන්නා වූ ද ප්‍රකාශ වන්නා වූ ද දෙයක් බැවින් මේ කිසිවක් කිසි විටෙක අකුරකින් හෝ වචනයකින් හෝ වෙනස් කරන්නට ඉඩ නොතබන්න.** මාගේ අසරණ බැටළුවන් ආරක්ෂා කිරීම උදෙසා ඔබ එය ඉතා ලහිලහියේ සූදානම් කර බෙදා හැරපන්න.” (1999.07.01)

**(එනිසා ඔබට අවසර ඇත, ජේසු සමිඳුන්ගේ ඉහත සඳහන් උපදෙස් පිළිපදිමින් මෙය ලොව පුරා ඕනෑ ම භාෂාවකින් මුද්‍රණය කර බෙදා හරින්නට.)**

(මෙම ප්‍රකාශනය ඕනෑ ම ආගමක් අදහන හෝ කිසි ම ආගමක් නොඅදහන ලෝ වැසි සියල්ලන් උදෙසා ය. මෙය ලිය වී ඇත්තේ කිතු දහමට හුරු බසකිනි. සියලු බලැති දෙවියන්

වහන්සේ හෙවත් මැවුම්කරුවාණෝ හෙවත් ධර්මයාණෝ ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙලොවට වැඩියහ. මුළු මිනිස් සංහතියේ පාපය තමන් කෙරෙහි ගෙන තම උත්තම පූජක දිවි පිදීමෙන් විමුක්තිය උදා කරමින් මරණය ජය ගෙන ප්‍රතාපවත් වූ ජේසු සමිඳාණෝ ජීවමාන ව සදාතනික ව වැඩවසති. දෙවියන් වහන්සේ, මැවුම්කරුවාණෝ, ධර්මයාණෝ, ධම්ම යන ඕනෑ ම ඇමතුමකින් ඔබ ඕනෑ ම කෙනකුට මෙම ප්‍රකාශනය හා එක් විය හැකිය.)

''පේදුරු තුමාගේ මහා දේශනයේ ජොවෙල් දිවැසිවරයාගේ දිවැස් වැකිය ඉටු වන මොහොත දැන් පැමිණ ඇතැ''යි ජේසු සමිඳාණෝ ප්‍රකාශ කරති. ''**දෙවියන් වහන්සේ මෙසේ වදාරන සේක. අන්තිම දවස්වල දී සකල මනුෂ්‍යයන් හට මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරමි. එවිට ඔබේ දූ පුත්තු දිවැස් වැකි කියති. ඔබේ තරුණයෝ දර්ශන දකිති. ඔබේ මහල්ලෝ ද පැතුම් පතති. එපමණක් නොව මාගේ දැසි දසුන්ට වුව ද මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරන්නෙමි. ඔවුහු ද දිවැස් වැකි පවසති. තවද, ඉහළ අහසේ අරුම පුදුම දේ ද පහත පොළොවේ ලකුණු ද දක්වා ලමි. ලේ ද ගිනි ද දුම් වලා පටල ද ඇති වේ.''**

**(ශුද්ධ බයිබලය - ක්‍රියා 2:17-19)**

ශුද්ධාත්මානුභාවය විසින් තෝරා ගෙන, සකසා ගෙන පත් කර ගෙන ඇති මෙම සංඝය, ''මාගේ උත්තරීතර සංඝය'' යනුවෙන් අමතමින් එහි දාස දාසින් තුළින් ජේසු සමිඳාණෝ මෙසේ ප්‍රකාශ කළහ.

## 1999 ජුලි 01 වන දින

''ලොව පුරා මේ වන විට, මා ප්‍රතික්ෂේප කර, මාගේ පියාණන් ප්‍රතික්ෂේප කර, ආත්මානුභාවය ප්‍රතික්ෂේප කර, දිව්‍ය පූජයේ මාගේ ජීවමාන වැඩසිටීම ප්‍රතික්ෂේප කරන සියලු සභාවන් දැනුවත් වීම සඳහා ඔවුන් වෙත ආදරයෙන් මාගේ නාමය තුළ ඔවුන්ට සංදේශයක් නිකුත් කරපන්න. එය නුඹලාගේ තුන් වන ප්‍රකාශනය විය යුතුය.''

(ඉහත සඳහන් ප්‍රකාශනය තුළින් තුන් වන ප්‍රකාශනයට ඇතුලත් විෂය ක්ෂේත්‍රයන් ඔබට පැහැදිලි වනු ඇත. එම විෂය ක්ෂේත්‍රයන්ට අදාල ව සමිඳුන් අප සංඝයට මෙතෙක් දුන් තවත් අදහස් ස්වල්පයක් මෙලෙස ඔබ හමුවේ තබමි.)

''පියාණන් වහන්සේත්, ජේසුස් වහන්සේත්, ශුද්ධාත්මයාණන් නම් වූ ඒ සැනසිලිදායකයාණනුත් එකම සංඝයක එකම දෙවියන් බව විශ්වාස නොකරන සියලුම සභාවලට එම සංඝය එක ම දේවෝත්තමයාණන් බව තරයේ ප්‍රකාශ කරපන්න.''

''ඉදිරි කාලවකවානුවල දී මාගේ බලගතු ක්‍රියාවන් මා ප්‍රකාශ කරන්නේ දිව්‍ය සත්ප්‍රසාදය මාර්ගයෙනි. සක්‍රමේන්තු ආකාරයෙන් මා ජීවමානව වැඩසිටින්නා වූ සියලු සත්ප්‍රසාද මණ්ඩප තුළින් ඉදිරියේ දි මම නොයෙක් ආකාරයේ ක්‍රියාවල යෙදෙමින් මනුෂ්‍යයා සුදනම් කිරීමේ කටයුතු සඳහා සහය වන්නෙමි. දිව්‍ය සත්ප්‍රසාදය මගින් මගේ විමුක්තිදායක රුධිර ගංගාව හෙලන බැවින් ඔබ සැම දිව්‍ය සත්ප්‍රසාදය වටා ඒකරාශි වන්න. දිව්‍ය සත්ප්‍රසාදය මගින් මගේ ශරීරයෙන්, රුධිරයෙන් නුඹලා පෝෂණය වෙමින් නුඹලාගේ ජීවිතය අන් අයට ආදර්ශයක් වන අයුරින් මගේ දැවෙන පහන් සේ නුඹලාගේ ජීවිත සාක්ෂිය අරඹාපන්න. මගේ ජීවමාන හස්තය විසින් ම ස්ථාපිත කළා වූ මගේ රුධිරය හා මාංශය වන දිව්‍ය සත්ප්‍රසාදය තුළ මගේ ජීවමාන වැඩසිටීම විශ්වාස කරපන්න.''

## සියල්ලෝ මෙම සත්‍යය අවබෝධ කර ගනිත්වා !

මෙම ප්‍රකාශනය මේ දක්වා කියවමින් සිටින ඔබ තුළ දැන් ගැටළුවක් පැනනගින්නට පුළුවන. මෙම ප්‍රකාශනය ශුද්ධ වූ ත්‍රිත්වය හා දිව්‍ය සත්ප්‍රසාදය පදනම් වූවකි. එය කිතුනු විශ්වාසය පිළිබඳ වූවක් නො වේද? එසේ නම් මෙම ප්‍රකාශනය "ඕනෑ ම ආගමක් අදහන හෝ කිසිම ආගමක් නොඅදහන ලෝ වැසි සියල්ලන් උදෙසා" වන්නේ කෙසේ ද? ධර්මඥානයෙන් වැඩෙන්නට ආධ්‍යාත්මිකත්වයෙන් මුහුකුරා යන්නට ශුද්ධ වූ ත්‍රිත්වය හා දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳ අවබෝධයක් ලැබීම අවශ්‍යම ද?

සෑම ශාස්තෘවරයෙක් ම සෑම ශ්‍රේෂ්ඨ ගුරුවරයෙක් ම මෙලොවට පැමිණියේ (වඩාත් නිවැරදිව කියනවා නම් මෙලොවට එවනු ලැබුවේ) එක ආගමික ජන කොටසක් උදෙසා නො ව මුළු මිනිස් සංහතියේ හිත සුව උදෙසා ය. ඔවුන් ලෝකයට දුන් පණිවුඩය එක ආගමික ජන කොටසක උරුමයක් පමණක් ම නොව මුළු මිනිස් පවුලේ උරුමය යි. එසේ නම් ධර්මයාණන් ම මෙලොවට පැමිණ - ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙලොවට පැමිණ - දෙසූ දහම, සිය ජීවිතය තුළින් ජීවත් කළ දහම මුළු මිනිස් සංහතිය උදෙසා නො වේද? මුළු මිනිස් පවුල ආධ්‍යාත්මික මුහුකුරා යාමක් සඳහා එයින් පන්නරය ලැබිය යුතු නො වේද?

ධර්මයාණෝ සිය දහම තුළ තබා ඇත්තා වූ විභව ශක්තිය මිනිස් ජීවිත තුළින් චාලක ශක්තිය බවට පත් කර ගන්නා අයගේ සංඛ්‍යාව වැඩි විය යුතු මොහොත මෙය යි. ධර්ම අනාවරණයේ පරිපූර්ණත්වය ධර්මයාණන් ම ජේසුස් නමින් මිනිසත් බව ගෙන තම වචනයෙන් හා තම ජීවිතය තුළින් ලෝකයට දුන් දහම යි. ඕනෑ ම ආගමක් අදහන හෝ කිසි ම ආගමක් නොඅදහන ලෝ වැසි සියලු දෙනා තම පටු සීමා අවසන් කරමින් ධර්ම අනාවරණයේ පරිපූර්ණත්වයට, එහි සාරාර්ථයට ම පිවිසිය යුතු මොහොත දැන් පැමිණ ඇත. ශුද්ධ වූ ත්‍රිත්වය හා දිව්‍ය සත්ප්‍රසාදය ධර්ම අනාවරණයේ සරාර්ථයට ම අයිති වේ. යුගයේ සියලු ගැටළු හා ව්‍යාකුලත්වයන් පුපුරුවා හරින්නට සමත් ආධ්‍යාත්මික මහා බලශක්තියක් මුදවා හරින්නට හැකි වන්නේ ධර්ම අනාවරණයේ පරිපූර්ණත්වයේ සාරාර්ථයෙන් පෝෂණය වුවහොත් පමණි.

# ශුද්ධ වූ ත්‍රිත්වය (Holy Trinity)

මුළු විශ්වයේ, දේව දූතයන් මනුෂ්‍යයන් ඇතුළු සකල ජීවයේ මැවුම්කරුවාණෝ හෙවත් නිර්මාතෘවරයාණෝ, සැබෑ වූ එක ම දෙවියන් වහන්සේ වන සේක. උන්වහන්සේ ක්‍රියාකාරීත්වයෙන් පියාණෝ, පුත්‍රයාණෝ, ශුද්ධාත්මයාණෝ වන සේක. ඒ තුන් දෙනා වහන්සේලා වන පියාණෝ, පුත්‍රයාණෝ, ශුද්ධාත්මයාණෝ එක ම දෙවියන් වහන්සේ වන සේක. ඒ තුන් තැනැන් වහන්සේ වෙන වෙන ම ගත් කල ද දෙවියන් වහන්සේ වන සේක. ශුද්ධ වූ ත්‍රිත්වයේ අභිරහස යනු මෙය යි.

අභිරහසක් යනු සීමිත මනුෂ්‍ය බුද්ධියෙන් කිසි දා තේරුම් ගෙන නිමාවකට පත් කළ නොහැකි අසීමිත යථාර්ථයකි. ශුද්ධ වූ ත්‍රිත්වය අපගේ උතුම් ම හෙවත් පරම අභිරහස වන සේක. ශුද්ධ වූ ත්‍රිත්වය අපට යම් තරමකට තේරුම් ගත හැකිය; එහෙත් මුළුමනින් තේරුම්ගත නොහැකිය. ශුද්ධ වූ ත්‍රිත්වික සංඝය, අත්දැකීමට පිවිසිය හැකිය; අත්දැකීම තුළ වඩාත් ගැඹුරින් පසක් කර ගත හැකිය; එහෙත් මුළුමනින් අවබෝධ කර ගත නොහැකිය.

එක ම දෙවියන් වහන්සේ ක්‍රියාකාරීත්වයෙන් වහන්සේලා තුන් දෙනෙක් වන්නේ කෙසේදැ යි අපි විමසා බලමු. කෙනෙක් කරන ඕනෑ ම වැඩක් තුළ ඔහුගේ හෝ ඇයගේ ස්වභාවය තිබේ. ඔහුට හෝ ඇයට ම ආවේනික ස්වභාවය ඒ වැඩය තුළ දැකගත හැකිය. මුළු විශ්වය දෙවියන් වහන්සේගේ අත්වැඩය යි. ඒනිසා ඒ තුළ දෙවියන් වහන්සේගේ ස්වභාවය තිබේ. ඒ ස්වභාවයේ එක ගුණාංගයක් ගැන පමණක් මෙහි දී අපගේ අවධානය

යොමු කරමු. මුළු මැවීම තුළ ලබා ගැනීමේ ගුණය ඇත. මක්නිසාදත්, එය මැවුම්කරුවාණන් තුළ ද ඇති බැවිනි. ලබා ගැනීමේ ගුණය යනු හිස් ව විවෘත වීමේ ගුණය යි.

ලබා ගැනීමේ ගුණය මුළු සොබා දහම (Nature) ඇතුළු ශාක ජීව, සත්ව ජීව, මනුෂ්‍ය ජීව සියල්ල පිළිබඳ පොදු සත්‍යයකි. අපි ශාක ජීව ඇසුරෙන් ශාක පත්‍රයක් ඇසුරෙන් මේ ලබා ගැනීමේ ගුණය අවබෝධ කර ගනිමු. මැවුම්කරුවාණන් ස්වකීය සැලැස්ම තුළ ක්ලෝරොෆිල් හෙවත් හරිතප්‍රද දී ඇත්තේ ශාක පත්‍රයට යි. එනිසා සෑම ශාක පත්‍රයක් ම සිය ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය තුළ ආහාර නිපදවීමේ කර්මාන්ත ශාලාවක් වැනි ය. ශාක පත්‍රය (හරිතප්‍රද) හිරු එළිය, වාතය, ජලය <u>ලබා ගැනීමේ ක්‍රියාවලියක</u> නිරන්තරයෙන් යෙදී සිටී. හිස් ව විවෘත වීම තුළින් ලබා ගැනීමේ ගුණය මනුෂ්‍යයා ඇතුළු මුළු මැවීම පිළිබඳ යථාර්ථයක් බව හොඳින් මෙනෙහි කර අවබෝධ කර ගන්න.

දෙවියන් වහන්සේ මුළු මැවීමේ නිර්මාතෘවරයාණෝ ය. මුළු මැවීම එතුමන්ගේ අසීමිත ප්‍රේමයේ ගලා යාම යි. එතුමන්ගේ මුළු මැවීමට හෝ එතුමන් දරාගත නොහැකිය. එතුමන්ගේ මුළු මැවීමට වඩා එතුමාණෝ අසීමිත ලෙස සුවිශාල වෙති. එතුමාණෝ ස්වකීය මුළු මැවීම දරා සිටිති. හැම ජීවිතයක ම හැම හුස්ම පොදක් ම උන්වහන්සේගේ හස්තයෙහි ය. මුළු බලය උන්වහන්සේගේ ය. එහෙත් ඒ බලය උන්වහන්සේ ව නාස්ති කර නැත. (අප එසේ කියන්නේ බලය බොහෝ විට මිනිසා ව නාස්ති කරන බැවිනි.) ඒ අසීමිත බලය නිසා උන්වහන්සේ හිස උදුම්මාගෙන නැත. මුළු බලය එතුමන්ගේ වුව ද එතුමෝ තමන්ගෙන් හිස් වෙමින් විවෘත වෙමින් ලබා ගැනීමට නිරන්තරයෙන් සූදානම් ව සිටිති. එනිසා එතුමෝ මහත් සේ නිහතමානී වෙති; තම මැවීම කෙරෙහි එතුමන්ගේ ඉවසීම පුදුම සහගතය. එනිසා සමිඳුන් අපගේ පැසසුමට, නැමඳුමට නිසි වන්නේ ම ය.

මැවුම්කරුවාණන් අදහන ක්‍රිස්තියානි, හිංදු, ඉස්ලාම් ආගම් මැවුම්කරුවාණන්ගේ ප්‍රේමය, ජීවනය, රැකවරණය ලබනු සඳහා තමන්ගෙන් හිස් ව මැවුම්කරුවාණන්ට විවෘත විය යුතු බව අදහති. ඔවුන්ට යාච්ඤාව, භාවනාව යනු එය යි. මහායාන බුදු දහම ද තමන්ගෙන් හිස් වෙමින් ගෞතම බුදුන් වහන්සේට ද, පැවැත්ම දුන් ආදි බුදුන්ට හෙවත් භගවත් වෛරෝචනයන්ට විවෘත විය යුතු බව පිළිගනී. ධර්මයේ උල්පත අපි කිතුනු දැක්ම තුළ පියාණන් වහන්සේ යැයි හඳුන්වමු. පියාණන් වහන්සේ නිරන්තරයෙන් තමන් වහන්සේගෙන් හිස් වෙමින් විවෘත වෙමින් ලබා ගන්නට සූදානම් ව සිටිති. එහෙත් උන්වහන්සේට විවෘත වන්නට තමන් වහන්සේට වඩා වෙන බලවතෙක් නැත. එනිසා පියාණන් වහන්සේ තමන්ගෙන් හිස් වෙමින් නැවත තමන් වහන්සේට ම විවෘත වෙති. එතුමන්ගේ ම ප්‍රේමයෙන්, බලයෙන්, මහිමයෙන්, සුන්දරත්වයෙන් එතුමෝ පිරෙති; එයින් මවිත වෙති. එවිට එය එතුමන්ගෙන් ප්‍රකාශ වේ. එය පියාණන් වහන්සේගෙන් නික්මෙන එතුමන්ගේ ම වචනය යි.

මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ මැවීමක් නිසා ඉහත විස්තර කළ අත්දැකීමේ සේයාවක් හෝ ඔබ ද ලබා ඇතුවා නිසැක ය. හිරු බැස යන සැඳෑවක ඔබ බටහිර වෙරළට ගිය ගමනක් ගැන සිතන්න. බැස යමින් සිටින හිරු 'නටුවෙන් ගිලිහෙන විලිකුන් සුරත් පලයක් මෙන්' ඔබට ද පෙනෙනු ඇත. නොයෙක් පැහැයෙන් යුත් වලාකුළු අහසේ ඇඳී ඇත. ඒ වලාකුළුවල ජායාව සාගර ජලයේ සිත්තම් ව ඇත. මඳ සුළඟ ඔබ ගත-සිත වැළඳ ගනී. ඔබ රසඥතාවය හඳුනන්නකු නම් ඒ සුන්දර දර්ශනයට ඔබ සමීප වන විට ඔබ එකිනෙකා අතර කතා-බහ නිරායාසයෙන් ම නවතී. ඔබට ඔබව ම, ඔබගේ ගැටළු සියල්ල ද අමතක වෙයි. මේ මහා දර්ශනයෙන් ඔබ පිරෙනු ඇත; එයින් ඔබ මවිත වනු ඇත. එවිට ඒ අත්දැකීම ඔබගෙන් පිටාරා ගලනු ඇත. එය සිදු වන්නේ දීර්ඝ හුස්මක් වශයෙනි; නිරායාසයෙන් ම මතු වන දීර්ඝ ආශ්වාසයක් හා ප්‍රාශ්වාසයක් වශයෙනි. පියාණන් වහන්සේ තුළ ද එවැන්නක් සිදු වන බව යි අප ඉහතින් පැවසුවේ.

මනුෂ්‍යයාගේ වචනයට බලයක් තිබේ. දෙවියන් වහන්සේගේ වචනයට පණ තිබේ. එනිසා පියාණන් වහන්සේගෙන් නික්මෙන වචනය ශුද්ධ බයිබලය හඳුන්වන්නේ වචනය තෙම, වචනයාණෝ, වාක්‍යයාණෝ, ධර්මයාණෝ වශයෙනි. ඇරමයික් බසින් (ජේසු සමිඳුන් මනුකය තුළ

සිටිය දි කතා කල බසින්) ඩබාර් යනුවෙන් ද ග්‍රීක් බසින් ලෝගොස් යනුවෙන් ද හැඳින් වේ. පියාණන් වහන්සේගෙන් නික්මෙන වචනයාණෝ පියාණන් වහන්සේගේ පුත්‍රයාණෝ ය; ශුද්ධ වූ ත්‍රිත්වයේ දෙවන තැනැන් වහන්සේ ය; මානව ඉතිහාසය තුළ ජේසුස් නමින් මනු කය ගෙන මෙලොවට වැඩියෝ එතුමාණෝ ය.

පියාණන් වහන්සේ ද එතුමන්ගෙන් නික්මෙන පුත්‍රයාණන් වහන්සේ ද මුළුමනින් ම එක සමාන වන්නාහ. "**මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේය." (ජුවාම් 14: 9)** මනු කය ගත් වචනයාණන් වන ජේසු සමිඳුන් තම මරණයට පෙර දින එලෙස ප්‍රකාශ කළේ එබැවිනි. පියාණන් වහන්සේගේ ඒ මහා ආශ්වාසය තුළ පියාණන් වහන්සේ මුළුමනින් ම අන්තර්ගත වන්නාහ. එබැවින් එතුමන්ගෙන් නික්මෙන ඒ මහා ප්‍රාශ්වාසය තුළ ද එතුමෝ මුළුමනින් අන්තර්ගත වන්නාහ. පැරණි සමහර ගුරුවරුන් තම සිසුන් තමන් හා සමාන නො වන පිණිස ගුරු මුෂ්ටිය තබා ගත් බව අපි අසා ඇත්තෙමු. පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් ස්වාමින් වහන්සේ දෙවි පියාණන් හා මුළුමනින් සමාන වන්නේ කෙසේද? පියාණන් වහන්සේ ගුරු මුෂ්ටිය තබා නොගෙන තමන් වහන්සේගෙන් නික්මෙන වචනයාණන්ට තමන් වහන්සේ ව මුළුමනින් දානය කරන බැවිනි.

එහෙත් පියාණන් වහන්සේ හා පුත්‍රයාණන් වහන්සේ අතර කැපී පෙනෙන විශාල වෙනසක් ද ඇත. තමන් පියාණන් හා සම වන්නේ පියාණන් වහන්සේගේ අනන්ත යහපත්කම හා නිර්ලෝභිත්වය නිසා බව පුත්‍රයාණෝ දනිති. පියාණන් වහන්සේ නොමැති නම් තමන් වහන්සේ ද නොමැති බව පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දනිති. එනිසා පුත්‍රයාණෝ නිරන්තරයෙන් දෙවි පියාණන්ට ගෞරව කරති, වැඳ නමස්කාර කරති, පුත්‍රයාගේ සුවිශේෂ දූත මෙහෙය හැටියට දෙවි පියාණන්ගේ කැමැත්ත ඉටු කිරීමට ඉත සිතින් කැපවෙති.

දෙවි පියාණෝ තමන්ගෙන් නික්මෙන තම පුත්‍රයාණන්ට මහත් සේ ප්‍රේම කරති. පුත්‍රයාණෝ දෙවි පියාණන්ට මහත් සේ ප්‍රේම කරති. මනුෂ්‍ය ප්‍රේමයට ද බලයක් තිබේ. දෙවි පියාණන් හා දේව පුත්‍රයාණන් තුළින් නික්මෙන ඒ දෙදෙනා වහන්සේලා අතර දැල්වෙන ප්‍රේමයට පණ තිබේ. එනිසා ඒ ප්‍රේමය ශුද්ධ බයිබලය විසින් හඳුන්වන්නේ ප්‍රේමයාණන් හෙවත් ශුද්ධාත්මයාණන් වශයෙනි. ස්ප්‍රිතු සාන්තු වහන්සේ යනු එතුමන් හැඳින්වෙන තවත් නාමයකි. ජේසු සමිඳාණෝ ශුද්ධාත්මයාණන් වහන්සේ ව සහය දායකයාණෝ, සැනසිලි දායකයාණෝ, සත්‍යතාවයේ ආත්මයාණෝ යන ප්‍රකාශවලින් ද හැඳින්වූහ. පියාණන් වහන්සේ හා පුත්‍රයාණන් වහන්සේ ප්‍රේමයාණන් තුළ නැවත ඒකත්වයක් වන්නාහ. ඇරමයික් බසින් ශුද්ධාත්මයාණන් 'රුවාහ්' නමින් හැඳින් වේ.

දෙවි පියාණන්ගේ වචනයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවි පියාණන් විසින් මවනු නොලැබ දෙවි පියාණන්ගෙන් නික්මුණ සේක. දෙවි පියාණන්ගේ වචනයාණන් හා ආත්මයාණන් තුළින් මුළු මැවීම නිර්මිත විය. ඩබාර් සහ රුවාහ් එක් ව හැසිරෙන සැම තැන ම, සැම විට ම මැවීම සිදු වේ. පාපය නිසා වැටුණු මැවීම නැවත මැවීමේ ක්‍රියාවලියේ ශුද්ධාත්මයාණෝ නිරන්තරයෙන් නියැලී සිටින්නාහ. දේව පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවි පියාණන් ඉදිරියේ මුළු මැවීම වෙනුවෙන් මහා මැදිහත්කරුවාණන් ලෙස සහභාගි වෙති. දෙවි පියාණන්ගේ කැමැත්ත ඉටු කිරීම සඳහා (දෙවි පියාණන් කෙරෙන් නික්මුණ කිසිවෙකු හෝ විනාශ නො වනු සඳහා) දෙවි පියාණන් අබියස ජේසු සමිඳාණෝ නිරන්තරයෙන් වැය වන්නාහ. විශ්වයේ සිදු වන නිරන්තර මහා යාච්ඥාව මෙය යි. ඒ මහා යාච්ඥාව හා එක් වෙමින් මරිය තුමිය සහය මැදිහත්කාරිය ලෙස මිනිස් පවුලේ ගැළවීම උදෙසා වැය වන්නිය. ස්වර්ග රාජ්‍යයේ සියලු ජයලත් ආත්මයෝ ඒ මහා යැදුමට නිරන්තරයෙන් එක් වන්නාහ. ක්‍රිස්තියානි යාච්ඥාව යනු විශ්වයේ සිදු වන ඒ නිරන්තර මහා යාච්ඥාවට සහ එහි උදාර අරමුණට සම්බන්ධ වීම යි. විශ්වයීය මහා යාච්ඥාවට සම්බන්ධ වන්නට නම් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ව දේව පුත්‍රයාණන් බව පිළිගත යුතුයි. එවිට මහෝත්තමයාණන් වහන්සේට 'පියාණෙනි' යැයි අමතන දේව පුත්‍ර භාවයේ ආත්මය ලැබේ.

පියාණන් වහන්සේ නීති දායකයාණෝ ය. (නීතිය දානය කරන තැනැන් වහන්සේ) පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පියාණන්ගෙන් නික්මෙන නීතිය යි. ඒ නීතිය මුළු

විශ්වය සිසාරා සොබා දහම හා ජීවය වැළඳ ගනිමින් එහි හැම කූපයක් තුළ ම වැඩසිටිති. බීජයක් පැල වන්නට නීති මාලාවක් ඇත; මලක්, පලයක් වන්නට නීති මාලාවක් ඇත; මනුෂ්‍ය ශරීරය තුළ ආහාර ජීර්ණ, රුධිර සංසරණ නීති මාලාවක් ඇත. ඒ මුළු නීතිය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය. එතුමෝ මරණය මරා ජය ගත් උත්ථාන වූ ජේසුස් හැටියට පමණක් නො ව හැම මනුෂ්‍යයකුගේ ම වේදනා තුළ අද ද වේදනා විඳින ජේසුස් හෙවත් කුරුසියේ තනි වූ ජේසුස් (මිනිසා විඳින ලොකු ම වේදනාව වන තනි භාවය අත්දකින ජේසුස්) ලෙස ද වැඩසිටිති. මෙය ශුභාරංචියකි. එතුමා ජය ගත් ජේසුස් පමණක් නම් අපගේ පරාජයේ දී අපි එතුමන්ගෙන් බැහැර වන්නෙමු. අපගේ ජයග්‍රහණයේ දී අපි ජය ගත් ජේසුස් සමග වන්නෙමු. අපගේ පරාජයේ දී අපි තනි වූ ජේසුස් සමග වන්නෙමු. "**ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කරන්නට කිසිවකුට හෝ කිසිවකට නො හැකිය**" යනුවෙන් **ශුද්ධවර පාවුලු තුමා** උදම් අනන්නේ එබැවිනි. (**ශුද්ධ බයිබලය - රෝම 8: 35**) දෙවි පියාණන් නීතිය දානය කරන්නා නම්, දේව පුත්‍රයාණන් පියාගෙන් නික්මෙන නීතිය නම්, විද්‍යාඥයෙක් යනු කවුද? කිසිම විද්‍යාඥයෙක් නව නීතියක් නිපදවා නැත. කිසි දා නිපද විය නො හැක. විද්‍යාඥයෙක් යනු මැවුම්කරුවාණන් දුන් නීතියක්, එහෙත් මෙ තෙක් අපට හමු නො වූ නීතියක් අනාවරණය කරන්නා ලෙස හැඳින් විය හැකිය. දෙවිඳුන්ගේ මහිමය සඳහා වන, විද්‍යාවේ ජයග්‍රයණයන් දෙවියන් වහන්සේගේ නීති මාලාව හඳුනා ගෙන ඒ නීතියට එකඟ ව ක්‍රියා කිරීම තුළින් ලැබෙන්නකි.

පියාණන් වහන්සේ දානය කිරීම ද, පුත්‍රයාණන් වහන්සේ ලබා ගැනීම ද, ශුද්ධාත්මයාණන් වහන්සේ බෙදා ගැනීම ද වන සේක. "**දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක.**" (**ශුද්ධ බයිබලය - උත්පත්ති 1:27**) දෙවියන් වහන්සේ මිනිසා මැව්වේ දානය කිරීම, ලබා ගැනීම හා බෙදා ගැනීම දැනුවත් ව ක්‍රියාත්මක කළ හැකි, කළ යුතු මැවීමක් හැටියට ය. එම ගුණාංග තුන අන්තවාදි නො වී නිසි පරිදි සිදු වන විට ඒ ජීවිතයට දේව රාජ්‍යය පැමිණ ඇත. එම ගුණාංග තුන අන්තවාදි වීමේ ගැටළු මිනිසා ඉදිරියේ ඇත. කෙනෙක් දැනට ම තමන් පූර්ණ යැයි ද තමා සියල්ල දන්නේ යැයි ද සිතයි. එනිසා කිසිවකුගෙන් කිසිවක් ඉගෙන ගන්නට සූදානම් නැත. අනෙකා කැමති වුවත් නැතත් බලයෙන් හෝ තමා දන්නා දේ දෙන්නට උත්සාහ කරයි. ඔහු පිරුණු ජෝගුවක් ලෙස ඔහු දකී. අනෙක් අය හිස් කෝප්ප ලෙස දකී. කෝප්ප ජෝගුවෙන් ලබා ගත යුතුය යි ඔහු සිතයි. කෝප්පයෙන් යමක් ජෝගුවට එක් කරනවාට ඔහු රිසි නැත. එය පිය ස්වභාවය නොමඟ යාමකි. තවත් කෙනෙක් තමන්ට කිසිවක් කළ නොහැකිය යි සිතයි.; අනෙක් අයගෙන් ම යැපේ. අනෙක් අය තමන්ට සියල්ල කර දිය යුතුය යි සිතයි. දෙ පයින් සිටින්නට නොහැකිය. පෙකණිය නොකැපු තත්ත්වයෙන් හැසිරීමට උත්සාහ කරයි. එය පුත්‍ර ස්වභාවය නොමඟ යාමකි.

පියාණන් වහන්සේ නිරන්තරයෙන් තමන්ගෙන් හිස් වෙමින් දේව පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන් වෙතට ගමන් කරති. දේව පුත්‍රයාණෝ තමන්ගෙන් හිස් ව පියාණන් හා ශුද්ධාත්මයාණන් වෙතට ගමන් කරති. ශුද්ධාත්මයාණෝ තමන්ගෙන් හිස් ව පියාණන් හා පුත්‍රයාණන් වෙතට ගමන් කරති. මෙය විශ්ව නර්තනය යි, මෙය විශ්ව රිද්මය යි. මිනිසා බොහෝ විට සියල්ලන්ගෙන් ඉවත් වෙමින් ඔහුගේ ගැටළු ගැන ම සිතයි. එය මිනිසාගේ මමත්වයේ ස්වභාවය යි; එය ඔහුගේ පාපය යි.

ශුද්ධ බයිබලය මුල පුරන්නේ පරම අභිරහස වන ශුද්ධ වූ ත්‍රිත්වය ගැන ප්‍රාථමික අනාවරණයකිනි. "**ආරම්භයේ දි දෙවියන් වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක. පොළොව පාළු ව හිස් ව තිබිණි. ගැඹුර පිට අන්ධකාරය විය. දෙවියන් වහන්සේගේ ආත්මය ජල මතුපිට හැසිරෙමින් සිටි සේක. එවිට දෙවියන් වහන්සේ ආලෝකය වේවා යි වදාළ සේක. එවිට ආලෝකය විය.**" **(උත්පත්ති 1: 1-3)** මෙය ශුද්ධ වූ ත්‍රිත්වය ගැන අනාවරණයක් නො වේද? මෙහි දෙවියන් වහන්සේ වශයෙන් සඳහන් කරන්නේ පියාණන් වහන්සේ ය. මෙහි දේව ආත්මයාණන් ගැන පැහැදිලි ව ම කතා කරයි. 'ආලෝකය වේවා' යනු වචනය යි, හෙවත් වචනයාණන් ය. මනු කය ගෙන මෙ ලොවට පැමිණි වචනයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ අනාවරණය පූර්ණ කළ සේක. (**මතෙව් 3: 16,17 සහ**

**මතෙව් 28: 19,20**) ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ ව අප මෙතෙක් කළ විග්‍රහය තුළින් කතා කළේ ධම්ම, ධර්ම කාය හෙවත් ධර්මයාණන් පිළිබඳව යි. ධර්මයේ උල්පත පිළිබඳව යි. එතුමන් තුළ ඇති ලබා ගැනීමේ ගුණය යි, එතුමන් ත්‍රිත්වික සංඝයක් බවට පත් කරන්නේ. ධර්මයාණන් ඒක පුද්ගල ක්‍රියාකාරීත්වයක් නො ව ත්‍රිත්වික සංඝයකි.

"...... ශුද්ධාත්මයාණන් සමග දෙවි පියාණන්ගේ මහිමයේ වැඩසිටින ජේසු ක්‍රිස්තුනි, එක ම ශුද්ධ වූ තැනැන් වහන්සේ ඔබ ය, එක ම ස්වාමින් වහන්සේ ඔබ ය, එක ම පරමෝත්තමයාණන් වහන්සේ ඔබ ය - ආමෙන්."

## ශුද්ධ වූ ත්‍රිත්වයේ ජීවිතය න්‍යායාත්මක ව දැන ගැනීම පමණක් පලදායි නො වේ; ත්‍රිත්වික ජීවිතය අප තුළ ප්‍රායෝගික යථාර්ථයක් විය යුතුය.

**"මෘගයන්ගෙන් අසාපන්න, උන් නුඹට උගන්වනවා ඇත. අහසේ පක්ෂීන්ගෙන් අසාපන්න, උන් ද නුඹට දන්වනවා ඇත. නොහොත් පොළොවට කතා කරපන්න, එවිට එය නුඹට උගන්වනවා ඇත. මුහුදේ මත්ස්‍යයින් නුඹට කියා දෙනවා ඇත. සමිඳාණන් වහන්සේගේ හස්තය මේ සියල්ල කළ බව මේ සියල්ලෙන් දැන නොගන්නේ කවුරුන් ද? දිවි ඇති සියලු සතුන්ගේ ප්‍රාණය ද මුළු මනුෂ්‍ය වර්ගයාගේ ආත්ම ද උන්වහන්සේගේ හස්තයෙහි ය." (ශුද්ධ බයිබලය - ජෝබ් 12: 7-10 )**

මැවීම සිය මැවුම්කරුවාණන් හඳුනයි. එහෙත් මිහි මත මැවීමේ මුදුන් මල්කඩ වන මිනිසා සිය නිර්මාතෘවරයාණන් නොහඳුනයි, හෙවත් තම නිර්මාතෘවරයාණන් හා තිබිය යුතු සබඳතාවය බිඳී ඇත. එය යි, යුගයේ සියලු ව්‍යසනයන්ට මූලික හේතුව. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙසේ වදාළ සේක. "**මා තුළ පවතින්න. මම ද නුඹලා තුළ පවතින්නෙමි. අත්ත මිදි වැලෙහි නොපවතී නම් වෙන්ව පල දරන්නට ඊට නොහැකි සේ නුඹලා මා තුළ නොපවතී නම් පල දරන්නට නුඹලාට බැරිය. මිදි වැල මම ය; නුඹලා අතු ය. යමෙක් මා තුළ පවතින්නේ ද මම ඔහු තුළ පවතිම් ද ඒ තැනැත්තේ බොහෝ පල දරයි. මක්නිසාද, මගෙන් වෙන් ව කිසිවක් කරන්නට නුඹලාට බැරිය. යමෙක් මා තුළ නොපවතී නම් ඔහු අත්තක් මෙන් පිටත දමනු ලැබ වියළී යයි." (ජුවාම් 15: 4-6)**

යමෙකුට ආගමික මහා ග්‍රන්ථයන් කියවන්නට නොහැකි වුව ද මැවුම්කරුවාණන් වහන්සේගේ මැවීම නමැති මහා පොත (සොබා දහම, Nature) කියවන්නට හැකි නම්, එහි එක පිටුවක් කියවා හරිහැටි මෙනෙහි කරන්නට හැකි නම් ඒ තුළ පවතින ශුද්ධ වූ ත්‍රිත්වයේ ජීවිතය හෙවත් ත්‍රිත්වික ජීවිතය දැන හඳුනා ගන්නට ද එය තම ජීවිතයේ අත්දැකීමක් කර ගන්නට ද හැකිය. ත්‍රිත්වික ජීවිතය යනු දීමේ, ලබා ගැනීමේ හා බෙදා ගැනීමේ ප්‍රේම ජීවිතය යි. ගෙමිදුලේ ඇති අඹ ගස දෙස ගෞරවයෙන් බලන්න අඹ ගස නමැති ඒකකය නිර්මිත වී ඇත්තේ අවයව රැසක (මුල්, කඳ, පොතු, අතු, කොළ, දළු, මල්, ගෙඩි) එකතුවෙනි. අඹ ගස ජීවත් වේ; එය වැඩේ; එය නිසි කලට අස්වැන්න දෙයි. එහි රහස කුමක්ද? ගසේ එකි නෙක අවයව අතර පවතින දීමේ, ලබා ගැනීමේ, බෙදා ගැනීමේ ප්‍රේම ජීවිතය යි.

ගසේ මුල් හා කොළ අතර ඇති සම්බන්ධය ගැන සිතා බලන්න. ගසේ මුල් කොළවලට ජලය සපයයි. කොළ විසින් නිපද වන ආහාරය මුල්වල වැඩීම සඳහා දෙයි. මෙය පියවර හතරකින් විස්තර කළ හැකිය. 1. ගසේ මුල් ප්‍රේමයෙන් යුතුව ජලය කොළවලට සපයයි. 2. මුල් විසින් සපයන ජලය කොළ විසින් ආදරයෙන් ලබා ගනී. 3. කොළ තමා නිපද වන ආහාර මුල්වල වැඩීම සඳහා ප්‍රේමයෙන් දානය කරයි. 4. කොළ විසින් දානය කරන ආහාරය මුල් විසින් ආදරයෙන් භාර ගනී. මෙය යි, සොබා දහම තුළ පවතින ත්‍රිත්වික ජීවිතය; මෙය යි, ජීවනයේ නීතිය. මෙම පියවර හතරෙන් එකක් හෝ ප්‍රේමයෙන් ගිලිහී යන තැන ඇත්තේ මරණයේ නීතිය යි.

වියළි පොළොව වැසි බිඳක් පතා අහසට මුව අයා සිටී. අහස පොළොවට වැසි දෙයි. පොළොව මහත් සොම්නසින් එය ලබයි. පොළොව නැවත අහසට දානය කරයි. වාෂ්පීකරණය යනු එයයි. අහස එය භාර ගනී. නැවත වලාකුළු සෑදෙයි. මෙම පියවර හතර ප්‍රේමය තුළ සිදු වන ක්‍රියාවලියකි. ගස ඉදුණු කොළ පොළොවට දෙයි. පොළොව එය ආදරයෙන් භාර ගනී. පොළොව එය පොහොර වශයෙන් නැවත ගසට දෙයි. ගස එය ආදරයෙන් භාර ගනිමින් වැඩෙමින් පලදරයි. ද්‍රව්‍ය බලයට හැරේ; බලය ද්‍රව්‍යයට හැරේ. මෙය ප්‍රේමය තුළ සිදු වන ක්‍රියාවලියකි.

සොබා දහම තුළ මෙම ත්‍රිත්වික ජීවිත ක්‍රියාවලිය අඛණ්ඩ ව සිදු වේ. එය කඩවී ඇත්තේ නිදහස් කැමැත්ත ඇති මිනිසා තුළ ය; මිනිසුන් අතර ය. සොබා දහම තුළ පවතින ත්‍රිත්වික ජීවිතය මනුෂ්‍ය වර්ගයා තුළ ද පවතී නම් ලෝකය දැහැමි සැනසිලිදායක තැනක් වනු ඇත. පුරුෂයා රැකියාවට ගොස් නිවෙසට පැමිණි විට බිරිඳ ඔහුට තේ කෝප්පය පිළිගැන්විය යුත්තේ ප්‍රේමයේ නාමයෙනි. (පුරුද්දක් හැටියට හෝ එය නොකළහොත් කරදර සිදු වන නිසා නො වේ.) බිරිඳ ප්‍රේමයෙන් දෙන දේ ඔහු ප්‍රේමයෙන් භාර ගත යුතුයි. ඔහුගේ හොඳ හිත, ස්තුතිය වචනයෙන් හෝ ඉඟියකින් හෝ ඇයට පිළිගැන් විය යුතුයි. ඇය එය සතුටින් භාරගත යුතුයි. දෙවියන් වැඩසිටින පන්ති කාමරයක් ඇති කර ගන්නේ කෙසේද? ගුරුවරයා පාඩමට හොඳින් සූදානම් වෙමින් තමන්ගේ දරුවන්ට ම මෙන් මහත් ප්‍රේමයකින් සිසුන්ට ශිල්පය දිය යුතුයි. සිසුන් එය ප්‍රේමයන් ලබා ගත යුතුයි. සිසුන් ඔවුන්ගේ හොඳ හිත, ස්තුතිය ගුරුවරයාට පිදිය යුතුයි. ගුරුවරයා ප්‍රේමයෙන් එය භාර ගත යුතුයි. මේ අවස්ථා හතරෙන් එකක හෝ ප්‍රේමයේ දහම කඩ වුවහොත් එතැන ඇත්තේ මරණයේ නීතිය යි.

අද මෙන් එදා ආගමික පොත-පත සුලබ නො විය. එහෙත් දහම (ත්‍රිත්වික ජීවිතය) ලෙයට මස මෙන් මිනිස් දිවිය හා බැඳී පැවතින. <u>පුරාතන දහම</u> යනු මෙය යි. එදා අප දිවයින 'ධර්ම ද්වීපය' විය. 'පෙරදිග ධාන්‍යාගාරය' ද විය. මේ දෙක අතර මනා සම්බන්ධයක් පවතී. ශුද්ධ බයිබලයේ වාර්තා වන අයුරින් ලෝකයේ පළමු වන මිනීමැරුම - කායින් විසින් ආබෙල් මරා දමනු ලැබීම - ඒ මොහොතේ දෙවිඳාණෝ කායින් අමතා මෙලෙස පැවසූහ. "**නුඹ කුමක් කළෙහි ද? නුඹේ සහෝදරයාගේ ලේ තැවරුන පොළොව නුඹට විරුද්ධව මට මොරගසයි. නුඹ භූමිය වගා කරන කල <u>ඇය මෙතැන් පටන් ඇගේ සාරවත්කම නුඹට නොදෙන්නීය.</u>" (උත්පත්ති 4: 10,12)** පාලකයින් දැහැමි වන විට කලට වැසි වසී; පොළොව සරු අස්වනු දෙයි; එය සත්‍යයකි.

මහා නීතියක් ජීවත් කරවන්නට කුඩා නීතියක් දිවි පුදන අයුරු මුහුද දෙස, වනාන්තර දෙස බැලීමෙන් වුව ද අවබෝධ කර ගත හැකිය. එහෙත් මානව ඉතිහාසය තුළ විශ්මයෙන් අප මුසපත් කරවන මහා සිද්ධියක් සිදු වී තිබේ. එනම් කුඩා නීතිය (මිනිසා) ජීවත් කරවන්නට මහා නීතිය (නීතිදායකයාණෝ, මිනිස් බව ගෙන මෙලොවට වැඩිය ධර්මයාණෝ) ප්‍රේමයෙන් දිවි පිදූහ. එතුමන් එසේ කළේ මිනිසා ගැති වී සිටි මරණයේ නීතියෙන් ඔහු මුදා ගෙන ජීවනයේ නීතිය වෙතට ඔහු පමුණුවනු සඳහා ය.

එදා අරපිරිමැස්මෙන් යුත් සරල අල්පේච්ඡ සමාජයක් විය. ජනතාව තම පරිසරයට, ගහට වැලට, සතා-සිපාවාට පවා ආදරය කළහ. බත් ඇටයක් හෝ බිම ඉහිරෙන්නේ නැතිව අනුභව කරන අයුරු එදා දෙමව්පියෝ සිය දරුවන්ට ඉගැන්වූහ. බිම වැටෙන බත් ඇටය පවා පෑගෙන්නට ඉඩ නොදුන් ඔවුහු එය අහුලා පසෙකට දැමුවේ සතකුට හෝ ඉන් ප්‍රයෝජන ගත හැකි අයුරිනි. පොත කියවා එය වසා පසෙකින් තැබුවේ එය ගෞරවයෙන් සිප ගනිමිනි. තම ගොවිපල ඔවුන්ට පූජනීය තැනක් විය. ඔවුන් එහි හැසිරුනේ, කතා-බහ කළේ, වැඩපල කළේ මහත් ගරු-සරු ඇතිවය. ඔවුහු නව අස්වැන්නෙන් දානය දෙන තුරු වී ඇටයක් විකා රස නොබැලූහ. පොළොවෙන් යමක් ලැබූ විට පොළොවට යමක් දෙන්නට ඔවුහු අමතක නොකළහ. පොළොව ද ඔවුන්ට සරු අස්වනු පිදිය. කෘමි වසංගත ගොවි බිමට ළං නො විය.

මනුෂ්‍ය වර්ගයා නැවත පුරාතන දහම (ත්‍රිත්වික ජීවිතය) වෙතට පිවිසිය යුතු මොහොත උදා වෙමින් ඇත. **<u>රතු ඉංදියානු නායක සියැටල්</u>** වර්ෂ 1854 දී පැවැත් වූ මෙම

දේශනය පුරාතන දහම කුමක්දැ යි අපට කදිමට පැහැදිලි කර දෙයි. ස්වකීය ජනතාවට අයත් ඉඩම් විකුණන ලෙස ඇමෙරිකන් ජනාධිපතිවරයා විසින් කරන ලද ඉල්ලීමට පිළිතුරු වශයෙනි, සියැටල් එම දේශනය පවත්වන ලද්දේ. එය පරිසරය පිළිබඳව මෙතෙක් පවත්වා ඇති අතිශය අලංකෘත වූ ද ගාම්භීර වූ ද දේශනය ලෙස සැලකේ.

“වොෂිංටනයේ සිටින මහතැන අපගේ ඉඩම් මිලයට ගැනීමට අදහස් කරන බව දන්වා පණිවුඩ එවයි. මිත්‍රත්වයේ හා සුහදතාවයේ සුභ පැතුම් ද ඒ සමග ම මහතැන අප වෙත එවයි. මෙය වඩාත් කාරුණික යැයි කිව හැක්කේ අපගේ මිත්‍රත්වය තව දුරටත් පවත්වා ගෙන යාම ඔහුට එතරම් අවශ්‍ය නො වන බව අප දන්නා බැවිනි. කෙසේ වෙතත් ඔබගේ යෝජනාව අපි සලකා බලන්නෙමු. කවරහෙයින් ද යත් අපගේ ඉඩම් නොවිකුණන්නේ නම් සුදු මිනිසා තුවක්කු රැගෙන විත් ඒවා පැහැර ගන්නා බව අප දන්නා බැවිනි.

අහස් කුස හා පොළෝ තලයෙහි උණුසුම ඔබ කෙසේ නම් මිලයට ගන්නෙහිද? කෙසේ නම් විකුණන්නෙහිද? මේ අදහසම අපට නම් නුහුරු ය. නැවුම් වාතයේ හා රිදී දිය දහරේ හිමිකරුවෝ අපි නො වෙමු නම් ඔබ ඒවා අපගෙන් මිලයට ගන්නේ කෙසේද? මේ පොළෝ තලයෙහි සැම කොටසක් ම මගේ ජනතාවට පූජනීය වෙයි. සැම දිලිසෙන ෆයින් හුලක් ම, වැලි පිරුණු සැම වෙරළක් ම, ඝණ කැලෑවල සැම මීදුම් පටලයක් ම සැම එළිමහනක් ම, සැම බමන කෘමියකු ම මගේ ජනතාවගේ මතකයෙහි හා අත්දැකීමෙහි පූජනීයත්වය ලබා සිටිති. තුරු තුළ දිවෙන ඕජසෙහි රතු මිනිසාගේ මතක සටහන් මුසු වී ඇත.

අහසේ තාරකා අතර ගමන් කරන සුදු මිනිසාගේ මළවුන්ට ඔවුන්ගේ මවු බිම අමතක වෙයි. අපගේ මළගියහු නම් කිසිදාක මේ මිහිමඬල අමතක නොකරත්, මිහිකත රතු මිනිසාගේ මෑණියන් වන බැවිනි. අපි මිහිකත හා බැඳී සිටින්නෝ වෙමු. එසේම මිහිකත අප හා බැඳී සිටින්නී වෙයි. සුවඳ විහිදෙන මල් අපගේ සොහොයුරියෝ වෙත්. මුවා, අශ්වයා, මහා රාජාලියා මොවුහු අපගේ සොහොයුරෝ වෙති. ගිරි ශිඛර, තණ බිම්වල තෙතමනය, අස් පැටවන්ගේ සිරුරෙන් නික්මෙන උණුසුම, මිනිසා යන මේ සියල්ල එක ම පවුලකි.

ඉදින් වොෂිංටනයේ සිටින මහතැන අපගේ ඉඩම් මිලයට ගන්නට අදහස් කරන බව දක්වමින් කරන ඉල්ලීම බරපතල ඉල්ලීමකි. අපට කැමති අයුරෙක සුවපහසු ඇතිව විසීමට තැනක් වෙන්කර දෙන බව ද මහතැනගේ පණිවුඩයේ දැක්වෙයි. ඔහු අපගේ පියා වෙයි; අපි ඔහුගේ දරුවෝ වෙමු. ඉදින් අපගේ ඉඩම් මිල දී ගැනීමට ඔබ කරන යෝජනාව අපි සලකා බලන්නෙමු. එහෙත් එය එතරම් පහසු නැත. අපට මේ ඉඩම් පූජනීය වන බැවිනි.

ගඟුලැලිවල හා ගංගාවල ගලා යන දිලෙන දිය දහර හුදෙක් ජලය ම නො ව අප මුතුන්මිත්තන්ගේ රුධිරය යි. අප ඔබට ඉඩම් විකුණුව ද තව දුරටත් ඒ ඉඩම් පූජනීය වන බව මතක තබා ගන්න. එම ඉඩම් පූජනීය වන බව ඔබගේ දරුවන්ටත් වටහා දෙන්න. විල්වල පෑදි දියෙහි අවතාර මෙන් දිස් වන එක් එක් සෙවනැල්ලෙහි පිළිබිඹු වන්නේ මගේ ජනතාවගේ ජීවිතය හා බැඳී පවත්නා සිද්ධීන් හා මතක සටහන් ය. දියෙන් නික්මෙන සිහින් හඬ මගේ පියාගෙත් පියාගේ කටහඬ යි. ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙත්. ඔවූහු අපගේ පිපාසය සංසිඳුවා ලත්. ගංගාවෝ අපගේ ඔරු ගෙන යත්; අප දරුවන් පෝෂණය කරත්. අපගේ ඉඩම් ඔබට විකුණුවහොත් ගංගාවන් අපගේ මෙන්ම ඔබගේ ද සොහොයුරන් වන බව මතක තබා ගන්න. ඔබගේ දරුවන්ටත් එය වටහා දෙන්න. එතැන් සිට ඔබගේ සොහොයුරෙකුට දක්වන කරුණාව ම ගංගාවටත් දක්වන්න.

පෙරමුණෙහි එන සුදු මිනිසා හමුවෙහි රතු මිනිසා උදා රිවි කිරණ අබියස පලායන මීදුම් පටලයක් සේ නිරතුරුව ම පසුබැස්සේය. එහෙත් අප මුතුන්මිත්තන්ගේ භස්මාවශේෂ පූජනීය යි. ඔවුන්ගේ සොහොන් බිම පූජා භූමියකි. එසේ ම මේ කඳුවැටි, මේ ගස්, පොළෝ තලයෙහි මේ කොටස අප හමුවෙහි පූජාර්හ වී ඇත්තේය. අපගේ චර්යා ධර්ම සුදු මිනිසාට නොතේරෙන බව අපි දනිමු. ඔහුට ඉඩමක මේ කොටසත් ඊළඟ කොටසත් අතර වෙනසක් නැත. කවරහෙයින්ද යත්, ඔහු රාත්‍රි කාලයෙහි ම පැමිණ ඉඩමෙන් ඔහුට අවශ්‍ය වන දේ ලබා ගන්නා ආගන්තුකයකු වන බැවිනි.

මිහිමඬල ඔහුගේ සොහොයුරා නො ව හතුරා ය. එය ජය ගත් සැනෙකින් ඔහු ඉදිරියට යයි. සිය මුතුන්මිත්තන්ගේ සොහොන් හැරපියා යයි. ඒ ගැන තැකීමක් ඔහුට නැත. හේ පොළෝ තලය සිය දූ දරුවන්ගෙන් පැහැර ගනී. ඔහුට එය සුළු දෙයකි. ඔහු සිය මුතුන්මිත්තන්ගේ සොහොන් මෙන් ම සිය දූ දරුවන්ගේ ජන්ම උරුමය ද අමතක කරයි. සිය මෑණියන් වන මිහිකතට හා සිය සොහොයුරා වන අහස් කුසට ඔහු සලකන්නේ මිලට ගත හැකි, කොල්ලකෑ හැකි, බැටළුවන් හා දිළෙන පබළු මෙන් විකිණිය හැකි දෑ ලෙසිනි. ඔහුගේ කෑදරකම පොළෝ තලය ගිල ගනී. ඉතිරි වන්නේ කාන්තාරයක් පමණකි.

මම නොදනිමි, අපගේ චර්යාධර්ම ඔබගේ චර්යාධර්මවලින් වෙනස් ය. ඔබගේ නගර දැකීම පවා රතු මිනිසාගේ ඇසට වේදනාවකි. එසේ වන්නේ රතු මිනිසා ම්ලේච්ඡයකු වන නිසා විය හැකිය; ඔහුට නොතේරෙන නිසා විය හැකිය. සුදු මිනිසාගේ නගරවල නිශ්කලංක තැනක් නැත. වසන්ත සමයේ පිබිදෙන ගහකොළින් හෝ සතුන්ගේ අත්තටුවලින් හෝ නැගෙන සිහින් හඬ කන වැකෙන්නට එහි තැනක් නැත. ඇතැම් විට මා ම්ලේච්ඡයකු වන බැවින් මට මෙය නොතේරෙනවා විය හැකිය. ඒ හඬ ඔහුගේ කනට නිග්‍රහයකි. රාත්‍රි කාලයේ විලක් වටේ සිටගත් මැඩියන් නගන තර්ක විතර්ක හා පළගැටියාගේ හුදෙකලා හඬ කනට නොවැටේ නම් මිනිස් ජිවිතයට එය අඩුවක් නො වෙයි ද? මම රතු මිනිහෙක්මි. මට නම් නොතේරෙයි. විලක ජලතලාව සිසාරා හමා යන පවනෙහි සිහින් හඬ රතු ඉන්දියානුවා වඩාත් ප්‍රිය කරයි. මද්දහනේ ඇදහැලෙන වැස්සකින් පිරිසිඳු වූ ෆයින් ගසින් සුවදවත් වූ පවන ම ඔහුට ප්‍රිය මනාප ය.

රතු මිනිසාට වාතය ඉතා අගනේය. කවරහෙයින්ද යත් සකල ජීව වර්ගයා ම ආශ්වාස ප්‍රාශ්වාස කරන්නේ එකම වාතය වන බැවිනි. සිවුපාවා, ගස, මිනිසා යන මේ සියල්ල ආශ්වාස ප්‍රාශ්වාස කරන වාතය ගැන හැඟීමක් ඔහුට නැත. දින කිහිපයක සිට පණ අදින මිනිසකුට මෙන් ඔහුට ද ගඳක් නොදැනෙයි. අපගේ ඉඩම් ඔබට විකුණුව ද වාතය අපට ඉතා අගනා බව ඔබ මතක තබා ගත යුතුයි. වාතයේ ආධ්‍යාත්මය, වාතයේ ආධාරය ලබා සිටින සකල ජීව සංහතිය හා බැඳී පවත්නා බැවිනි.

අපගේ මුත්තනුවන්ට ජීවය පිඹි මුල් හුස්ම වාතයෙන් නික්මුනා සේ ඔහුගේ අවසාන හුස්ම ද වාතය හා මුසු වෙයි. අපගේ දරුවන්ට ජීවය දියයුත්තෙත් වාතය ම යි. ඉතින් අපගේ ඉඩම් ඔබට විකුණුවහොත් තෝතැන්නෙහි මලින් සුවඳවත් වූ පවනෙහි පහස සුදු මිනිසාටත් ලැබිය හැකි තැනක් වශයෙන් ඒවා ගෞරව සම්ප්‍රයුක්තව වෙන්කොට තබන්න. ඉදින් අපගේ ඉඩම් මිළයට ගැනීමට ඔබ කරන යෝජනාව සලකා බලන්නෙමු. අප එය පිළිගන්නේ නම් එක කොන්දේසියක් දක්වමු. මේ ඉඩම්වල සිටින සිවුපා සතුන්ට සුදු මිනිසා සිය සොහොයුරන්ට මෙන් සැලකිය යුතුය.

මම ම්ලේච්ඡයෙක් වෙමි. අන් මඟක් මට නම් නොතේරෙයි. ධාවනය වන දුම්රියක සිට වෙඩි තබා මරනු ලැබ ප්‍රේරි තණබිම්වල කුණු වී යමින් තිබුණු මීමුන් දහසකගේ මළකඳන් මා දැක ඇත. දුම් දමදමා දිවෙන අයෝමය අශ්වයා අප පණ රැකෙනු සඳහා මරා දමන මීමාට වඩා වැදගත් වන්නේ කෙසේදැ යි මට නම් නොතේරේ. මම ම්ලේච්ඡයෙක්මි. ඔබ දරුවන්ගේ පයට පෑගෙන්නේ අපගේ මුතුන්මිත්තන්ගේ භස්මාවශේෂ බව ඔබගේ දරුවන්ට වටහා දෙන්න. එවිට ඔවුන් භූමියට ගරු කරනු ඇත. අප ඥාතින්ගේ ජිවිතවලින් මේ භූමිය සරුසාර වී ඇති බව ඔබගේ දරුවන්ට කියා දෙන්න. මිහිකත අපගේ මෑණියන් වන බව අපගේ දරුවන්ට අප වටහා දුන් පරිදි ම ඔබත් ඔබගේ දරුවන්ට වටහා දෙන්න. පෘථිවියට අත්වන්නේ යම් ඉරණමක් ද එය ම පෘථිවියේ දරුවන්ට ද අත්වනු ඇත. මිනිසුන් භූමිය මත කෙළ ගසන විට ඔවුහු තමන් මතම කෙළ ගසා ගනිත්.

අපි මේ දෙය දනිමු. මිනිසා පෘථිවියේ අයිතිකරු නො වෙයි. එහෙත් මිනිසා පෘථිවියට අයත් වෙයි. මෙය අපි දැන සිටිමු. පවුලක් එකමුතු කරන රුධිරය මෙන් සියලු දෙය ම එකිනෙකට බැඳී පවතී. පෘථිවියට සිදු වන්නේ යමක් ද පෘථිවියේ දරුවන්ට සිදු වන්නේත් එය ම ය. ජීවිතය නමැති දුහුල මිනිසා විසින් වියන ලද්දක් නො වෙයි. මිනිසා එහි නූල් පටක් පමණකි. හෙතෙම දුහුලට යමක් කරයි ද එය තමා විසින් තමාට ම කරගන්නා දෙයකි. මගේ

මිනිසුන් සඳහා මා වෙන් කර දෙන්නට යන ප්‍රදේශයට යන ලෙස ඔබ කරන යෝජනාව කෙසේ හෝ සළකා බලන්නෙමු. ඔබගෙන් වෙන් වී අපි එහි සාමයෙන් වෙසෙමු. අපගේ ජීවිතවල ඉතිරි කොටස කොතැන ගෙවී ගියත් අපට කමෙක් නැත. සිය පියවරුන් පරාජිතව නිග්‍රහයට ලක් වූ සැටි අපගේ දරුවෝ සියැසින් දුටහ.

තව පැය කිහිපයකි, ශිත සෘතු කිහිපයකි. වරෙක ඔබ තරම් ම බලසම්පන්නව බලාපොරොත්තු සහගතව සිටි ජනතාවකගේ සොහොන් අබියස ශෝකය පළ කිරීමට මේ පෘථිවි තලයෙහි වාසය කළ, එහෙත් දැන් දැන් කුඩා කණ්ඩායම් වශයෙන් වනයෙහි සැරිසරන ශ්‍රේෂ්ඨ ගෝත්‍රවලට අයත් දරුවන් කිසිවකුත් මින් පසු ව නොසිටිනු ඇත. මගේ ජනතාව විනාශ වී යාම ගැන මා කුමකට කම්පා විය යුතුද? ගෝත්‍ර වූකලී මිනිසුන්ගෙන් සැදුම් ලද්දේ වෙයි. එපමණකි. මහා සයුරේ රළ පතර ඇති වී නැති වී යන්නාක් මෙන් මිනිසා ද ඇති වී නැති වී යයි. තමා සමග මිතුරකු මෙන් කතාබස් කරන, ගමන් කරන, දෙවියන් කැටුව සිටින සුදු මිනිසාට පවා එම පොදු ඉරණමෙන් නිදහස් විය නොහැකිය.

කෙසේ වුවත් අපි සොහොයුරෝ වෙමු. අප දැන සිටින එක දෙයක් කිසියම් දාක සුදු මිනිසාට අවබෝධ වෙනවා ඇත. අපගේ දෙවියන් වහන්සේත් ඔහුගේ දෙවියන් වහන්සේ ම ය. අපගේ ඉඩම් අයිති කර ගන්නට කැමැත්තා සේ ම දෙවියන් වහන්සේ ද අයිති කර ගැනීමට ඔබට සිතෙනු ඇත. එය ඔබට කළ නොහැකිය. ඒ දෙවියන් වහන්සේ මිනිසාගේ දෙවියන් වහන්සේ ය. උන්වහන්සේ රතු මිනිසාටත් සුදු මිනිසාටත් දක්වන්නේ එක හා සමාන දයානුකම්පාවකි. මේ පෘථිවිය දෙවියන් වහන්සේට ඉතා අගනේ ය. පෘථිවියට හානි පැමිණ වීම නිර්මාපකයන් වහන්සේට අවඥා කිරීමකි. ඇතැම් විට සුදු මිනිසුන් ද අන්‍ය ගෝත්‍රයන්ටත් වඩා ඉක්මනින් තුරන් ව යනු ඇත. ඔබගේ යහන දිගින් දිගටම දූෂණය කරගෙන ගිය තැන එක් රැයෙක ඔබගේ ම කැලි කසල මැද ඔබගේ හුස්ම හිරවෙනු ඇත.

එහෙත් ඔබ මේ රටට ගෙනැවිත් කිසියම් විශේෂ හේතුවක් නිසා මේ රටත් රතු මිනිසාත් ඔබගේ ආධිපත්‍යයට නතු කොට තැබූ දෙවියන් වහන්සේගේ දේව ශක්තියෙන් ජනිත වන ගින්නෙන් ම ඔබ විනාශයට පත් වන මොහොතෙහි ඉතා දිප්තිමත් ව බබලනු ඇත. ඒ ඉරණම අපට නම් තේරුම් ගත නොහැකි අභිරහසකි. මී හරකුන් සියල්ල අමු-අමුවේ මරා දැමීම, වල් අසුන් හීලෑ කිරීම, වනාන්තරයේ රහස් තැන් මිනිස් දුගඳින් බර වීම, කතා කරන කම්බිවලින් අශෝභන වූ කඳු මුදුන් යන මේවා අපට නම් තේරුම් ගත නොහැකිය. වන පෙත කොහිද? විනාශයි! සීඝ්‍ර ධාවනීය අස් පැටවාට හා උගේ ඉසව්වට කෙසේ නම් ආයුබෝවන් කියන්නටද? ජීවත් වීම එතැනින් කෙළවර වෙයි; පණ කෙන්ද රැක ගැනීමේ අරගලය ඇරඹෙයි.

ඉදින් අපගේ ඉඩම් මිළයට ගැනීමට ඔබ කරන යෝජනාව සළකා බලන්නෙමු. අප කැමති වෙතොත් එසේ කැමති වන්නේ අප වෙනුවෙන් වෙන් කරන භූමි ප්‍රදේශය ලබා ගැනීම සඳහා ය. එහි ඇතැම් විට අපගේ අන්තිම දවස් රිසි සේ ගත කිරීමට හැකි වෙතැයි සිතමු. අන්තිම රතු මිනිසාත් මේ පොළෝ තළයෙන් අතුරුදහන් වී ඔහු පිළිබඳ මතකය ප්‍රේරී තණබිම්වලින් ඉහළ නුබ කුස ගමන් ගන්නා වලාකුළක ජායාවට සීමා වූ කල්හිත් මගේ ජනතාගේ අවතාර මේ වනාන්තරවල හා වෙරළවල සැරිසරනු ඇත. මෙළොව එළිය දුටු නව බිළඳකු මවගේ හෘදය ස්පන්දනයට ප්‍රිය කරන්නාක් මෙන් ඔවුන් මේ පෘථිවියට ප්‍රේම කරන බැවිනි. මේ භූමිය අප ඔබට විකුණුවහොත් අප ඊට ප්‍රේම කළ පරිද්දෙන් ම ඔබ ද එයට ප්‍රේම කරන්න. අප එය රැකගත් අයුරින් ම රැක ගන්න. ඔබ ඉඩම භාර ගන්නා විට එය පැවති තත්ත්වය සිතෙහි ධාරණය කර ගන්න. ඔබ සතු සියලු ශක්තිය ම, සකල මනස ම, මුළු හෘදය ම යොදා ඔබගේ දරුවන් සඳහා මේ පෘථිවිය රැක ගන්න. දෙවියන් වහන්සේ අප සියල්ලන්ට ප්‍රේම කරන්නේ යම් සේ ද ඔබ ද පෘථිවියට එසේ ම ප්‍රේම කරන්න.

අපි එක දෙයක් දනිමු. අපගේ දෙවියන් වහන්සේත් ඔබගේ දෙවියන් වහන්සේ ම ය. මේ පෘථිවිය දෙවියන් වහන්සේට ඉතා අගනේය. පොදු ඉරණමෙන් සුදු මිනිසාට වත් නිදහස් විය නොහැකිය. අන්තිම වශයෙන් බලන විට අපි සොහොයුරෝ නො වෙමු ද?''

# 2000 වසරේ ක්‍රිස්තු ජයන්තිය හා ශුද්ධ වූ ත්‍රිත්වය තුළ තෙ වසරක සූදානම

දෙවි පියාණන් වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව සඳහා ක්‍රිස්තුස් වහන්සේ තුළ මානව සංහතිය ඒකරාශි කරමින් දේව ප්‍රශංසාව ගැයීම 2000 ජුබිලි වසරේ ක්‍රිස්තු ජයන්තියේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙය කළ යුත්තේ දෙ මඟකිනි. එනම් ඇතුලාන්ත නවතාවයක් උදා කිරීම හෙවත් විශුද්ධි මගින් ද ව්‍යුහාත්මක සමානතාවයක් උදා කිරීම හෙවත් විමුක්ති මගින් ද වේ. ජුබිලි වසර තුළ මානව සංහතිය දෙවිඳුන්ට පුදන තුති ප්‍රශංසාව නිමක් නැත. ධර්මයාණන් ජේසුස් නමින් මනු බව ගැනීමේ අරුත වූයේ "**සිය කැමැත්තෙන් නියම කරගත් ස්වකීය අභිප්‍රාය අනුව නියමිත කාලයේ දී ස්වර්ගයෙහි ද පොළොවෙහි ද එනම් මුළු විශ්වයෙහි ඇති සියල්ල ක්‍රිස්තුස් වහන්සේ තුළ එක් සේසත් කිරීම ය." (එපිස 1:9,10)**

ජුදා සම්ප්‍රධාය අනුව 7 පූර්ණත්වයේ සංකේතය යි. 7 ඒවා 7 හෙවත් 50 වන වසර පරිපූර්ණත්වයේ වසර යි. එනිසා එය ජුබිලි වසර යි. හෙවත් ස්වාමින් වහන්සේගේ වරප්‍රසාද ලත් වසර යි. බැටළු අංවලින් සාදන ලද හොරණෑවකින් (ජුබෙල්) ජුබිලි වසර ප්‍රකාශයට පත් කෙරේ. 'ජුබෙල්' යන හිබෲ වචනයෙන් 'ජුබිලිය' සෑදී ඇත.

2000 ක්‍රිස්තු ජයන්ති වසර අතීතයේ වැඩියා වූ දැන් වැඩසිටින්නා වූ මතු වඩින්නා වූ තැනැන් වහන්සේ හමුවීමට ද එතුමන් අබියස 'මහා ආමෙන්' කියන්නට ද සියල්ලන් සූදානම් ව සිටිය යුතු වසර යි. එම වසර ත්‍රිත්වය වන එක ම දෙවිඳුන්ට මහිමය සඳහා කැපකර තිබේ. "ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ද, සමග ද, ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ ද දෙවි පියාණන් වහන්සේ වෙතට" වසරේ තේමාව යි. එය 'මහා ආමෙන්' සඳහා කැපකර තිබෙන වසර යි. 'ආමෙන්' යන හිබෲ වචනයේ අරුත වන්නේ 'එසේම වේවා', 'දෙවිඳුනි, ඔබගේ කැමැත්ත ලෙස සියල්ල සිදු වේවා' යන්නයි. (වචනයක් උච්චාරණය කිරීමේ දී කට, තොල, දිව යන තුන් අවයවයන් ක්‍රියාකාරී වේ. 'ආමෙන්' යන වචනය උච්චාරණය කිරීමේ දී කට ඇර 'ආ' කියා දෙ තොලින් 'මෙ' කියා දිවෙන් 'න්' යයි උච්චාරණය කළ පසු වෙනත් වචනයක හඬක් නිකුත් නොකරයි.)

**2000 වසරේ ක්‍රිස්තු ජයන්තිය සඳහා සභා මාතාව ඉදිරිපත් කළ පසුගිය තෙ වසරක සූදානම දෙස ආපසු හැරී බලන්නට මෙය සුදුසු මොහොතකි.**



ජයන්ති වසරට පෙර තෙ වසරක සූදානමකි. තුන් වසරේ සූදානමේ තේමාව ත්‍රිත්වීක කමතේ ක්‍රිස්තු කේන්ද්‍රය යි. ගලන ගඟ මහ සයුරට මුසු වීමට පෙර දෙගොඩ තලා ගෙනා සරු පස තැන්පත් කරන්නේ ග්‍රීක $\Delta$ අක්ෂරයේ හැඩයට ය. කෙතේ සරුසාර අස්වැන්න ගොනුකරන්නේ කමතේ ය. (තුන් වසර සූදානම, තේමාව: ත්‍රිත්වික කමත Delta, එහි අරුත: මුව දොර සරු බිම) ශුද්ධ වු ත්‍රිත්වය ධර්මයේ පරිපූර්ණත්වයේ, සෞභාග්‍යයේ, සාමයේ, පිළිවෙල හා සුන්දරත්වයේ, සියලු යහපතේ උල්පත යි.

සභාවේ නව වසර ඇරඹෙන්නේ ආගමන සමයේ පළමු වන ඉරිදාවෙනි. (එය සාමාන්‍යයෙන් නොවැම්බර් අග සතියේ හෝ දෙසැම්බර් මුල සතියේ යෙදේ) ඒ අනුව තෙ වසරක සූදානම 1996-1997 ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට ද, 1997-1998 ශුද්ධාත්මයාණන් වහන්සේට ද, 1998-1999 පියාණන් වහන්සේට ද, කැපකර තිබේ. 1999-2000 ජන වන්දනා වසර, ජුබිලි වසර 'ත්‍රිත්වය වන එක ම දෙවිඳුන්ට මහිමය' සඳහා කැප කර තිබේ.

තුන් වසරේ සූදානම අනුව ක්‍රිස්තුස් යන නාමයේ ග්‍රීක මුල් අකුරු දෙක ද, ග්‍රීක හෝඩියේ මුල අකුර ද අග අකුර ද (අල්ෆා, ඔමෙගා) මගින් ක්‍රිස්තුස් වහන්සේගේ ස්වාමිත්වය සංකේතවත් කරයි. සුදු පරවියා ශුද්ධාත්මයාණන් සංකේතවත් කරයි. දිව්‍ය හස්තය දෙවි පියාණන්ගේ අත-හිත දෙන දේව සංරක්ෂණයේ සංකේතය යි. (දෙවි පියාණන්ගේ හස්තය කුරුසියේ පසුබිම තුළින් දිගු කිරීම අතිශයින් වැදගත් ය. පාපය නිසා දෙවි පියාණන් හා මිනිසා අතර මැද බිත්තියක් මෙන් වෙන් වීමක් සිදු වූ බවත් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසියේ දිවි පිදුම මගින් ඒ මැද බිත්තිය බිඳ දැමූ බවත් ජේසු සමිඳුන් (ධර්මයාණන්) තම ගැළවුම්කරු හැටියට පිළිගන්නා සියල්ලන් වැළඳ ගන්නට දෙවි පියාණන්ට හැකි වූ බවත් එයින් ප්‍රකාශ වේ. **ශුද්ධ බයිබලය - එපිස 2: 14,15)**

නත්තල හා පාස්කු ජයග්‍රහණය ගැළවීමේ සැලැස්ම සංකේන්ද්‍රිය කරයි. ගවලෙනේ උපත ලැබූ බිළිඳා අප වෙනුවෙන් ම පූජා වන බැටළු පෝතකයා ය. පාස්කු බැටළුවා ජයග්‍රාහි ලීලාවෙන් තම ධජයේ මත්ස්‍ය සංකේත මගින් "ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය, ගැළවුම්කාරයාණෝ ය." යන ගෞරව නාමයෙන් තම ස්වාමිත්වය ප්‍රකාශ කරයි. ගවලෙන දේවධාරී මරිය තුමිය සංකේතවත් කරයි. (එදා සෙසරයාපිලිප්පි නගරයේ දී ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින්ගෙන් "**නුඹලා මා කවරකු කියා පවසන්නහු ද?**" යනුවෙන් විමසූහ. එවිට පේදුරු තුමා "**ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය, ඔබ ගැළවුම්කාරයාණෝ ය.**" යනුවෙන් පැවසීය. 'ඔබට මා කවරෙක්දැ'යි ජේසු සමිඳාණෝ අප එකිනෙකාගෙන් ද විමසති. පේදුරු තුමා දුන් පිළිතුර අප එකිනෙකා විසින් ද දෙන්නට හැකි නම් අගනේය.) එම ප්‍රකාශනය යි, මත්ස්‍ය ලාංජනයේ සටහන් කර ඇත්තේ. (ඉයෙසුස්, ක්‍රිස්තෝස්, තෙයු, හුයියොස්, සෝතෙර්) මෙම ග්‍රීක් වචන පහේ අරුත-ජේසුස් ක්‍රිස්තුස් දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය. ගැළවුම්කාරයාණෝ ය. එම ග්‍රීක් වචන පහේ මුල් අකුරේ, ශබ්දය (ඉ ක් ත් හු ස්) එය යි, මත්ස්‍ය ලාංජනයේ ග්‍රීක් අකුරින් සටහන් කර ඇත්තේ.

දේව පුත්‍රයාණන් මනු බව ගැනීම දෙවියන් වහන්සේ මිනිසා සොයා යෑම පිළිබඳ සාක්ෂිය වේ. දේව පුත්‍රයාණෝ අයාලේ ගොස් නැති වූ බැටළුවා සොයා යහ මඟට පමුණු වන සේක. දෙවි මිනිස් සබඳතාවය ආගම වන්නේය. දෙවියන් වහන්සේ අප අතර වැඩසිටීම 'එම්මානුවෙල්' වන්නේ ය. මිනිසා දෙවියන් වහන්සේගේ හදවිමනේ විහරණය දේව රාජ්‍යයේ උදාව වන්නේ ය. නත්තල කේන්ද්‍ර කරගත් සූර්ය වසර ද පාස්කුව කේන්ද්‍ර කරගත් චන්ද්‍ර වසර ද ජන වන්දනා චක්‍රයේ පිළිබිඹු වේ. (2000 ක්‍රිස්තු ජයන්තිය හා තෙ වසරක සූදානම ගැන ලිවීමේ දී ආචාර්ය සික්ස්ටස් කුරුකුලසූරිය පියතුමාගේ "උදාවන තුන් දාහේ යුගය" තුළින් උපුටා ගැනීම් කළෙමු. මෙහි පලවන රූප සටහන ද එයින් උපුටාගනු ලැබුවකි. )

# දිව්‍ය සත්ප්‍රසාදය

දිව්‍ය සත්ප්‍රසාදය හෙවත් දෙවියන් වහන්සේ මිනිසාගේ ආහාරය වීම තුළින් මිනිසා සමග ඒකත්වයක් වීම දෙවියන් වහන්සේ මිනිස් වර්ගයා කෙරෙහි දැක් වූ අපරිමිත ප්‍රේමයේ මුදුන යි. ඒ පිළිබඳව නිසි අවබෝධයක් ලබන්නට නම් අපි ඊට පසුබිම් වන කරුණු කිපයක් පළමුවෙන් අවබෝධ කරගත යුතු වෙමු.

01. දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයා වේදනා විඳිය යුත්තේ ඇයි?
02. විවිධ කිතුනු නිකායන්.
03. භාග්‍ය අට ක්‍රිස්තු වටිනාකම්වල හරය යි.
04. මුදුන දක්වා දේව ප්‍රේමයේ ගමන් මඟ.

## දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයා වේදනා විඳිය යුත්තේ ඇයි?

මුළු විශ්වයේ මැවුම්කරුවාණන් වන සැබෑ වූ එක ම දෙවියන් වහන්සේ (ධර්මයාණෝ) මෙසේ පවසති. **"මාගේ යෝජනා නුඹලාගේ යෝජනා මෙන් නො වේ. නුඹලාගේ මාර්ග මාගේ මාර්ග නො වේ. අහස පොළොවට වඩා උස් ව තිබෙන්නාක් මෙන් මාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් මාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උසස් ව තිබේ."** (**ශුද්ධ බයිබලය යෙසායා 55:8,9**) මිනිසා විසින් සාදා ගත් දෙවි දේවතාවන් පිළිබඳ සංකල්ප තුළින් දේවත්වයේ සත්‍යය වූ ස්වරූපය කෙළෙසී තිබීම ද මැවුම්කරුවාණන් වන එක ම දෙවියන් වහන්සේ පිළිබඳව එතුමන්ගේ අති විශිෂ්ඨ යෝජනා හා මාර්ග පිළිබඳව මනුෂ්‍ය වර්ගයා තවමත් බොහෝ දුරට නොදැනුවත්ව සිටීම ද හෙවත් දේවත්වය පිළිබඳ මිථ්‍යාවන් පැතිරී සත්‍යය වැසී තිබීම ද මනුෂ්‍ය වර්ගයාගේ පිරිහීම සඳහා ම හේතු වී ඇත.

අපගේ දෙවන ප්‍රකාශනයේ දි මහෝත්තමයාණන්ගේ යෝජනා හා මාර්ග කිපයක් පිළිබඳව සවිස්තරාත්මක ව සාකච්ඡා කළෙමු. කෙනකුට අයහපතක් පතා යාච්ඤා කරන්නට, ඔබට සතුරුකම් කරන්නෙකුට පවා විපතක් පතා යාච්ඤා කරන්නට මිනිස් බව ගත් ජේසු සමිඳුන්ගේ ඉගැන්වීම් අනුව කිසිවකුට අවසර නැත. එවැනි යැදුමක් මහෝත්තමයාණන් කරා නොනගින බව ශුද්ධ බයිබලය පැහැදිළිව ප්‍රකාශ කරයි. එතුමාණන් පෙන්වා දුන් ධර්ම මාර්ගයේ පවතින්නෝ දෙවිඳුන්ට නිසි පැසසුම හා නැමඳුම දක්වති. කෙනකුගේ ජීවිතය ක්‍රියාවෙන් කරන ප්‍රශංසාවක් නො වේ නම්, වචනයෙන් කරන ප්‍රශංසාවක් පමණක් එතුමන්ට ඇවැසි නො වන බව ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. **"ස්වර්ගයේ වැඩසිටින මගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටුකරන අය මිස මට ස්වාමිනි ස්වාමිනි කියන සියල්ලෝ ම ස්වර්ග රාජ්‍යයට ඇතුළු නො වන්නෝය." (මතෙව් 7:21) "නුඹලාගේ ගීතිකා ඝෝෂාව නතර කරන්න. නුඹලාගේ වීණා නාදයට මම සවන් නොදෙමි. යුක්තිය ගලාබහින දිය දහරක් මෙන් ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන් ද පැවතිය යුතුයි." (ශුද්ධ බයිබලය - ආමොස් 5: 23, 24)** විශ්වයේ මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ විවිධත්වය තුළ ඒකත්වය පතන ඒ සඳහා සියල්ල නිර්මිත කළ දෙවියන් වහන්සේ ය.

දෙවිඳුන් අදහන ජනතාවට ලෞකික වශයෙන් ඇවැසි සියල්ල යහමින් සපයා දෙමින් ඔවුන් සුඛිත මුදිතව තබනු ඇතැයි ද මරණින් පසු යහපත් සදාතනික ජීවිතයක් උදාකරනු ඇතැයි ද බොහෝ දෙනා සිතති. බයිබලීය දැක්ම අනුව බලන විට දෙවිඳුන් අදහන ජනතාවට එතුමෝ සදාතන ජීවිතය පොරොන්දු වෙති. **"පළමුව දෙවි රජය සොයව්. සියල්ල දෙනු ලැබේ."** යැයි ද පවසති. එතුමෝ අවශ්‍යතාවය සඳහා මිස තෘෂ්ණාව සඳහා නොදෙති. දෙවියන් වහන්සේ, එතුමන් අදහන ජනතාව ලෞකික ධනවත්කම තුළින් සුඛිත මුදිත කරන බවට කිසිසේත් පොරොන්දු නො වෙති. දෙවිඳුන්ට අවනත වන එතුමන්ගේ මෙහෙය වීම අනුව ක්‍රියා කරන අයට කටුක ගමනක යෙදෙන්නට සිදු වන බව පවසති. ඒ ඇයි? දෙවිඳුන් සෙවීම යනු සත්‍යය සෙවීම යි. ධර්මය සෙවීම යි; සාධාරණත්වය සෙවීම යි. අප ජීවත්වන්නේ බොරුව, අධර්මය, අසාධාරණය සංස්ථාගත වූ සමාජයකයි. එනිසා ඔබ දෙවිඳුන් සොයන විට එම සමාජය ඔබට විරුද්ධව කැරලි ගැසීම පුදුමයක් නො වේ.

දෙවිඳුන් අපට ප්‍රේම කරන්නේ මුහුකුරාගිය ප්‍රේමයකිනි. එනිසා එතුමන්ට අවනත වෙමින් එතුමන් පෙන්වන මාවතේ ගමන් කරන කිසිවකු එතුමෝ බොළඳ නොකරති. පෞරුෂය පූර්ණව ගොඩනගන්නට හැකි වන්නේ මුහුකුරාගිය ප්‍රේමයට පමණි. කටුක අත්දැකීම්වලට මුහුණ දී එයින් පන්නරය ලබන්නට ඒ ලෙස ඕනෑ ම ජීවිත තත්ත්වයකට මුහුණ දෙන්නට හැකි චරිත එතුමෝ නිර්මාණය කරති. "**මම ඔබ සමග වැඩසිටිමි. මම ඔබට ප්‍රේම කරමි. බිය නො වන්න.**" මෙය දෙවිඳුන් අප සමග බෙදා ගන්නා මූලික පොරොන්දුව යි. මුහුකුරාගිය ප්‍රේමය යනු එතුමන් විසින් ඔබ අත්හැරීනු ලැබීමක් නො වේ. අපහසු කාර්යයක ඔබ තබා එතුමන් ඔබ සමග සිටින බව, එතුමන් ඔබට ප්‍රේම කරන බව බිඳකින් හෝ දැනෙන්ට ඉඩ නොතබන, එහෙත් එතුමන් අතිශයින් සමීපව සිටිමින් ඔබ සුරකින අත්දැකීමකි. දෙවියන් වහන්සේගේ ප්‍රේමය දේව රාජ්‍යය උදෙසා ඕනෑ ම කැපවීමක් කළ හැකි චරිත නිර්මාණය කරනු ඇත.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙසේ වදාල සේක. "**ස්වාමිවරුන් දෙදෙනකුට සේවය කරන්නට කිසිවකුට නුපුළුවන. මන්ද, ඔහු එක් කෙනෙකුට වෛර බැඳ අනික් අයට ප්‍රේම වන්නේය. නැතහොත් එක් කෙනෙකුට ළැදි වී අනෙක් අය හෙළා දකින්නේය. දෙවියන් වහන්සේට හා වස්තුවට සේවය කරන්න ඔබට නොහැකිය.**" (**මතෙව් 6:24**) ජේසු සමිඳාණෝ ස්වාමිවරුන් දෙදෙනෙක් ගැන සඳහන් කළහ. එතුමන් එදා කතා කළ ඇරමයික් බසින් එම ස්වාමිවරුන් දෙදෙනා 'අබ්බා' සහ 'මැමෝනා' ලෙස හැඳින් විය හැකිය. එතුමා ධර්මයේ උල්පත වන දෙව් පියාණන් ඇමතුවේ අබ්බා (තාත්තා) යනුවෙනි. මැමෝනා යනු වස්තුව යි. (ධනය, බලය, ජනප්‍රියත්වය) කිතුනු නාමය දරන බොහෝ දෙනා අද ද අබ්බා තුළින් මැමෝනා ලබා ගැනීමේ නිෂ්පල උත්සාහයක යෙදී සිටිති. "**මන්ද, ඔබගේ වස්තුව කොතනද ඔබේ සිතත් එතැන ය,**" යි ජේසු සමිඳාණෝ පැවසූහ. (**ලූක් 12:34**) දෙවියන් වහන්සේ හා වස්තුව අතර ඇති සදාතන ගැටුම ගැන ද දෙවියන් වහන්සේ හා දිළින්දා අතර ඇති සදාතන ගිවිසුම ගැන ද ශුද්ධ බයිබලය සාක්ෂි දරයි.

දෙවිඳුන් සොයන අයට ලෞකික සියල්ල ධනය, බලය ආදිය යහමින් ලැබේ නම්, හිතන පතන සියල්ල එලෙස ම ඉටු වේ නම් සියල්ලන් දෙවිඳුන් සොයනු ඇත. එවිට එය සැබවින් ම දෙවිඳුන් සෙවීමක් නො ව ලෞකිකත්වය ම සෙවීමකි. එනිසා සමිඳාණෝ එයට කිසිසේත් ඉඩ නොතබති. දෙවිඳුන් සොයා යන වන්දනා ගමනේ දී ඔබ සතු සියල්ල අහිමි වුව ද දෙවිඳුන් සොයා යන්නේ නම් එය ආධ්‍යාත්මිකත්වය ම සොයා යන වන්දනා ගමනකි. දෙවියන් වහන්සේට අවනත වෙමින් එතුමන් ඔබ ගෙන යන ගමන කෙලවර දක්වා ඔබ ගමන් කරන්නෙහි නම් ඔබට ද මෙ ලෙස කියන්නට සිදු වනු ඇත. "**අත්තික්කා ගස දළු නොලෑවත්, මිදි වැල්වල පලදාව නොතිබුණත්, ඔලිව ගසේ පල හට නොගත්තත්, කෙත්වලින් අස්වැන්න නොලැබුණත්, ගාලෙන් එළු බැටළු රැළ සිඳ දමනු ලැබුවත්, පට්ටිවල ගවයින් නැතිව ගියත් සමිඳුන් කෙරෙහි මම ප්‍රීති වන්නෙමි. දෙව් සමිඳාණෝ මාගේ ශක්තිය වෙති.**" (**ශුද්ධ බයිබලය- හබක්කුක්** 3: 17-19)

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගැළවීම අත්දකිමින් එතුමන් ඔබේ ගැළවුම්කරුවාණන්, එඬේරාණන් ලෙස පිළිගනිමින් ඔබ යෙදෙන ආධ්‍යාත්මික වන්දනා ගමනේ මුල් පියවරේ දී සමිඳුන් ඔබට ඉතා සමීප ව වැඩසිටින බව, එතුමන් ඔබට ප්‍රේම කරන බව අත්දකින්නට සලස් වනු ඇත. එනිසා ඔබ ද එතුමන් ගැන මහත් සේ උනන්දු වනු ඇත. ඉන් පසු එළඹෙන්නේ ලැබෙන දොරකවුළු සියල්ල එතුමන් විසින් ම වසා දමා "මගෙන් ඔබට ලැබෙන දේ නො ව මා දෙවියන් නිසා මා සොයන්න." පියවර යි. බොහෝ දෙනා දෙවිඳුන් ගැන අධෛර්යය වී පසුබසිති. ඔබ ඒ පියවර ඔස්සේ ද ගමන් කළොත්, "මමයි ඔබගේ එක ම වස්තුව, එනිසා ඔබ සතු සියල්ල නැති වී ගියත් මා පමණක් සොයන්න" පියවර එළඹේ. කලාතුරකින් කෙනෙක් පමණ යි, ඒ පියවර කෙළවර දක්වා යන්නට එඩිතර වන්නේ.

දෙවියන් වහන්සේ ශුද්ධ වූ ප්‍රේමය යි. ශුද්ධ භාවය යනු ඇරමයික් බසින් "කාදෝෂ්' ය. එහි අරුත වන්නේ දෙවියන් වහන්සේ අප හිතනවාට වඩා මුළුමනින් වෙනස් බවයි; ඒ වෙනස් භාවය අපගේ ආත්මාර්ථයට භයානක බව යි. දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ ප්‍රේමයට

තමා තුළ ක්‍රියා කරන්නට අග දක්වා ම යමෙක් ඉඩ දෙන්නේ නම් එතුමන් ඔහුට පවිත්‍ර කිරීමේ ගින්නකි. එවිට එතුමන් ඔහු මුළුමනින් යටහත් භාවයට, අවනත භාවයට අඹනු ඇත. එවැන්නකු පමණක් දෙවිඳුන් අත ප්‍රබල මෙවලමක් වන්නට සුදුසු ය. එවැන්නකුගේ ඇතුලාන්ත අත්දැකීම වනුයේ 'දෙවිඳුනි ඔබ මා තුළින් යමක් කරගත්තොත් මිස, මට නම් කිසිවක් කළ නොහැකිය' යන්නයි. එවැන්නෙක් මෙවලමක් කරගෙන දෙවිඳුන් කොපමණ මහත් දේ කරගත්තත් ඔහු දෙවිඳුන්ගේ මහිමය බිඳකින් හෝ සොරා නොගනියි.

මේ සියල්ලෙන් ඔබට කියන්නට උත්සාහ කළේ දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයා කටුක මාවතක ගමන් කළ යුතු බවයි. වේදනාව ඔහුට අයිතිය, එහෙත් කළකිරීම කණස්සල්ල ඔහුට අයිති නැත. "**දෙවියන් වහන්සේ ඔබේ විශ්වාසය ගින්නෙන් සෝදිසි කරන රනට වඩා පරීක්ෂා කරන බව**" ශුද්ධවර පේදුරු තුමා අත්දැකීමෙන් පවසන්නේ එබැවිනි. (**1 පේදුරු** 1:7)_ ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "**පටු දොරටුවෙන් ඇතුළු වන්න. විනාශයට යන දොරටුව විශාල ය, පාරත් පළල ය. එයින් ඇතුළු වන්නෝ ද බොහෝ ය. එහෙත් ජීවනයට යන දොරටුව පටු ය, පාර ද අවහිර ය. එය සොයා ගන්නෝ ස්වල්ප දෙනෙක් පමණකි.**" (**මතෙව් 7:** 13,14) කුරුසියේ මඟ යනු එයයි. එය ඔබගේ අයිතිවාසිකම්වලට, ඔබගේ ආශාවන්ට, ඔබගේ කැමැත්තට මරණයකි. ඒ මඟ කටුක විය යුතු ම ය. දෙවිඳුන් ලෞකික සියල්ලෙන් තමා පුරවා තමන් සුඛිත මුදිත කරනු ඇතැ යි සිතාගෙන එතුමන් සමග ගමනකට මුලපුරා එය එසේ සිදු නොවන විට ගමන නවතා ආපසු හැරී මැවුම්කරුවාණන් නැතැ යි කියන්නට ලියා ඇති පොත් ලොව කොපමණ වේ ද?

සමාජ විමුක්තිය පතා ඔබ සමිඳුන් පාමුල පූජා වෙමින් එතුමන්ගේ සියලු කැඩීම් හා ඇඹිලිම්වලට අග දක්වා ම ඉඩ දීම යි සැබෑ කිතුනු දිවිය. එවිට සමිඳාණෝ ඔබ "රැගෙන, තුති පුදා, කඩා, බෙදා" දෙති. එවිට ඔබ තුළ සිදු වන විශුද්ධි තුළින් සමාජ විමුක්තිය සැළසේ. දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයාට වේදනා විඳින මාවතක පියමන් කරන්නට සිදු වන්නේ එබැවිනි. එහෙත් එය ම යි, පරමානන්දයේ මාවත. එය ම යි, සමාජ විමුක්තියේ මාවත. එය ම යි, ඔබ ජීවිතයෙන් දෙවිඳුන් වෙනුවෙන් ද මිනිස් පවුල උදෙසා ද උපරිමය ඉටු කිරීමේ මාවත.

## විවිධ කිතුනු නිකායන්

"ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් ම ශුද්ධවර පේදුරු තුමාගේ දෘශ්‍යමාන නායකත්වය මත මුල පිරූ උන්වහන්සේගේ පුමුඛ සභාව වන කතෝලික සභාව 4වන සියවසේ දී ඕර්තඩොක්ස් සභාව වශයෙන් බෙදී යාමක් සිදු විය. 16වන සියවස මුල් භාගයේ දී රෙප්‍රමාදු ක්‍රිස්තියානි සභාවන් වශයෙන් බෙදී යාමක් සිදු විය. 19වන සියවස අග භාගයේ දී හා 20වන සියවසේ දී මූලධර්මවාදී කිතුනු නිකායන් රැසක් බිහි විය. සමහර මූලධර්මවාදී කිතුනු නිකායන් විසින් දේව වචනය පිළිබඳව දෙන පෞද්ගලික අර්ථනිරූපන නිසා මහත් වියවුලක් පවතින බව සත්‍යයකි. එහෙත් මෙහි දී අපගේ අරමුණ වනුයේ විවිධ කිතුනු නිකායන්, එහි මූලාරම්භය, එවා පිළිබඳ ගුණ දොස් දැක්වීම නො ව සියළු කිතුනු නිකායන්, පටු බවින් මිදී පුළුල් වීම උදෙසා ද, සියළු කිතුනු නිකායන් ඒකරාශී වීමේ මොහොත උදෙසා ද අදහස් ස්වල්පයක් කෙටියෙන් හෝ බෙදා ගැනීම පමණි.

01. ශුද්ධවර පාවුලු තුමාගේ කාලයේ (පළමුවන සියවස) නිකායන් වශයෙන් බෙදී නොතිබුණත් කිතුනු සංඝය තුළ එවැනි ගැටළු පැවති බව පෙනේ. "**වැඩකට නැති, අසන්නන්ට හානි ගෙන දෙන වචන ගැන විවාද නොකිරීමට දෙවියන් වහන්සේ ඉදිරියේ තරයේ අණ කරන්න....... තේරුමක් නැති හිස් දෙඩවිලිවලින් වැළකී සිටින්න. මන්ද, ඒවා නිසා භක්තිවන්තකම වැඩි වැඩියෙන් නැති වී ඔවුන්ගේ ඒ ඉගැන්වීම් පිළිකාවක් මෙන් ඔබු දුවන්නේය. හිමේනියස්ද පිලේතස් ද එවැනි අය වෙති. ඔවුහු මළවුන්ගේ නැවත නැගිටීම දැනටමත් සිදුවී තිබෙන බව කියමින් සත්‍යයෙන් බැහැර ගොස් සමහරුන්ගේ විශ්වාසය අවුල් කරති. කෙසේ වුවත් දෙවියන් වහන්සේ දැමූ සවි අත්තිවාරම ස්ථිරව පවතී.**" (**2 තිමති 2: 14-19**) ආධ්‍යාත්මික මනුෂ්‍යයාට ඇති සටනේ දී සත්‍යය නමැති පටියෙන් ඉඟටිය බැඳගෙන නැත්නම් (**එපීස 6**:14) හෙවත් ඔබගේ අරමුණ අවංක නො වේ නම් සත්‍යය ධර්මය ඔබට

අවබෝධ නො වේ. එවිට විකාර අදහස්වලින් හිස පුරවා ගෙන එවැනි අනෙක් අයව ද වියවුල් කිරීම සැම දා සිදු වනු ඇත. එනිසා **අරමුණේ අවංක භාවය** පිළිබඳ එකිනෙකා මහත් සේ විමසිලිමත් විය යුත්තේය.

දෙවියන් වහන්සේගේ වචනය කෙනකුට ගැළවීමේ මඟකි. තව කෙනකුට එය පැකිලීමේ ගලකි. සමහරු එහි පැකිලී, වැටී තුවාල කර ගනිති. අරමුණේ අවංක භාවය ඇත්නම් ඔවුන්ට දේව වචනය ගැළවීම උදා කරනු ඇත. සුවිශේෂ පොත් එක ම සිද්ධිය විස්තර කිරීමේ දී මතුපිට සිදුවීම්වල වෙනස්කම් දක්නට ඇත. එහෙත් ගැඹුරු අරුත නොවෙනස් ව පවතී. ආධ්‍යාත්මික මිනිසා ගැඹුරු අරුතට පිවිසෙයි; ගැළවීම සොයා ගනී. ලෞකික මිනිසා මතුපිට දේ මත රැඳී වියවුල් වෙයි: අන් අය ද වියවුල් කරයි.

02. ජේසු සමිඳාණෝ දේව රාජ්‍ය ගැනත්, දේව තාත්තා ගැනත්, දේව රාජ්‍යයේ නීති ගැනත් අපට ඉගැන්වූහ. දේව රාජ්‍යයේ රජාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව ශුද්ධවර පාවුලු තුමා අපට උගන්වයි. එතුමාගේ ජීවිත මාරුවක් සිදු වූ අත්දැකීම (සාවුල්, ශුද්ධවර පාවුලු තුමා වීම) **ශුද්ධ බයිබලයේ ක්‍රියා පොතේ 9: 1-19** සඳහන්ව ඇත. හිරුගේ ආලෝකයට ද වඩා ප්‍රබල ආලෝකය ඉදිරියේ සෙබලුන් බිම වැටුණු මොහොතේ ඒ ආලෝකය තුළින් ජේසු සමිඳුන්ගේ හඬ ඔහුට ඇසේ. ''**ඇයි, සාවුල් මට පීඩා කරන්නේ?**'' ''ස්වාමිනි, ඔබ කවරෙක්ද?'' යි ඔහු විමසීය. ''**ඔබ විසින් පීඩා කරන ජේසුස් මම වෙමි**'' යනුවෙන් පිළිතුරු ලැබිණි. එදා කිතුනුවන්ට පීඩා කරමින් සිටි සාවුල් **ඓතිහාසික ජේසුස් (Historical Christ)** ගැන අසා තිබිණි. මෙම සංවාදය තුළින් ඔහු **උත්ථාන වූ ජේසුස් හෙවත් ප්‍රතාපවත් ජේසුස් (Gloryfied Christ)** පිළිබඳ අවබෝධය ලැබීය. එහෙත් ඔහු පීඩා කළේ ජේසුස්ට නො ව ජේසු සමිඳුන් ඇදහූ ජනතාවටයි. එය තමාට දුක දීමක් ලෙස ජේසු සමිඳුන් පැවසීමේ දී **අතීන්ද්‍රිය දේහය වන ජේසුස් (Mystical Body of Christ)** පිළිබඳ සත්‍යය ඔහුට අවබෝධ වෙයි. (සභාව ජේසු සමිඳුන්ගේ ශරීරය බව, ඒ ශරීරයේ හිස ජේසු සමිඳුන් ම බව, සභාවට අයිති සියල්ලන් අවයව පමණක් බව, අවයවයක වේදනාව අනෙක් අවයවයන්ට ද හිසට ද දැනෙන බව, හිසේ වේදනාව සියලු අවයවයන්ට දැනෙන බව.)

සාවුල් අන්‍යය ජාතීන් වෙත දහම ගෙන යන්නට සමිඳුන් විසින් තෝරාගත් මෙවලමක් බව අනනියස් විසින් සාවුල්ට පැවසීමේ දී **විශ්වයීය ජේසුස් (Cosmic Christ)** පිළිබඳ සත්‍යය ඔහුට වැටහේ. ඊශ්‍රායෙල්, දෙවියන් වහන්සේ විසින් තෝරාගත් ජනතාව බවත්, අන් සියල්ලෝ අන්‍ය ජාතීන් බවත් එදා පැවති අදහස විය. සකල ජනතාව ම දෙවියන් වහන්සේගේ ජනතාව බවට ඉහත සඳහන් වචනවලින් සාවුල් අවබෝධය ලැබීය. එනිසා කිතුනු නාමය දරන සියල්ලෝ ශුද්ධවර පාවුලු තුමාගේ අත්දැකීම හා එක් වෙමින් පූර්ණ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අත්දැකීමට පිවිසෙමු. එවිට පටු බව සිඳී වැනසී ගොස් කිතුනු නාමය දරන සියල්ලන් ඒකරාශී වනු ඇත. ශුද්ධවර පාවුලු තුමාගේ සංදේශ පත්‍ර සියල්ල ම **ක්‍රියා 9: 1-19** පිළිබඳ විකාශයකි. අතීන්ද්‍රිය දේහයේ හිස දැනට ම උත්ථාන වී ඇති නිසා එම දේහය ම (සභාව) උත්ථාන වන බව එතුමා දකී. (දහම දෙන ගුරුවරයා ඓතිහාසික ජේසුස් ගැන පමණක් නම් දන්නේ ඒ පණිවුඩයට පන්නරයක් නැත. ප්‍රතාපවත් ජේසුස් ගැන හෝ අත්දැකීමක් ඇත්නම් ඒ දහම් පණිවුඩයට පන්නරයක් ලැබේ.)

03. දේව රාජ්‍යය යි, අවසානයේ ඉතිරි වන්නේ. දේව රාජ්‍යය ගොඩනගන්නට සභාව (කිතුනු නිකායන් පවා) මෙවලමක් පමණ යි. සභාවට අයිති සමහරුන් දේව රාජ්‍යයට අයිති නො වන්නට පුළුවන. සභාවට අයිති නැති සමහරුන් දේව රාජ්‍යයට අයිති වන්නට පුළුවන. ජේසු සමිඳාණෝ මේ සත්‍යය පැහැදිලිව ම ප්‍රකාශ කළහ. **(ලූක් 13: 27-29)** එනිසා 'අපගේ නිකායේ අය පමණ යි ගැළවෙන්නේ' යනාදි පටු අදහස් ඉවත දැමිය යුතුයි. **''මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි. මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝය.'' (යොවාම් 14:6)** මෙහි දී ජේසු සමිඳුන් තැනැන් වහන්සේ කෙනකු ලෙස පමණක් දකින්නා පටු අර්ථකථන දෙනු ඇත. ජේසුස් සමිඳාණෝ ධර්මයාණෝය, ප්‍රේමයාණෝය. එනිසා යහපත් සියල්ල, මිනිසා යහමඟට යොමු කරන සියලු ආගම් පවා නික්මෙන්නේ එතුමන්ගෙනි. පටුවීම යි, කෙනකුට සිදු විය හැකි ලොකු ම විපත. පුළුල් වීම යි, කෙනකුට සිදු

විය හැකි ලොකු ම යහපත. එනිසා අපට රිදුනත් අපගේ පටු සීමා සුණු විසුණු කරමින් දෙවියන් වහන්සේගේ පුළුල් භාවයට අපව අඹන්නට අපි සමිඳුන්ට ඉඩ දෙමු.

04. ජේසු සමිඳාණෝ දෙවි පියාණන්ගේ 'ප්‍රේමවන්ත පුත්‍රයා' පමණක් නො ව 'දුක්විඳින සේවකයා' ද වූහ. **ශුද්ධ බයිබලය-යෙසායා 42: 1-4, 6,7, 49:1-9, 50:4-9, 52:13-53:12** දුක්විඳින සේවකයා පිළිබඳව කදිම විග්‍රහයකි. කිතුනු නාමය දරන බොහෝ දෙනා 'ඔබ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය' අත්දැකීමට මහත් සේ ඇලුම් වෙති. එහෙත් 'ඔබ මාගේ දුක්විඳින සේවකයාණෝ ය.' අත්දැකීමට පිවිසීමට කොහෙත් ම සූදානම් නැත. එවිට ආධ්‍යාත්මික ළදරුවන් මිස ආධ්‍යාත්මික යෝධයින් බිහි නො වනු ඇත. දේව සේවකයාගේ දුක් විඳීමේ දී ඔහුට වැරදි ඇතැයි කිතුනු නාමය දරන අය ම පවසනවා නම්, සුඛ විහරණයෙන් කල් යවන්නන් දෙවිඳුන්ගේ ආසිරි ලත් අය ලෙස සිතනවා නම් එය මහත් නොමඟ යාමකි. කිතුනු නාමය දරන සියල්ලන් දෙවියන් වහන්සේගේ දුක් විඳින සේවකයාණන්ගේ අත්දැකීමට වැඩෙන්නට සූදානම් වන තරමට පටු බව දුරු වී ඒකරාශි වීම කඩිනම් වනු ඇත.

05. ජේසු සමිඳුන් "ඔබ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය; මම ඔබ කෙරෙහි අතිශයින් ප්‍රසන්න වෙමි" යි ගෞරවාන්විත ආමන්ත්‍රණය දෙවි පියාණන්ගෙන් ලැබුවේ ජෝර්දාන් බෞතිස්මයේ දී ය. ජේසු සමිඳුන්ට මනස්ස්ථාපනයේ බෞතිස්මය අවශ්‍ය නො විය. එතුමන් ලැබුවේ තමා කැපකර ගැනීමේ බෞතිස්මයකි. එය මිනිස් සංහතියේ පාපයේ මඩවගුර තමා භාර ගෙන එහි මිලය ගෙවන්නට කැපවීමකි. එවිට යි, ඔබ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය යනුවෙන් දෙවි පියාගේ මහත් ප්‍රසාදය ලැබුවේ. එනිසා ශුද්ධාත්ම බෞතිස්මයේ රහස හෙවත් සහතිකය අන් අය උසස් කරනු පිණිස තමා කැපකර ගෙන දෙවි පියාණන්ට අවනත වීමට තීරණයක් ගැනීම යි.

06. සමහරුන් දැනුම් සම්භාරයක් පමණක් සොයමින් සිටින බවත්, තව සමහරුන් හාස්කම් සොයමින් සිටින බවත් පවසන ශුද්ධවර පාවුලු තුමා තමා කුරුසියේ ඇණගසනු ලැබූ ජේසු සමිඳුන් අනුව දිවි ගෙවන බව පවසයි. **(1 කොරින්ති 1:22,23)** කුරුසියේ ඇණගසනු ලැබූ ජේසු සමිඳුන් අනුව දිවි ගෙවීම නම් කුරුසියේ මාර්ගය වැළඳ ගැනීම යි. එය තම අයිතිවාසිකම්වලට, තම ආශාවන්ට, තම කැමැත්තට මරණයකි. සියලු කිතුනු නිකායන් දැනීම් සම්භාරයක් පමණක් සෙවීම හා හාස්කම් සෙවීම පසෙක දමා කුරුසියේ මාර්ගයට පිවිසෙන්නේ නම් ඒ අත්දැකීම තුළ සියල්ලන් ඒකරාශි වනු ඇත.

07. **"කිතුනු දහමේ හෝඩිය පසෙක තබමු. ......පරිණත ධර්මය කරා ඉදිරියට යමු." (ශුද්ධ බයිබලය හෙබ්‍රෙව් 6:1,2)** පරිණත දහම යනු ප්‍රේමය යි. සියලු තර්ක විතර්ක පසෙක තබා ප්‍රේමයේ දහම තුළ වැඩෙමු. **"ක්‍රිස්තුස් වහන්සේ ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදා ගන්නට කුරුසිය මත ශාපය වූ" (ගලාති 3:13)** නිසා අපි කල්වාරි කඳු පාමුල රැඳෙමු. සීනායි කඳු පාමුලම නැවති, පැරණි ගිවිසුමේ ව්‍යවස්ථාව ගැන ම තර්ක විතර්ක කරමින් සිටින නිකායන් ඒ තර්ක විතර්ක දැන් වත් අවසන් කර ප්‍රේමයේ දහම උදෙසා වැය විය යුතුයි.

දෙවි පියාණන්ගේ අපරිමිත ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දීමක් වශයෙන් ලෝක විජිතය ම එතුමන්ගේ අණසකට නතු කරනු සඳහා ඔබගේ ජීවිත විජිතය ධර්මයාණන්ගේ අනසකට නතු කරන්නට අවංක තීරණයක් ගන්න. එවිට යි, ධර්මයාණන් දිනෙන් දින වැඩි වැඩියෙන් ගැඹුරට ම ඔබ කවුදැ යි ඔබට පෙන්වන්නේ. මෙය ඉතා වැදගත් අවබෝධයකි. එවිට ඔබ ලෝකයේ ම, විශ්වයේ ම පුංචි සැම්පලයක් පමණක් බව ඔබට වැටහෙනු ඇත. ඔබ තුළ ඇති මමත්වයේ ප්‍රකාශනය යි ලොව තුළ ද තිබෙන්නේ කියා ඔබට වැටහෙනු ඇත. ඔබගේ සතුරා, සැමගේ සතුරා යම් පුද්ගලයෙක්, යම් සංවිධානයක්, යම් රටක් නො වන බවත්, ඔබගේ ද සැමගේ ද එක ම සතුරා ආත්මාර්ථය පමණක් බවත් ඔබට වැටහෙනු ඇත. එවිට සභාවේ, නිකායේ, රටේ, ලෝකයේ ඌණතා දකින්නට දකින්නට එහි විමුක්තිය උදෙසා ඔබ ඔබගේ මමත්වය දිනෙන් දින කුරුසියේ ඇණ ගසන්නට ධර්මයාණන්ට ඇරයුම් කරනු ඇත; ඒ සඳහා එතුමන්ට ඉඩ දෙනු ඇත. එය යි, ප්‍රේමයේ දහම.

08. තර්කය සත්‍යය කරා ඇති දිග ම මඟ යි. ධර්මයාණන් තම ආදරවන්ත පියා හැටියට එතුමන් තුරුලේ සිටිමින්, සියලු ගැටළු එතුමන්ගෙන් ම විමසමින්, එතුමන්ගෙන් ම ඉගෙන ගන්න. එය යි, සත්‍යය කරා ඇති කෙටි ම, ප්‍රබල ම මඟ. ජේසු සමිඳුන් ගැන කතා කරනවාට වඩා ජේසු සමිඳුන් සමග කතා කරන්නට ඉගෙන ගනිමු. අපට අවශ්‍ය ඒ නිකාය හෝ මේ නිකාය නො වේ; අපට අවශ්‍ය ජේසුස් ය. (ධර්මයාණන් ය) අපි සැම ඒ අරමුණට පිවිසෙමු. පෞද්ගලික අර්ථ නිරූපන සහිත ඉගැන්වීම් සියල්ල පසෙක තබා ජේසුස් අඳහා ගන්නට, හැඳින ගන්නට, එතුමන්ගේ ස්වරූපයට ඇඹෙන්නට, එලෙස දෙව් පියාණන්ට පූර්ණ ව අවනත වන්නට, අන් අයගේ ගැළවීම උදෙසා පූජා වන්නට, සමිඳුන්ගේ සියලු කැඩීම් හා ඇඹීම්වලට අග දක්වා ඉඩ දෙන්නට පිපාසයක් ඇතිකර ගනිමු. <u>එම ආකල්පය ඇති අයට ශුද්ධාත්මයාණෝ දේව වචනයේ අරුත නිසි ලෙස අවබෝධ කර දෙති.</u> ඔහු උගත් වුව ද නුගත් වුව ද ඒ කිසිවක් ඊට බාධාවක් නො වේ. එම ආකල්පය නොමැති නම් ඔහු පැවදි හෝ පූජක වුව ද, බයිබල් විශේෂඥයකු ලෙස පිළිගන්නකු වුව ද ඔහුට දේව වචනයේ අරුත නිසි ලෙස නොවැටහේ. ඔහුගේ වැරදි ඉගැන්වීම් ජීවිත නාස්ති කරනු ඇත. කිතුනු දිවියක ඇරඹුමේ සිට මුදුන දක්වා පියවර තුනකින් හැඳින් විය හැකිය. (1. දේව වචනය මත ගොඩනැගෙන විශ්වාසය. 2. දෙවියන් වහන්සේට අවනත වීමේ විශ්වාසය. 3. බලාපොරොත්තුවේ විශ්වාසය.) දේව වචනයට වැරදි අර්ථ නිරූපන දීමෙන් පළමු පියවර නාස්ති කරගතහොත් අනෙක් පියවර දෙක ද අඩාල වීම වැළැක්විය නොහැකිය.

09. පටු බව සුං වී කිතුනු නාමය දරන සියල්ලන් ඒකරාශි වීමට නම් ප්‍රඥාවේ උල්පත අබියස ප්‍රඥාව ලබා ගන්නා ඉරියව්වෙන් සිටින්නට ඉගෙන ගනිමු. අප දන්නා දෙයට වඩා නොදන්නා කොටස විශාල බව දකිමු. අපරිමිත විශ්වය ඉදිරියේ දූවිලි අංශුවකට ද වඩා අල්ප බව දකිමු. එය අප තුළ බැහැපත් නිහතමානි බවක් ජනිත කරවයි. බැහැපත්කම දෙවියන් වහන්සේගේ ප්‍රඥාව අප වෙත ඇදගන්නා කාන්දමක් මෙනි. (මෙතරම් අල්ප භාවයකට දෙවිඳුන්ගේ ප්‍රේමවන්ත පුත්‍රයෙක් හැටියට දුන් කැඳවීම නිසා කෘතඥතාපූර්ණ ආත්මයක් ද ඇති ව සිටිමු.)

<u>සිතුවිලි තුළ ඇති නම්‍යතාවය හෙවත් පහසුවෙන් නැමෙනසුලු බව බැහැපත් සිතක මූලික ලක්ෂණයකි.</u> ප්‍රඥාවේ උල්පත කුඹල්කරුවා නම් අපි ඒ අබියස මැටි පිඬක් මෙන් සිටිය යුතු වෙමු. ප්‍රඥාවේ උල්පත විසින් අප අබියස තබා ඇත්තේ මුළු ජීවිත කාලය තුළ හෝ ගවේශණය කර නිමාවක් දැකිය නොහැකි අසීමිත යථාර්ථයකි. යමෙක් සිතුවොත් දහම ගැන තමා සම්පූර්ණයෙන් දන්නවා කියලා, ඒ ගැන කිසිවකුගෙන් ඉගෙන ගන්න දෙයක් තමාට ඉතිරි වෙලා නැහැ කියලා එය ලොකු ම නොමඟ යාම යිඃ ලොකු ම අහංකාරකම යි. එනිසා දේව වචනයට තර්කානුකූල ස්වරූපයක් නොදී ශුද්ධාත්මයාණන් අබියස නම්‍යව සිටින්නට ඉගෙන ගන්න. එයින් සිදු වන්නේ අසීමිත ගවේශණ ක්ෂේත්‍රයට බලගතු ලෙස පිවිසීමකිඃ ශුද්ධාත්මයාණන් තුළ නිරන්තර අනාවරණයකි. <u>**ඛලිල් ජිබ්රාන්**</u> මෙ ලෙස පවසයි.

"ඔබේ සිතුවිල්ල සම්ප්‍රදාය නමැති පසෙහි ගැඹුරට මුල් ඇදුන ගසෙකි; මගේ සිතුවිල්ල අවකාශය තුළ සරන වලාවෙකි; එය බිඳු ගැන්වී, දිය පාරකට හැරී සමුදුර තුළට ලාලිත ස්වරයෙන් ගළා බසී. ඉක්බිති එය වාෂ්ප වශයෙන් අහසට නගියි. ඔබේ සිතුවිල්ල චණ්ඩ මාරුතයෙන් හෝ හෙණ පතිතයෙන් හෝ සලිත කළ නොහැකි බල පවුරෙකි; මගේ සිතුවිල්ල හැම අතට ම පාවී යන ඒ පාවී යාමෙහි තුටු සුව විඳින සුමුදු තුරු පතෙකි; ඔබේ සිතුවිල්ල වෙනස් නො වන චිරන්තන දෘෂ්ටියකි; ඔබ වෙනස් කිරීමට එයට හෝ එය වෙනස් කිරීමට ඔබට හෝ නොහැක. මගේ සිතුවිල්ල නැවුම් ය; උදේ හවා එය විසින් මා ද මා විසින් එය ද සෝදිසි කෙරේ."

10. මිනිස් බව ගත් ධර්මයාණන් වන ජේසු සමිඳුන්ගේ මෑණියන් වන මරිය තුමියගේ දේව මාතෘත්වයට ලෝ වැසි සියල්ලෝ කැඳවීම ලබා සිටිති. කිතුනු නාමය දරන සියල්ලෝ විශේෂයෙන් ම කැඳවීම ලබා සිටිති. කුමක්ද, දේව මෑණියන්ගේ දේව මාතෘත්වය? තම අයිතිවාසිකම්වලින්, තම ආශාවන්ගෙන්, තම කැමැත්තෙන් හෙවත් තමන්ගෙන් <u>හිස් වෙමින්</u>, දෙවියන් වහන්සේට <u>විවෘත වෙමින්</u>, ධර්මයාණන්ගේ වචනය <u>ලබා ගනිමින්</u>, ඒ වචනය තමා

තුළ දරා ගනිමින්, එය තමා තුළ වර්ධනය කරමින්, ඒ වචනය තමා තුළින් ලෝකයට බිහිකිරීම යි. කිතුනු ජනතාවගෙන් දෙවිඳුන් බලාපොරොත්තු වන දූත මෙහෙය එය යි. මරිය තුමියට කළ හැකි ලොකු ම ගෞරවය ද එය යි. කිතුනු නාමය දරන්නන් තුළ දේව මාතෘත්වයට අදාල මෙම කරුණු හය සිදු වන තරමට සියල්ල ඒකරාශි වීම පහසු වනු ඇත. දේව මෑණියන්ගේ දේව මාතෘත්වයේ පාරමිතාව දිවි හිමියෙන් පුරන අය තුළින් ක්‍රිස්තු ශ්‍රාවකයන් (ධර්මිෂ්ඨයන්, ප්‍රඥාවන්තයින්) බිහි වනු ඇත.

(සෑම වසරකම පළමු වන දින සභා මාතාව, දේව මෑණියන්ගේ දේව මාතෘත්වය උත්සවාකාරයෙන් පවත්වන්නිය. එය දේව මෑණියන්ගේ දේව මාතෘත්වය තුළින් දේව මාතෘත්වයට, අපට ද ඇරැයුම් කිරීමේ හා ඒ සඳහා ආසිරි ගැන්වීමේ මංගල්ලයක් බව එදිනට නියමිත පූජා කියවීම් අධ්‍යයනය කරන විට ඔබට ම අවබෝධ වනු ඇත. **(ගණන් කථාව 6:22-27, ගීතාවලිය 67:1-7, ගලාති 4:4-7, ලූක් 2:16-21)** ඔබගෙන් හිස් ව දෙවියන් වහන්සේට විවෘතව ඔබ තුළට ලබා ගන්නට දෙන බීජය (වචනය) කුමක් ද? **"ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයෙකි: එනිසා ඔබ උරුමක්කාරයෙකි."** එම වචනය ඔබ තුළ දරාගෙන, ඔබ තුළ වර්ධනය කර, එය ඔබ තුළින් ලෝකයට බිහි කරන්නට සභා මාතාව ඔබට ඇරැයුම් කරන්නිය. ඒ සඳහා දෙන අනුශාසනය **"මරිය තුමිය සියල්ල සිත් හි තිදන් කොට ඒවා මෙනෙහි කළාය."** "ඔබ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයා ය; මම ඔබ කෙරෙහි ප්‍රසන්න වෙමි." දෙවියන් වහන්සේ මෙම මහඟු ත්‍යාගය අප එකිනෙකා හා බෙදා ගන්නට මහත් සේ රිසි වෙති. අප ඒ උරුමයට සහභාගි වන තරමට යි, දෙවිඳුන්ට අවනත වන්නට අපට හැකි වන්නේ. මෙම ශුභාරංචිය අප අයිතිකර නොගතහොත් අපේ ජීවිතයේ සියල්ල උන්වහන්සේට භාර දී එතුමන් එය සුරකින බව විශ්වාස කරන්නට අපට අපහසු ය. එය දෙවිඳුන්ගේ ප්‍රේමයට ගැඹුරින් ම සහභාගි වන්නට හා උන්වහන්සේට පූර්ණ ව අවනත වන්නට දෙන ඇරැයුමකි. දේව පුත්‍ර භාවයට වර්ධනය වීම ධර්මිෂ්ඨ ජීවිතයකි. දේව පුත්‍ර භාවය නව දේව පුත්‍රයන් බිහි කරයි.

11. මැවුම්කරුවාණන් හෙවත් ධර්මයාණන් අත්දැකීම පරම සත්‍යය පිළිබඳ ගවේශණයකි. පරම සත්‍යය විරුද්ධාභාසි (Paradoxical) ආකාරයෙන් අවබෝධ කරගත යුක්තකි. එය තර්ක බුද්ධියෙන් ඔබ්බට යන්නෙකි; එනිසා එය තර්කයට ගෝචර නො වේ. විරුද්ධාභාසි යනු පරස්පර විරෝධි සේ පෙනුනත් නියම වශයෙන් ම සත්‍යමය වූ දෙය ලෙස හඳුන්වන්නට පුළුවන. විරුද්ධාභාසි දෙය අවබෝධකර ගන්නට ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලෝකය අත්‍යවශ්‍යයි. අපට මතුපිටින් පෙනෙන ඒ පරස්පරය තුළ දෝලනය වන විට ශුද්ධාත්මානුභාවය තුළින් නිසි අරුත ලැබේ. බැලූ බැල්මට පරස්පරයක් සේ පෙනෙන දෙයක එක අන්තයක් පමණක් තදින් අල්ලා ගෙන ඒ පිළිබඳ තර්ක විතර්ක කරමින් සිටීම තුළින් ඇතිවන්නේ වියවුලක් පමණකි.

'**මා සෙවූ දෙය මට හමු විය.**' නමැති සිය නිර්මාණය තුළින් **කාර්ලෝ කරෙත්තෝ** සභා මාතාව පැසසුයේ මෙසේ ය. "මෑණියනි, මා ඔබට කෙතරම් අවලාද කිව යුතුද? එහෙත් මම ඔබට බොහෝ සේ ආදරය කරමි. අන් කිසිවකුට වඩා ඔබ මට වේදනා ගෙන දී ඇත. එහෙත් අන් කිසිවකුට වඩා මම ඔබට සදා ණයගැති වෙමි. ඔබ මා ඉමහත් අපකීර්තියට පත්කර ඇත. එහෙත් ශුද්ධවත් බව වටහා ගන්නට මට ඔබ හැර සහාය වූයේ වෙන කවුරුන් ද?" කිතුනු නාමය දරන ඔබට මෙහි ගැඹුර වැටහේ නම්, එහි අරුත ඇගැයිය හැකි නම් දෙවියන් වහන්සේගේ ප්‍රමුඛ සභාව තුළ සිටීම, ප්‍රමුඛ සභාව හා එක් වීම ඔබට ගැටළුවක් නොවනු ඇත.

## භාග්‍ය 8 ක්‍රිස්තු වටිනාකම්වල හරය හෙවත් අරටුව යි. (මතෙව් 5:1-10)

භාග්‍ය අටට ඇඹෙන ජීවිතය අනිවාර්යයෙන්ම ධර්මිෂ්ඨ ජීවිතයකි; ශුද්ධවන්ත ජීවිතයකි. භාග්‍ය අටට ඇඹෙන්නට අවංක ව රිසි වීමත් ඒ සඳහා ධර්මයාණන්ට අග දක්වා ම ඉඩ දීමත් අපගේ කොටස යි. එවිට ධර්මයාණෝ සංඝයක් ලෙස අප ඒකරාශි කරති; සාමාන්‍ය සංඝයක් නො ව ගිවිසුම් සංඝයක් බවට පත් කරති. ගිවිසුම් සාංඝික ජීවිතයක් යනු

මරණය දක්වා එකිනෙකාට ප්‍රේම කරන්නට හා පක්ෂපාති වන්නට ගිවිසුමකින් බැඳෙන ජනතාවකි. එවැනි ගිවිසුමකින් බැඳෙන දෙදෙනකු වුව ද ගිවිසුම් සාංඝික ජීවිතයකි. විවාහ ජීවිතය ගිවිසුම් සාංඝික ජීවිතයකි. තව එක් අයකු සමග හෝ ගිවිසුම් සාංඝික ජීවිතය තුළ අග දක්වා පැවතුනොත් ඔබගේ ඒ අත්දැකීම ඔබගෙන් පිටාරා ගලයි. එවිට ලොව සියල්ලන්ට ම ඔබ තුළින් නික්මෙන්නේ ගිවිසුම් ප්‍රේමයකි.

එවැනි සංඝයක එකිනෙකා තුළින් ඇති වන කැඩීම් මගිනි, භාග්‍ය අටට ඇඹෙන ජීවිතයක් නිර්මාණය වන්නේ. ඒ සඳහා අග දක්වා ම ඉඩ දීම අපගේ කොටස යි. කඳුකරයේ ගංගාවල විවිධ හැඩරුව ඇති ඔපමට්ටම් වූ කළුගල් දක්නට ලැබේ. ගොරහැඩි කළුගල් එසේ ඔපමට්ටම් වී ඇත්තේ කෙසේද? ගල් එකිනෙක ගැටෙමින්, පතුරු ගැළවෙමින්, වැලිතලාවේ ඇතිල්ලෙමින් ගිය ගමනේ ප්‍රතිඵලයක් ලෙසිනි. පවුලේ අඹුසැමි ගැටුමකින් පසු එයට හේතුව මෙනෙහි කිරීමේ දි තම වචන අඩුකරගත යුතු යැයි ඇයට හැඟෙයි. මීට වඩා ඉවසීමක් තිබිය යුතු යැයි ඔහුට හැඟෙයි. එය එකිනෙකාගේ පතුරු ගැළවී යාමකි. ධර්මයාණන් කැඩීම් ඇඹීම් කරන්නේ එකිනෙකා තුළිනි. එයට අග දක්වා ඉඩ දීම අපගේ කොටස යි.

ගොරහැඩි කළුගලකට අපට මෙන් මනසක්, බුද්ධියක්, නිදහස් කැමැත්තක් ඇත්නම් ඇයි මම හැපෙමින් පතුරු ගැලවෙමින් වැලිතලාවේ සිටින්නේ කියලා එයට හැඟෙන්නට පුළුවන. එවිට එය සංඝයෙන් (සභාවෙන්) ඉවත්ව ඉවුරට පැන ගන්නට පුළුවන. එවිට එය හැම දා ගොරහැඩි කළුගලක් පමණි. ගැළවීම ලබන ජනතාව ධර්මයාණන් හා බැඳෙමින් එතුමන් ඔබ තබන සංඝය තුළ කැඩෙමින්, ඇඹෙමින්, කාලයේ වැලිතලාවේ ඇතිල්ලෙමින්, ඔපමට්ටම් වෙමින් සදාතනය කරා වන්දනා ගමනේ යෙදිය යුතුය.

## සිතින් දිළින්දෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.

'අනවිම්' යන හිබෲ වචනයේ අරුත දේව දිළින්දා යː හෙවත් තම ශක්තිය දෙවියන් තුළ තැබූ දෙවියන්ගෙන් යැපෙන මනුෂ්‍යයා ය. ආර්ථික දිළිඳුකම එහි එක් අංශයක් පමණකි. ඔබ සතු සියල්ල දෙවිඳුන් හස්තයේ තබා, එතුමා ඒ සියල්ලේ අයිතිකරු බව ද, ඔබ භාරකරු පමණක් බව ද පිළිගෙන, ඔබට ඇත්තේ කළමනාකරණය පිළිබඳ කාර්යයක් පමණක් බව පිළිගෙන, එය ද දෙවිඳුන්ගේ කැමැත්ත ලෙස පමණක් ඉටුකරන්නට තීරණය ගැනීමෙන් ඔබ සිතින් දිළින්දෙක් වේ. ධර්මයාණන් හා එක් වන්නට නම් සියල්ලෝ ඒ අත්දැකීමට පිවිසිය යුත්තාහ.

කෙනකුගේ ධනවත්කම ඔහුට දෙවිඳුන්ගෙන් යැපෙන්නට බාධාවකි. එය ඔහුට මහත් පාඩුවකි. එය දෙවිඳුන් පිළිබඳ අත්දැකීමෙන් දුගී වීමකි. අන්ත දුගී භාවය (පොලී හා ණය තුළ හිර වූ තත්ත්වය) දෙවිඳුන් තමාට ප්‍රේම කරන බව විශ්වාස කරන්නට බාධාවකි. දිළිඳුකම (රැස්කර ගත් දේ නැත, ණයගැති භාවය නැත) එය වාසනාවන්ත තත්ත්වයකි. එදිනෙදා දෙවිඳුන්ගෙන් යැපෙන, එමගින් දෙවිඳුන් හැඳින ගන්නට හැකි තත්වයකි. **ශුද්ධ බයිබලය- හිතෝපදේශය 30: 7-9** මෙ ලෙස සඳහන් කරන්නේ එබැවිනි. **"මා ඔබ වෙත ගෙනා අයැදුම් දෙකක් ඇත. වංචාවත් මුසාවත් මා කෙරෙන් දුරු කළ මැනව. මට දිළිඳුකම වත් පොහොසත්කම වත් නුදුන මැනව. මට වුවමනා පමණට ආහාර දුන මැනව. එසේ දිය යුත්තේ මා සැප සම්පතින් පිරී ඔබ හැර දමා 'ඔය කියන සමිඳාණෝ කවරෙක්දැ' යි නොකියන පිණිසත්, මා දිළිඳකු වී, සොරකමට වැටී දෙවිඳුන්ගේ නාමයට අගෞරව නොකරන පිණිසත් ය."**

## ශෝක වන්නෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසාද ඔවුහු සනසනු ලබන්නෝය.

කඳුළු වැගිරෙන අවස්ථා තුනක් ගැන ශුද්ධ බයිබලය ඇසුරෙන් කතා කළ හැකිය. 1. කණස්සලු නො වන්න. (ස්ව අනුකම්පාවට යට නො වන්න) එතැන කඳුළු ඇත. ඒ කඳුළු තමා උදෙසා ය. එය පාපයකි. 2. පසුතැවිලි වන්න. (මනස්ස්ථාපනය වන්න) එතැන ද කඳුළු

තිබේ. ඒ තමා උදෙසා නො වේ. තමාගේ පාපය තුළින් තමා දෙවිඳුන්ට හා මනුෂ්‍යයින්ට දුක දුන් නිසා ය. ඒ කඳුළු යහපත් ය. 3. ශෝකවන්නෝ භාග්‍යවන්තයෝ ය. එතැන ද කඳුළු ඇත. එය තමා උදෙසා නො ව අන් අයගේ ගැළවීම උදෙසා ය. තමා දෙවිඳුන් තුළ ගැළවීම, සාමය, ප්‍රීතිය අත්දකිමින් එය අත්නොදකින්නන් වෙනුවෙන්, විශේෂයෙන් ධනයට, බලයට, ජනප්‍රියත්වයට යට වී සිටින්නන් වෙනුවෙන් නිදිවරමින්, නිරාහාරයෙන් යුතු ව දෙවිඳුන්ට මොරගැසීම යි. එය ඉතා ගැඹුරු ප්‍රේමයක් ප්‍රකාශ කරයි.

**මොළොක් ගුණ (මෘදු ගුණ) ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසාද, ඔවුහු දේශය උරුම කර ගන්නෝය.**

ඔබගෙන් මගෙන් කිසිවකුට උදුරාගත නොහැකි එක ම දෙය යි, ඔබත් මාත් සතුව ඇත්තේ. ඒ ප්‍රේම කිරීමේ අයිතිය යි. ඔබව තලන, පෙළන, මරන පුද්ගලයාට පවා ප්‍රේම කරන්නට ඔබට හැකිය. එසේ නම් මොළොක් ගුණය යනු කුමක්ද? ප්‍රේම කරන්නට පමණක් අයිතියක් ඇති, වෙන කිසි ම අයිතිවාසිකමක් නැති, ඒ ගැන කණස්සල්ලක් ද නැති පුද්ගලයකු තුළ ඇති වන සුවිශේෂ ගුණයකි. මොළොක් ගුණයට ඇඹුන තැනැත්තා ශුද්ධ බයිබලය විසින් ‘පනුවා’ යන වචනයෙන් හඳුන්වනු ලබයි. එම අත්දැකීමට පිවිසි පුද්ගලයා තුළින් සමාජය කෙරෙහි නික්මෙන ආධ්‍යාත්මික බලය අපමණ ය. **“නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ මම වෙමි. බිය නොවන්න. මම නුඹට පිහිට වන්නෙමි යි කියමින් නුඹේ දකුණත අල්ලන්නෙමි. <u>පනුවෙක්</u> වැනි ජාකොබ් නුඹ ද ඊශ්‍රායෙල් මනුෂ්‍යයිනි, නුඹලා ද බිය නොවන්න. මම නුඹ මුවහත් කර අලුත් දැති ඇති මඩින යන්ත්‍රයක් මෙන් කරන්නෙමි.” (යෙසායා 41:13-15)**

පනුවාට අනුන්ගේ වැරදි දකින්නට ඇස් නැත; අනුන්ගේ කේලම් බස් අසන්නට කන් නැත; අයිතිකර ගන්නට අත් නැත; අනතුරක දී පැන දුවන්නට කකුල් නැත; පහරට පහර දෙන්නට දත්, දළ, නිය නැත. කෙනකුගේ පයට පෑගුනොත් හිමින් සීරුවේ මිය යයි. කුරුසිය මත යාගික වන ජේසු සමිඳාණෝ මොළොක් ගුණයේ පරමාදර්ශය වන්නාහ.

**ධර්මිෂ්ඨකමට සා පිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසාද, ඔවුහු තෘප්තියට පැමිණෙන්නෝය.**

**“ආබ්‍රහම් දෙවියන් වහන්සේ විශ්වාස කළේය. එය ඔහුගේ ධර්මිෂ්ඨකම ලෙස දෙවියන් වහන්සේ පිළිගත් සේක.” (ශුද්ධ බයිබලය - උත්පත්ති 15:6)** ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අඳහා ගන්නට, හැඳින ගන්නට, එතුමන්ගේ ස්වරූපයට ඇඹෙන්නට යමෙක් තුළ නොනවතින සාගින්නක්, පිපාසයක් ඇත්නම් ධර්මිෂ්ඨ ජීවිතයක උපතක කලලය එය යි. ‘‘පළමුව දෙවි රජය සොයව්’’ යන්නේ අරුත ද එය යි.

**දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසාද, ඔවුහු දයාව ලබන්නෝය.**

තමන්ට ද ප්‍රශ්න, ගැටළු, වේදනා, අගහිඟකම් ඇත. එහෙත් ඔවුහු අනෙක් අයගේ ප්‍රශ්න, ගැටළු, වේදනා තමන්ගේ කරට ගෙන ඔවුන්ට සැනසීමක් දෙන්නට ඇප-කැප වෙති. තමා අනෙක් අය ගැන බලන තරමට සමිඳුන් තමා ගැන බලා ගන්නා බවට ඔවුන් තුළ විශ්වාසයක් ඇත. ඔවුහු රෝගී අසරණ අය, සොයා යති; අසාධාරණයට යට වූ අය සොයා යති; පාපින්, දුබලයන් සොයා යමින් ඔවුන් උසස් කරන්නට ක්‍රියා කරති. තමාගේ හොඳ නම පවා ඒ වෙනුවෙන් නැතිකර ගන්නට ඔවුහු සූදානම් ව සිටිති. දයාවන්තයෝ යනු එවැන්නෝ ය. එවැන්නෝ දෙවිඳුන්ගේ දයාව නිසැකව ම ලබති.

**පිරිසිඳු සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසාද, ඔවුහු දෙවියන් දකින්නෝය.**

ජේසු සමිඳුන් කතා කළේ පිරිසිඳු සිත ගැන යි. සිත පිරිසිඳු වුවහොත් එයින් නික්මෙන දැක්ම, සිතුවිලි, වචන, ක්‍රියා ආදි සියල්ල යහපත් වන බව අමුතුවෙන් කිව යුතු නො වේ.

පිරිසිදු සිතක් ඇතිකර ගන්නේ කෙසේද? ඔබේ ගත, සිත, අත්බව මුළුමනින් ම ජේසු සමිඳුන්ට භාර දෙන තරමට එතුමන්ගෙන් ඔබට ලැබෙන තිළිනයකි, පිරිසිඳු සිත.

**සාමය ඇතිකරන්නෝ (සමාදාන කරන්නෝ) භාග්‍යවන්තයෝ ය. මක්නිසාද ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නෝය.**

සාමය ඇත්තේ කොතැනද? දෙවියන් වහන්සේ හා එකිනෙකා හා සමගි වූ ජීවිතයක් තුළ යි. ධර්මයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම ගැළවුම්කරුවාණන් ලෙස පිළිගනිමින්, එතුමන්ගේ දිවි පිදීම තුළින් තිළිණයක් හැටියට අපට ලැබෙන සමාව අත්දකිමින්, ඒ සමාව අන් අය හා බෙදා ගන්නා ජීවිතයක් තුළ යි සාමය ඇත්තේ. අපගේ ජීවිතය සමාව උත්සවාකාරයෙන් පැවැත්වීමක් විය යුතුයි. (Celebration of Forgiveness) තමා තුළ සාමය නැත්නම් අන් අයට සාමය දෙන්නේ කෙසේද?

**ධර්මිෂ්ඨකම නිසා පීඩා විඳින තැනැත්තෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසාද, ස්වර්ග රාජ්‍ය ඔවුන්ගේය.**

ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ගැන ඉහත විග්‍රහ කළෙමු. එවැනි ධර්මිෂ්ඨ ජීවිතයක් වීමෙන් මහ පොළොව මත බොහෝ දුක් විඳින්නට සිදු වනු ඇත. එහෙත් එය භාග්‍යයකි.

## මිනිස් සංහතියේ විමුක්තිය උදෙසා දේව ප්‍රේමයේ ගමන් මඟ - මුදුන දක්වා

දෙවියන් වහන්සේගේ අසිමිත ප්‍රේමය විසින් සියල්ල මවනු ලැබිය. මිනිසා දෙවියන් වහන්සේට අකීකරු වීමෙන් මැවීමේ මහා වැටීමක් සිදු විය. එම වැටීමේ දී ම නැවත දෙවි-මිනිස් සබැඳියාව ඇතිකරන බවට දෙවියන් වහන්සේ පොරොන්දු වූහ. **(ශුද්ධ බයිබලය, උත්පත්ති 3:15)** වැටුණු මැවීම නැවත මවන්නට හෙවත් ගළවන්නට හැකි වන්නේ දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමයට පමණි. එනිසා දෙවියන් වහන්සේ තම අසීමිත ප්‍රේමය නැවත හඳුන්වා දීමේ ඉතිහාසය ආබ්‍රහම්ගෙන් ඇරඹූහ. දෙවිඳුන්ගේ අරමුණ වූයේ සකල ජනතාවට දේව ආදරය හඳුන්වා දීම යි. එසේ නම් දෙවියන් වහන්සේ පළමුවෙන් එක පුද්ගලයකුගේ දෙවියන් වහන්සේ (ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ය, ඊසාක්ගේ දෙවියන් වහන්සේ ය, ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ය) වශයෙන් පෙනී සිටියේ ඇයි? දෙවියන් වහන්සේ ක්‍රියාකාරීත්වයකට මුල පුරන්නේ අල්ෆා මට්ටමෙනි; උන්වහන්සේ කෙමෙන් එය ඔමෙගා මුදුන දක්වා ම ගෙන යන සේක. දෙවිඳුන් එහි දෙවන අදියර ඇරඹුවේ ජාකොබ්ගේ නාමය ඊශ්‍රායෙල් කරමින් ඔහුගේ පුතුන් දොළොස් දෙනා ගෝත්‍ර දොළොසක නායකයින් හැටියට ජාතියක් තෝරාගැනීමෙනි. නික්මයාමේ ගමන දෙවියන් වහන්සේ පිළිබඳ ව ජනතාවක් ලැබූ පළමු වන ප්‍රබල අත්දැකීම විය. එම අත්දැකීමත් සමග දෙවියන් වහන්සේ ඔවුන් ‘‘පොරොන්දු දේශයට’’ ගෙන ගොස් එහි පදිංචි කළහ.

ඉන් පසු දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල්ගේ වර්ධනයට අතදෙමින් ක්‍රියා කළ ආකාරය ගැන ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ පොත් සාක්ෂි දරයි. පැරණි ගිවිසුමට අයත් **සලමොන්ගේ ගීතිකාව හෙවත් ප්‍රේම ගී පොත** දෙවියන් වහන්සේ හා ඊශ්‍රායෙල්ගේ ප්‍රේම සම්බන්ධකම පෙම්වතා හා පෙම්වතිය අත්දැකීමට පිවිසීමකි. එම සබඳතාවයේ කඩා වැටීමක් සිදු වේ. ශුද්ධ බයිබලයට අනුව පාපය වේශ්‍යාකමකි. තම ආදරවන්තයා (දෙවියන් වහන්සේ) අත්හැර අන් අය පසුපස යාමකි. එනිසා යි, ඒ කඩා වැටීම සිදු වූයේ. එවිට දෙවියන් වහන්සේ දෙවි මිනිස් විවාහයට ඊශ්‍රායෙල් (ඇය) සූදානම් කරන්නට දිවැසිවරුන් එවූහ. දෙවියන් වහන්සේගේ නාමයෙන් කතා කරන්නා හෙවත් දෙවි මිනිස් සබඳතාවය නැවත ගොඩනගන්නා දිවැසිවරයා ය.

දෙවි-මිනිස් විවාහයේ මොහොත උදා විය. එය මාංශගත වීම යි. (Incarnation) එය දෙවි පියාණන්ගේ වචනයාණන් ජේසුස් නමින් මිනිස් බව ගැනීම යි. එය දෙව්කම හා මිනිස්කම ඒකාබද්ධ වීමකි. ප්‍රේමයට බොහෝ දේ එක්කළ හැකිය; දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමයට සියල්ල එක්කළ හැකිය. මාංශගත වීම යනු නිත්‍ය දේ අනිත්‍ය දේ සමග, ශුද්ධවූ දේ ලෞකික දේ සමග, අසීමිත දේ සීමිත දේ සමග, ආධ්‍යාත්මික දේ භෞතික දේ සමග ඒකාබද්ධ වූ මොහොත යි. **ශුද්ධ බයිබලය - ප්‍රඥා 18:14** ඒ මොහොත මෙලෙස සටහන් කරයි. **"සියල්ල ගාන්ත නිසලතාවය තුළ ගිලී සිටියදී, මැදියම් රැය පැමිණි කල ස්වාමිනි ඔබගේ බලසම්පන්න වචනයාණෝ ස්වර්ගීය රාජ සිංහාසනයෙන් මිහිමතට බැස වදාළහ."**

ජේසුස් සමිඳාණෝ දේව පුත්‍රයා ද මනුෂ්‍ය පුත්‍රයා ද වෙති. එතුමා මනුෂ්‍ය පුත්‍රයා වශයෙන් පමණක් දැකීම තුළින් ද, එතුමා දේව පුත්‍රයා වශයෙන් පමණක් දැකීම තුළින් ද දුර්මත රැසක් ගොඩනැගී තිබේ. සුවිශේෂ පොත් හතර (මතෙව්, මාක්, ලූක්, ජුවාම්) ජේසු සමිඳුන් ගැන චරිත කතාවක් නො වේ. එය චරිත කතාවක් නම්, 33 වසරක ජීවිතයක 18 වසරක් ගැන සුවිශේෂ පොත් නිහඬ ව නොසිටිනු ඇත. සුවිශේෂ පොත්, ක්‍රිස්තුස් වහන්සේ ගැළවුම්කරුවාණන් හැටියට මිනිස් සංහතියේ ගැළවීම සඳහා එතුමා කළ කී දේවල එකතුවකි. එම 18 වසර (වයස අවුරුදු 12-30) ගැන සුවිශේෂ පොත් මුළුමනින් නිහඬ යැයි සිතීම ද වරදකි. ජේසු සමිඳුන්ගේ ඒ 18 වසර ගැන අවබෝධ කර ගන්නට ඇවැසි ඉඟි එහි සපයා දී ඇති බැවිනි.

ජේසුස් සමිඳුන් මනුෂ්‍ය පුත්‍රයා හැටියට පමණක් දකිමින් එතුමන්ගේ එම 18 වසර පිළිබඳව ලියා ඇති පොත් සියල්ල **ජුවාම් 7:15** වැකිය ඉදිරියේ නිෂ්ප්‍රභ වනු ඇත. "මංගල්ලයේ මැද හරියේ දී ජේසුස් වහන්සේ දේව මාලිගාවට වැඩමකර අනුශාසනා කරන්නට පටන්ගත් සේක. ඒ ගැන ජුදෙව්වරු මවිතව **කිසි කලෙක අකුරට නොගිය මේ මිනිසාට මේ සා උගත්කමක් කොයින්ද? යි කීහ. එහෙයින් ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් මාගේ ඉගැන්වීම මාගේ ම නො ව මා එවා වදාළ පියාණන් වහන්සේගේ ය....**"

**ලූක් 2:40-52** අධ්‍යයනය කරන විට දොළොස් හැවිරිදි ජේසුස් නමැති ළමයාගේ දෙවි පියාණන් පිළිබඳ ඇතුලාන්ත අත්දැකීම හා ඒ අත්දැකීම තුළින් ලබා ගෙන තිබුන ප්‍රඥාව අපව මවිතයට පත්කරනු ඇත. **"40 ළදරුවා වැඩී ශක්තිමත් ව ප්‍රඥාවෙන් පූර්ණ වූ සේක. දෙවියන් වහන්සේගේ කරුණාව ද උන්වහන්සේ කෙරෙහි විය. 41 උන්වහන්සේගේ මව් පියෝ අවුරුදු පතා පාස්කු මංගල්ලය පිණිස ජෙරුසලෙමට ගියෝය. 42 උන්වහන්සේට දොළොස් අවුරුදු වයස් වූ කල ඔවුහු මංගල්‍ය සිරිත් ලෙස ගියෝය. 43 ඔවුන් නියම දවස් ගතකොට හැරී එද්දී ජේසුස් නමැති ළමයා ජෙරුසලමෙහි නැවතී සිටි සේක. නමුත් උන්වහන්සේගේ මවුපියෝ ඒ බව නොදැන 44 උන්වහන්සේ ගමන් යන අය සමග යැයි සිතා දවසක ගමන් ගොස් නෑයන් ද අඳුනන්නවුන් ද අතරෙහි උන්වහන්සේ සෙව්වෝය. 45 උන්වහන්සේ සම්බ නොවූ බැවින් ඔවුහු උන්වහන්සේ සොයමින් ජෙරුසලෙමට ආපසු ගියෝය. 46 තුන් දවසකට පසු, උන්වහන්සේ දේව මාළිගාවෙහි පණ්ඩිතයන් මැද වාඩි වී ඔවුන් කියන දේ අසමින් ද ඔවුන්ගෙන් ප්‍රශ්න විචාරමින් ද ඉන්නවා ඔවුහු දුටුවෝය. 47 උන්වහන්සේගේ බස් ඇසූ සියල්ලෝම උන්වහන්සේගේ නුවණ හා උත්තර ගැන විශ්මිත වූහ. 48 ඔවුහු උන්වහන්සේ දැක මවිත වූහ. උන්වහන්සේගේ මව පුත්‍රය, කුමක් නිසා අපට මෙසේ කළෙහිද? බලව, නුඹේ පියා ද මම ද ශෝක වෙමින් නුඹ සෙව්වෙමු යැයි කීවාය. 49 එවිට උන්වහන්සේ නුඹලා මා සෙව්වේ මක්නිසා ද? මාගේ පියාණන්ගේ ගෘහයෙහි මා සිටින්ට ඕනෑ බව නුඹලා දැන සිටියේ නැද්දැ යි ඔවුන්ට කී සේක. 50 එහෙත් උන්වහන්සේ ඔවුන්ට පැවසූ දේ ඔවුන් තේරුම් ගත්තේ නැත. 51 උන්වහන්සේ ඔවුන් සමග නාසෙරෙත්ට පැමිණ ඔවුන්ට යටත්ව සිටි සේක. උන්වහන්සේගේ මෑණියෝ මේ සියලු කීම් සිතේ තබා ගත්තාය. 52 ජේසුස් වහන්සේ ප්‍රඥාවෙන් හා උස මහතින් ද දෙවියන් වහන්සේගේ හා මනුෂ්‍යයාගේ කරුණාවෙහි ද වැඩුණු සේක."**

මෙය ජේසුස් නමැති ළමයාගේ අකීකරුකමක් මුරණ්ඩුකමක් ලෙස කෙනකුට හැඟෙන්නට පුළුවන. ශුද්ධවර ලූක් තුමා 51 වන වගන්තිය තුළින් ඒ අදහස නිෂ්ප්‍රභ කරයි. මෙය අකීකරුකමක් නො ව දෙවි පියාණන් පිළිබඳ එතුමන්ගේ අත්දැකීමේ ප්‍රතිපලයකි. මෙහි දී ජේසුස් නමැති ළමයා හා දෙවි පියාණන් අතර සංවාදය කෙලෙස වන්නට ඇද්ද? අපට

මෙලෙස සිතන්නට පුළුවන. (දේව තාත්තා කියනවා දින කීපයක් මට මෙහි නවතින්න කියල. එය අම්මලාට කියන්නද? වගකීම හඳුනන පුතෙක් හැටියට ජේසුස් නමැති ළමයා නිසැකව ම ඒ ලෙස අසන්නට ඇත. එපා යන පිළිතුර ලැබේ. අම්මලා මා සොයා වෙහෙසේවි ජේසු පවසනු ඇත. කමක් නැහැ, ඒකෙනුත් අම්මලට හොඳක් ම වෙයි යන පිළිතුර ලැබෙනු ඇත. එවිට ජේසුස් නමැති ළමයා මෙම නිගමනයට එළඹෙනු ඇත. දේව තාත්තා මනුෂ්‍යයන්ට වඩා කොයි තරම් වෙනස් ද? ඒ වෙනස් භාවය හෙවත් ඒ ශුද්ධ භාවය මනුෂ්‍ය පටු සිතුම්-පැතුම්වලට කොපමණ භයානක ද? එහෙත් දේව ස්වරූපයට ඇඹෙන්නට රිසි අයට එය කොපමණ පලදායි ද?)

ජේසුස් සමිඳුන් දුන් පිළිතුර මවට ඒ මොහොතේ වැටහුනේ නැත. එහෙත් එතුමිය සියල්ල මෙනෙහි කළ මවකි. ජේසු සමිඳුන් වයස 30 දී නිවසින් පිට වන විට මවට පුතුගේ දූත මෙහෙය පැහැදිලි ය. පුතුගේ දූත මෙහෙය මෙනෙහි කරන්නට මවට වසර 18 ක් ලැබිණි. 49 වැකිය බලන්න. සාමාන්‍යයෙන් දොළොස් හැවිරිදි ළමයා ක්‍රියා කරන්නේ මාතෘ ප්‍රේමයෙන් හා පිතෘ ප්‍රේමයෙනි. ප්‍රේමයේ විශිෂ්ඨතම මට්ටම විශ්වයීය ප්‍රේමය යි. විශ්වයීය ප්‍රේමය යනු මවට, පියාට, දරුවන්ට දක්වන ආදරය ම ලෝ වැසි සකල ජනතාවට දැක්වීම යි. දොළොස් හැවිරිදි ජේසුස් ක්‍රියා කළේ විශ්වයීය ප්‍රේමයෙනි. 52 වැකිය ජේසු සමිඳුන් ලැබූ පූර්ණ වර්ධනය ගැන ඉඟි කරයි. එනිසා සුවිශේෂකවරු ජේසු සමිඳුන්ගේ එම 18 වසර ගැන සියල්ල ම කියා නැද්ද? දොළොස් හැවිරිදි ජේසු සමිඳුන්ගේ අත්දැකීම එසේ නම් ඒ ඔස්සේ වසර 18 පුරා ලැබූ ආධ්‍යාත්මික වර්ධනය (ප්‍රඥා කාය) කෙසේ වන්නට ඇද්ද? සිතේ උතුරන දේ කටින් පිටවෙනවා කියලයි, ජේසු සමිඳුන් පැවසුවේ. ඉතිරි වසර තුන තුළ සිදු වූයේ එය ම නො වේද?

වයස 12දී පවා විශ්වයීය ප්‍රේමයෙන් ක්‍රියා කළ ජේසු සමිඳුන් අප සැම කැඳවනුයේ විශ්වයීය ප්‍රේමයේ ජීවිතයක් සඳහා ය. **"පොළොව මත ගිනි ලන්නට ආවෙමි. ගින්න දැනටම ඇවිල තිබේ නම් මම කොපමණ කැමති වෙම් ද? මට බෞතිස්මයක් ලබන්නට තිබේ. එය ඉටු වන තුරු කොපමණ ගාවිනාවෙන් යුක්ත වෙම් ද? පොළොවට සාමය දෙන පිණිස මම ආවෙමියි ඔබ සිතන්නහුද? එසේ නො වේ, මා ආවේ භේද උපදවන පිණිස යයි මම නුඹලාට කියමි. මෙවක් පටන් එක ගෙදර සිටින පස් දෙනකුගෙන් දෙදෙනකුට විරුද්ධව තිදෙනෙක් ද තිදෙනකුට විරුද්ධව දෙදෙනෙක් ද භේද වන්නෝය. පියා පුතාටත්, පුතා පියාටත්, මව දුවටත් දුව මවටත්, නැන්දම්මා ලේලිටත්, ලේලි නැන්දම්මාටත් විරුද්ධව භේද වන්නෝය." (ලූක් 12:49-53)** මෙහි අරුත කුමක් ද? යමෙක් විශ්වයීය ප්‍රේමයෙන් ක්‍රියා කරන්නට තීරණය කළ විට ප්‍රේමයේ ඊට අඩු මට්ටම් තුළ, මට්ටම් අතර (පිතෘ ප්‍රේමය, මාතෘ ප්‍රේමය, දාරක ප්‍රේමය, පති-පතිනි ප්‍රේමය, දේශ ප්‍රේමය) ගැටුම් ඇති වේ. එය වැළැක්විය නොහැකිය. මුළු පොළෝතලය පුරා ඒ මොහොත උදා වෙනවාට ජේසුස් සමිඳාණෝ පිපාස වෙති.

මාංශගත වීම තුළින් මුළු මිනිස් සංහතිය ජේසු සමිඳුන් තුළ පුත්‍ර භාවයට කැඳවීම ලබා ඇත. මාංශගත වීමේ අභිරහස (දෙවියන් වහන්සේ මනුෂ්‍යයා වීම, මැවුම්කරු මැවිල්ලක් වීම) දෙවිඳුන් අදහන අනෙකුත් ආගම්වලට පවා පිළිගන්නට අපහසු වී ඇත. අසීමිත ප්‍රේමයට කළ නොහැකි දෙයක් නැත. එහෙත් අසීමිත ප්‍රේමයට සහභාගි නො වී මෙය පිළිගන්නට අපහසු යි. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් ජේසුස් නමින් මිනිස් බව ගෙන 'වඩුවාගේ පුතා' විය; වේදනා විඳින මිනිසා විය. එනිසයි, දෙවියන් වහන්සේ මිනිසකු වූ බව පිළිගන්නට ලෝකයට වඩාත් අපහසු වී ඇත්තේ. එතුමන් රජෙක් වැනි වරප්‍රසාද ලත් මිනිසෙක් වී නම් එය ද දෙවියන් වහන්සේ මිනිසා වීමකි. එය එසේ වූයේ නම් දෙවියන් වහන්සේ මිනිසා වූ බව ලෝකයට අපහසුවෙන් හෝ පිළිගන්නට හැකි වන්නට ඉඩ තිබිණි.

උන්වහන්සේ කිසි පාපයක් නොකළ එහෙත් මිනිස් වර්ගයාගේ පාපයේ විපාකය මුළුමනින් කරට ගත්, ඒ දුක් පාත්‍රය පානය කළ තැනැන් වහන්සේ වූ සේක. **(2 කොරින්ති 5:21)** උන්වහන්සේ විඩාවෙන්, මරණ වේදනාවෙන් මොරගසන තරම් අසරණ තත්ත්වය අත්දුටු තැනැන්වහන්සේ වූ සේක. **(හේබ්‍රෙව් 5:7)** උන්වහන්සේ කුරුසිය මත ශාපලත් තත්ත්වය අත්දුටු මිනිසා වූ සේක. **(ගලාති 3:13)** එය මාංශගත වීම වඩාත් ඉදිරියට ගෙන යාමකි. මා

විඳින දුක ඔබට තේරෙන්නේ නැහැ කියන්නට එතුමෝ කිසිවකුට ඉඩ නොතැබූහ. ඇයි, ජේසු සමිඳුන් මිනිස් වර්ගයා විඳින සියලු වේදනාවන් අත්දුටු මිනිසා වුයේ? මාංශගත වීම යනු දෙවි-මිනිස්කමේ විවාහයකි. මෙය මතුපිටින් සිදු වූ විවාහයක් නො ව සැබෑ විවාහයක් වන්නට දෙවිපියාණන්ට ඇවැසි විය. මතුපිටින් සිදු වූ විවාහය යනු වාසනාවන්ත කල්හි ද සුව සැපේ දී ද එකට විසීම යි; අවාසනාවන්ත කල්හී ද ලෙඩ දුකේ දී ද එකිනෙකා මගහැර සිටීම යි. අවාසනාවන්ත කල්හි ද ලෙඩ දුකේ දී ද දෙදෙනා එකිනෙකාට ප්‍රේම කරනවා නම් අනෙකාගේ සැම රෝගී තත්ත්වයට, සියලු වේදනාවන්ට සහභාගී වීමට සිදු වේ. එනිසයි, මිනිස් සංහතිය (මනාලිය) විඳින සියලු වේදනාවන් විඳින්නට ජේසු සමිඳුන්ට (මනාලයාට) සිදු වූයේ.

## මිනිස් සංහතියේ විමුක්තිය උදෙසා දේව ප්‍රේමයේ ගමන් මගෙහි මුදුන, දිව්‍ය සත්ප්‍රසාදය යි

දේව අයිතිවාසිකම් හිස් කරගෙන මිනිසෙක් ලෙස මෙ ලොවට වැඩිය ධර්මයාණන් වන ජේසු සමිඳාණන් සිය ජොර්දාන් බෞතිස්මයෙන් පසු ව කළ කී බොහෝ දේ සුවිශේෂ පොත්වල සටහන් ව ඇත. ජේසු සමිඳාණෝ තමා කරන කියන සියල්ල ම සක්‍රමේන්තුවක් (ශුද්ධවූ සංකේතයක්, දේව ප්‍රේමය මිනිසා වෙත ගෙන එන මෙවලමක්) කළ අයුරු එයින් ඔබට වටහාගත හැකිය. උන්වහන්සේ කරන කියන කිසිවක් සක්‍රමේන්තුවක් නො වන්නට ඉඩ නොතැබූහ. උන්වහන්සේ දෙවි පියාණන්ට ප්‍රේම කළහ; තමාට පීඩා කරන මිනිසාට පවා ප්‍රේම කළහ. එනිසා දේව අයිතිවාසිකම් හිස් කරගෙන පැමිණි තැනැන් වහන්සේගේ ජීවිත බඳුන බිඳෙන් බිඳ ප්‍රේමයෙන් හෙවත් දේවත්වයෙන් පිරිණ. උන්වහන්සේගේ මරණයට පෙර දින (මහා බ්‍රහස්පතින්දා) එතුමන්ගේ ජීවිත බඳුන මුවවිට දක්වා ම ප්‍රේමයෙන් පිරී තිබිණ. එම මොහොතේ දී ය, ජේසු සමිඳුන්ගේ මුවින් මෙම වදන් නික්මුණේ. **“මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේය.” (ජුවාම් 14:9)**

දේව අයිතිවාසිකම් සියල්ල හිස්කර මිනිසකු වූ, මිනිස් අයිතිවාසිකම් සියල්ල ද හිස් කර ජීවිත බඳුන අසීමිත ප්‍රේමයෙන් මුවවිටට ම පිරුණු මොහොතේ ජේසු සමිඳුන් තුළ ඇති වූ පිපාසය, කුසගින්න කුමක්ද? මිනිසා හා ඒකත්වයක් වන්නට හෙවත් මිනිසා හා තමා එක් අයකු වන්නටයි. එසේ වන්නට නම් මහෝත්තමයාණන් මිනිසාගේ ආහාරය වන්නට තීරණය කළ යුතුය. එතුමෝ එම තීරණය ගනිමින් එම සක්‍රමේන්තුව හෙවත් එම දේව ප්‍රසාද නිධානය ස්ථාපනය කළහ. එය යි, දිව්‍ය සත්ප්‍රසාදය. (Holy Eucharist) “ඔවුන් අනුභව කරමින් සිටිද්දී ජේසුස් වහන්සේ රොටි ගෙන, ආශිර්වාදය පවසා, ඒවා කඩා, ශ්‍රාවකයින්ට දී, ‘රැගෙන වළඳන්න, මේ මාගේ ශරීරය’ යි වදාළ සේක. උන්වහන්සේ කුසලාන ද ගෙන තුති පුදා, ඔවුන්ට දී, ‘ඔබ සියල්ලෝ මෙයින් පානය කරන්න. මෙය පව් කමාව පිණිස බොහෝ දෙනා උදෙසා වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය වේ.” (මතෙව් 26:26-28) මහා (බ්‍රහස්පතින්දා ජේසු සමිඳුන්ගේ උත්තම පූජක යාච්ඤාවේ දී, ජුවාම් 17) ‘ඒකත්වය’ යන වචනය පස් වතාවක් ම යොදාගෙන ඇත. කෙනකුගේ මමත්වය මුළුමනින් සුං වී, ජීවිත බඳුන මුවවිටට ම ප්‍රේමයෙන් පිරෙන මොහොතේ ඒකත්වයක් වීමේ පිපාසය නිරායාසයෙන් ම සිදු වේ.

ආහාරය පෝෂණයේ සංකේතයකි. ආහාරයක් ගැනීමේ දී සිදු වන ක්‍රියාවලිය කුමක්ද? ජීර්ණය, අවශෝෂණය හා ශක්තිය යි. (අවශෝෂණය යනු ජීර්ණ වූ ආහාරයේ රස කොටස් ලෙයට උරා ගැනීම යි.) දිව්‍ය සත්ප්‍රසාදය තුළින් ජේසු සමිඳුන් මගේ ආහාරය වීමේ දී ඒ කරුණු තුන ම මා තුළ සිදු වේ. (ජේසු සමිඳුන්ගේ මරණය, ජේසු සමිඳුන්ගේ උත්ථානය හා ශුද්ධාත්මයාණන් දානය කිරීම) එම ත්‍රිවිධ ක්‍රියාකාරීත්වයට සහභාගී වීමට එතුමෝ අපට ද ඇරැයුම් කරති. ඔබගේ ජීවිතයේ දැනට පවතින එක ඌණතාවයක් හෝ පෙන්වා දෙමින් එයට මැරෙන්නට ද ලෝකයේ ඇලී-ගැලී ජීවත් නො වී උත්ථාන වූවකු මෙන් හැසිරෙන්නට ද එතුමෝ ඇරැයුම් කරති. ඒ සඳහා ශුද්ධාත්මයාණන් දානය තුළින් ජීවය, ශක්තිය දානය කරති.

මහා බ්‍රහස්පතින්දා ජේසු සමිඳුන් කළ ක්‍රියාව (දිව්‍ය සත්ප්‍රසාදය) මහා සිකුරාදා (Good Friday) කුරුසිය මත බාහිර ව ප්‍රදර්ශනය වන්නට දෙවි පියාණෝ අභිමත වූහ.

(මහා සිකුරාදා සිදු වුයේ ප්‍රේමයෙන් මුවවිටට ම පිරී තිබුණ එතුමන්ගේ ජීවිත බඳුන පිටාරා ගලා යාමකි. ශුද්ධාත්ම දානය යනු එය යි. ශුද්ධාත්ම දානය පිළිබඳ ඇතුලාන්ත ප්‍රකාශනය කල්වාරි කුරුසිය මත ය.) මහා සිකුරාදා ජේසු සමිඳුන්ගේ ශරීරය මනුෂ්‍ය වර්ගයාගේ විමුක්තිය උදෙසා තැලෙන්නට, මැරෙන්නට, උන්වහන්සේගේ රුධිරය අන්තිම බිඳුව දක්වා වැගිරෙන්නට, එ ලෙස ජේසු සමිඳුන්ගේ ජීවිතය මිනිසා උදෙසා පූජාවක් වන්නට නියමිත විය. එ ලෙස මහා බ්‍රහාස්පතින්දා උන්වහන්සේ සිදුකළ ක්‍රියාවේ (දිව්‍ය සත්ප්‍රසාදය) බාහිර ප්‍රකාශනය මහා සිකුරාදා කුරුසිය මත සිදු විය. දේව අයිතිවාසිකම් හිස්කරගෙන මිනිසා වූ ජේසුස්, මනුෂ්‍ය අයිතිවාසිකම් හිස්කරගෙන කුරුසිය මත යාගික වූ ජේසුස්, මිනිස් බව ද මුවා කරගෙන මිනිසාගේ ආහාරයක් (දිව්‍ය සත්ප්‍රසාදය) වීම, ඒ සියල්ල සඳහා වූ මහා හිස් වීම මනුෂ්‍ය වර්ගයාට සදාකාලික අභියෝගයකි. ප්‍රේමයේ, එකමුතුකමේ පදනම හිස් වීම යි.

ක්‍රිස්තුස් වහන්සේ හා ගැඹුරු ම සබඳතාවයේ සුවිශේෂ මාර්ගය මහා බ්‍රහස්පතින්දා උන්වහන්සේ තම ශ්‍රාවකයින්ගෙන් වෙන් ව යන මොහොතේ ඔවුන්ට දානය කළ දිමනාව වන දිව්‍ය සත්ප්‍රසාදය යි. "**දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ යම් තැනක මාගේ නාමයෙන් රැස්ව සිටින්නේ ද එතැන ඔවුන් මැද මමත් වැඩසිටිමි." (මතෙව් 18:20)** උන්වහන්සේ ඔබ මධ්‍යයේ වැඩසිටීම, ඔබ සමග වැඩසිටීම, ඔබ තුළ වැඩසිටීම නො වෙයි, දෙවි-මිනිස් සබඳතාවයේ මුදුන. මාංශගත වීම තුළින් උන්වහන්සේ මනුෂ්‍යයා විය. එහෙත් උන්වහන්සේ හා මා දෙදෙනෙකි. උන්වහන්සේ මා විඳින සියලු වේදනා අත්දුටු මිනිසා විය. එහෙත් උන්වහන්සේ හා මා දෙදෙනෙකි. දිව්‍ය සත්ප්‍රසාදය තුළින් උන්වහන්සේ හා මා ඒකත්වයකි. ශුද්ධ වූ දෙවියන් වහන්සේ හා දුබල පාපි මා ඒකත්වයකි. මෙය මිනිස් සංහතිය උදෙසා වූ දේව ප්‍රේමයේ පරම මුදුන යි.

එනිසා දිව්‍ය සත්ප්‍රසාදය දෙවි-මිනිස් සබඳතාවයේ මුදුන යි. ජේසු සමිඳුන්ගේ දෙවි පියාණන් කෙරෙහි වූ ප්‍රේමයේ හා සහෝදර ප්‍රේමයේ ජීවමාන සංකේතය යි. උන්වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදයෙහි වැඩසිටීම තම දේවත්වයේ හා මනුෂ්‍යත්වයේ සම්මිශ්‍රනය යි. මෙලොව කිතුනු දිවියේ උපරිම ස්ථානය යි. දෙවිඳුන් හා එකාබද්ධ වීමේ මොහොත යි. අති විශිෂ්ඨ ආගමික අභ්‍යාසය යි. කිතුනු සහෝදරත්වයේ හා සාංඝිකත්වයේ උල්පත හා විකාශනාගාරය යි. එනිසා දිව්‍ය සත්ප්‍රසාදයේ දිව්‍ය භෝජනයට ගෞරවාන්විතව සහභාගි වෙමින් කෘතඥතාපූර්ණ හදවතකින් යුතුව මේ අපරිමිත ප්‍රේමයේ දිව්‍ය අභිරහස අබියස අපි තුෂ්ණිම්භූත විය යුතු වෙමු.

සමිඳුන් දිව්‍ය සත්ප්‍රසාදය දානය කළේ අපගේ දිව්‍ය භෝජනය වනු සඳහා ය. ඔබ රෝගියෙක් බව පිළිගෙන, දේව පුත්‍රයාණන් වන ජේසු සමිඳුන් ඔබගේ දිව්‍ය වෛද්‍යවරයාණන් බව පිළිගෙන, එතුමන්ගෙන් සුවය ලබන්නට අවංක සූදානමක් ඇතිව, ඔබ දිව්‍ය සත්ප්‍රසාදය ලබන්නේ නම් ඔබට යහපතක් ම සිදු වේ. 'මා අනුභව කර ඔබ වැඩෙන්නැ' යි දිව්‍ය සත්ප්‍රසාදය තුළින් ජේසු සමිඳාණෝ අපට ඇරැයුම් කරති. එපමණක්ද? 'ඔබ අනුභව කර වැඩෙන්නට අනෙක් අයට ඉඩ හරින්නැ' යි එතුමෝ පවසති. (එහි අරුත අනෙක් අය උසස් කරනු සඳහා ඔබ මුළුමනින් කැපවීම හා පූජා වීම යි.) ඔබ එතුමන් අනුභව කර වැඩෙමින් ඔබව අනුභව කර වැඩෙන්නට අනෙක් අයට ඉඩ හරින්නේ නම් එය යි, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ඔබ විසින් කළ හැකි ලොකු ම නමස්කාරය. දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම සඳහා සමගි වීමේ ප්‍රසාධ නිධානය වන පාපොච්චාරණය තුළින් සූදානම් වීම ඉතා වැදගත් ය.

දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳ කතෝලික සභාවේ පැහැදිලි ඉගැන්වීම නම් දිව්‍ය යාගික බොදුන් පිළිවෙත තුළ ක්‍රිස්තුස් වහන්සේ පූජක තුමා මගින් පූප හා මිදි යුෂ තම ශ්‍රී ශරීරයටත් තම ශ්‍රී රුධිරයටත් පරිවර්තනය කරන බව යි. පූප හා මිදි යුෂවල බාහිර ගුණ ලක්ෂණ එලෙස ම නොවෙනස්ව පවතින අතර ඒවායේ භාවාර්ථය මුළුමනින් ම ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හැරෙන බව යි. ආසිරි ගන්වනු ලැබූ පූපය තුළ ක්‍රිස්තුස් වහන්සේ මුළුමනින් ම වැඩසිටින බව යි. ශූන්‍යතාවයට පැවැත්ම දුන් දෙවියන් වහන්සේට, කිසිවකින් තොරව හුදෙක් තමන්වහන්සේගේ සර්වබලධාරී හස්තයෙන් ම මුළු මහත් විශ්වය මවාලූ දෙවි මහෝත්තමයාණන්ට, තම පූපය හා මිදි යුෂෙහි භාවාර්ථය තම පුත්‍රයාණන්ගේ ශරීරයට හා රුධිරයට හැරවීම කිසිසේත් අපහසු කාර්යයක් නො වේ.

කතෝලික සභාව සියවස් 20ක් පුරා නොයෙක් අභියෝග මධ්‍යයේ මෙම සත්‍ය විශ්වාසය රැකගැනීම අගය කළ යුතුය. ජේසු සමිඳුන්ගේ ඉදිරි සැලැස්ම වනුයේ කිතුනු නාමය දරන සියල්ලන් මෙම උතුම් විශ්වාසයට පැමිණවීම යි.

බොහෝ කිතුනු නිකායන් දිව්‍ය සත්ප්‍රසාදය මහ බ්‍රහස්පතින්දා ජේසු සමිඳුන් සිදුකළ දෙය සිහි කිරීමක් (ලූක් 22:19) හෝ ජනතා සහෝදරත්වය පිළිබඳ සංකේතයක් ලෙස පමණක් භාවිතා කරනු පෙනේ. මෙය ජේසු සමිඳුන් දානය කළ අති විශිෂ්ඨ දීමනාවේ නිසි පලය නොගැනීමකි. මෙහි අගය ජේසු සමිඳුන් සිදුකළ දෙය සිහි කිරීම පමණක් නම් ඒ පිළිබඳ සියල්ල එතුමන් විසින් මහා බ්‍රහස්පතින්දාට පමණක් සීමා කරනු ඇත. දිව්‍ය සත්ප්‍රසාදය සඳහා පෙර සූදානම, පොරොන්දු හා අභියෝග අවශ්‍ය නො වේ.

<u>ජුවාම් 6 වන පරිච්ඡේදය</u> දිව්‍ය සත්ප්‍රසාදය සඳහා පෙර සූදානම, පොරොන්දු සහ අභියෝග ඉදිරිපත් කරයි. එහි පළමුවෙන් පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යයකි. ඉන් පසු බොහෝ ජනතාවක් ජේසු සමිඳුන් සොයා පැමිණෙති. ''නැති වී යන ආහාරය සඳහා නො ව සදාතන ජීවනයට ඉවහල් වන ආහාරය සඳහා වීර්යය කරන්න. මේ ආහාරය ඔබට ප්‍රදානය කරන්නෝ මනුෂ්‍ය පුත්‍රයාණෝ ය. - - - දෙවියන් වහන්සේගේ ආහාරය වනාහි ස්වර්ගයෙන් පහළ වී ලෝකයට ජීවනය දෙන ආහාරය'' යි. ජේසු සමිඳාණෝ එසේ වදාළහ. ''ස්වාමිනි, ඒ ආහාරය නිතර ම අපට දුන මැනව'' යි ජනතාව ආයාචනය කළහ. එවිට ජේසු සමිඳාණෝ, ''ස්වර්ගයෙන් පහළ වූ ජීවනදායක භෝජනය මම වෙමි. යමෙක් මේ භෝජනයෙන් වැළඳුවොත් ඔහු සදාකල් ජීවත් වන්නේය. මා විසින් දෙනු ලබන ඒ භෝජනය මාගේ මාංශය වේ. මා එය දෙන්නේ ලෝකයාගේ ජීවනය පිණිස ය'' යි වදාළ සේක. ඒ පොරොන්දුව හා අභියෝගය ඉදිරියේ ජනතාව මැසිවිලි කියමින් ඉවත් වූහ. ශ්‍රාවකයින් දොළොස් දෙනා පමණයි, එහි නැවති සිටියේ. ඔවුන්ගෙන් සමහරුන්ටත් ඒ පිළිබඳ ගැටළු ඇති බව පෙනිණ. ''ඔබත් ඉවත්ව යන්නට සිතන්නහුදැ'' යි ජේසු සමිඳාණෝ විමසූහ. ''ස්වාමිනි, අප කවරකු වෙත යන්නද? සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ තුළ පමණි'' යි පේදුරු තුමා පිළිතුරු දුන්නේය.

දිව්‍ය සත්ප්‍රසාදය මගින් ජේසු සමිඳුන් අනුභව කර වැඩෙමින් තමා අනුභව කර වැඩෙන්නට අන් අයට ඉඩ දෙන ජිවිත ක්‍රමයක් තුළින් පමණි, ආධ්‍යාත්මික යෝධයින් බිහි වනුයේ. දිව්‍ය සත්ප්‍රසාදයේ ජේසු සමිඳුන්ගේ ජීවමාන වැඩසිටීම විශ්වාස නොකරන අයට කළ හැක්කේ ආධ්‍යාත්මික ළදරුවන් බිහිකිරීම පමණි. භාග්‍ය අට ක්‍රිස්තු වටිනාකම්වල හරය යි. භාග්‍ය අටට මුළුමනින් අඹෙන්නට නම් අනෙකාගේ ආහාරය විය යුතු ම ය. ඒ සඳහා ඔබට පන්නරය ලැබෙන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගෙනි. **තෝමස් ඒ. කෙම්පිස්** තුමා අප සමිඳුන්ගේ ශුද්ධවූ දෙතොල මත මෙ වචන තබයි. ''ඔබ ඔබව සම්පූර්ණයෙන් මට දීම මිස අන් කුමක් ද, මා ඔබගෙන් ඉල්ලන්නේ? ඔබෙන් තොරව ඔබ මට දෙන අන් කොයි දේත් මට නිෂ්පල යි. මා සොයනුයේ ඔබේ තෑග්ග නො ව ඔබවයි. ඔබට අන් සියල්ලක් ම සතු වුවත් මා නැත්නම් ඔබ සෑහීමට පත් නො වන්නාක් මෙන් ම ඔබ ඔබව ම මට දෙන තෙක් ඔබ මට දෙන කිසිවකින් මම සෑහීමට පත් නො වෙමි. බලන්න, මා සපුරා ඔබේ ම වන්නට ද ඔබ සපුරා මගේ ම වන්නට ද මම මගේ ස්වීයත්වය ම ඔබ වෙනුවෙන් පියාණන් වහන්සේට පූජා කළෙමි. මගේ ශරීරය හා රුධිරය ඔබේ ආහාරයට මම දුනිමි.''

''එනිසා ස්වකීය බර ස්වාමින් වහන්සේ මත තබා උන්වහන්සේගේ බර තමන් මත පවරා ගත් සේවකයින් උදෙසා උන්වහන්සේ බලා සිටින සේක. දෙවියන් වහන්සේගේ දැඩි ප්‍රේමයෙන් දැවෙන්නට මෙන් ම උන්වහන්සේගේ සියලු කැඩීම්වලින් ඇඹෙන්නට ඉඩ දෙන අය එන තුරු උන්වහන්සේ බලා සිටින සේක. පියාණන් වහන්සේගේ හෘදයෙහි ප්‍රීතිය වනුයේ ජේසු සමිඳුන් මෙන් මරණය දක්වා ම පොඩි කරනු ලබන්නට කැමති වූ කෙනකු සොයා ගැනීම ය. එවිට ඒ පොඩි කරනු ලැබූ තැනැත්තා තුළින් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවනය ගලා නික්මේ. ජේසු සමිඳුන් මෙලොව ජීවත් වූ අයුරින් ජීවත් වීම පිණිස අප පුහුණු කිරීම දෙවියන් වහන්සේගේ කැමැත්ත ය. තම ආශාවන්හි ඉලක්කය ක්‍රිස්තුස් වහන්සේ ම වන පරිදි ස්වකීය මානුෂික ආශාවන් තුළින් ඇණ යවන තුරුත්, මමත්වය කුරුසියේ ඇණගසනු ලබන තුරුත්, ඉන් පසු

නැවත නැගිටුවනු ලැබ උන්වහන්සේ වෙනුවෙන් වැගිරවීම පිණිස දැඩි ප්‍රේමයකින් වෙළෙන තුරුත්, කිසිවකුට අපගේ ස්වාමි වූ ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණ ලෙස කැප වූ අතිශයින් කීකරු ගෝලයකු විය නොහැක.''මෙවැනි අරමුණක් උදෙසා සියල්ලන්ගේ ආහාරය වනු සඳහා මෙම යාච්ඤා 4 තුළින් සමිඳුන්ට මුළුමනින් ම ඉඩ දෙන්න.

''ආත්මික උදෙහ්ගිමත් මනුෂ්‍යයා එක පරමාර්ථයක මනුෂ්‍යයෙකි. ඔහුගේ ආශාව එක් දෙයක් ගැන පමණි. ඒ එක් දෙය දෙවියන් වහන්සේ සතුටු කිරීම යි, එතුමන්ට ප්‍රේම කිරීම යි, එතුමන් මහිමයට පැමිණවීම යි. ඔහු ජිවත් වෙතත් මියැදුනත්, ඔහු නිරෝගිව සිටියත් රෝගි වුවත්, ඔහු ධනවත් වුවත් දුගී වුවත්, මිනිසුන්ට ඔහු ප්‍රිය වෙතත් අප්‍රිය වෙතත්, ඔහු ව නැණවතකු ලෙස හෝ මෝඩයකු ලෙස සලකතත්, බුහුමන් ලැබුවත් අවමන් ලැබුවත් ඔහු ඒ කිසිවක් නොසලකයි. ඔහු තුළ ගින්නක් ඇවිලෙයි. ඒ ගින්න දෙවියන් වහන්සේ සතුටු කිරීමයි. එතුමන්ට ප්‍රේම කිරීම යි. ඒ ගින්නෙන් ඔහුගේ ජීවිතය දැවී අළු වී ගියත් එය ඔහුට සතුටකි. පහනක් මෙන් තමා සාදනු ලැබ ඇත්තේ ඇවිලීමට පමණක් බව ඔහු දන්නා බැවිනි.'' (ගරු රයිල් බිෂොප් තුමා)

''දෙවි පියාණෙනි, සියළුම ආශා මිට මොලවා ගෙන සිටින මගේ අත දිගහැරෙනු පිණිස මා දුර්වල කළ මැනව. මාගේ ජීවිතයත්, මා ගැන පැතුරුණු කීර්තියත්, මගේ වස්තු සම්භාරයත් තරකොට අල්ලා ගෙන සිටින මගේ තෘෂ්ණාවේ අත බුරුල් කළ මැනව. ඒවා අල්ලා සිටීම පමණක් නො ව විටින් විට ඒවා අතගා බැලීමේ ආශාව ද ඉවත් කළ මැනව. තදින් අල්ලා සිටි යමක් අත්හළ පසු වුව ද දැඩි ආශාවෙන් යුතුව යළි අතගා බැලූ අවස්ථා කොපමණ වේ ද? පියාණෙනි, ක්‍රිස්තුස් වහන්සේගේ අත කල්වාරි කුරුසිය මත දිග හැරුණාක් මෙන් සියල්ලෙන් නිදහස් වන පිණිස මගේ අතත් කුරුස ඇණයට දිගහල මැනව. එසේ මා බැඳී සිටින බැම්මවලින් මා මුදනු ලැබේවා! දෙවියන් වහන්සේ හා සමානව සිටීම තමන් විසින් අල්ලාගෙන ම සිටිය යුතු වස්තුවකැයි නොසිතා ක්‍රිස්තුස් වහන්සේ එය අත්හල සේක. එබැවින් මා ග්‍රහණය කර සිටින සියල්ල ද පහකළ මැනව.'' (ගරු පීම් එලියට් දේවගැති තුමා)

''ජේසුනි, මට බැහැපත්කම උගන්වන්න. මා තුළ ඇති අහංකාරකම නැති කරනු සඳහා ඔබට අවශ්‍යයි හැඟෙන ඕනෑ ම දෙයක් කරන්න. මගේ අහංකාරකම මට පෙන්වන්න. එය දැකීම මට වේදනාවක් වුවත් එය දැකීමේ වරප්‍රසාදය මට දෙන්න. මගේ අහංකාරකම මට පෙන්වනු සඳහා ඔබට අවැසි ඕනෑ ම කෙනකු උපකරණ කරගන්න. මා බැහැපත් කරනු සඳහා නින්දා අපහාසවලට හෝ මුහුණ දෙන්නට මට සලස්වන්න. එය කොතෙක් වේදනාත්මක වුවත් කම් නැත. මන්ද, මට අවශ්‍ය ඔබගේ ස්වරූපය වීම යි. මට අවශ්‍ය කුඩා වීමෙන් වර්ධනය වීම යි. එවිට මට මා තුළ අඩු වන්නට ඔබට මා තුළ වැඩි වන්නට පුළුවන.'' ('කිතු දන පුබුදුව' අමතා ශ්‍රි ලංකාවේ දි ගරු ටොම් ෆොරස්ට් පිය තුමා පැවැත් වූ දේශනයක දි එතුමාගෙන් නික්මුණ යැදුමක්)

''මෘදු වූ, යටහත් වූ, බැහැපත්කමේ මූර්තිය වූ, කුරුසියේ මරණය දක්වා කීකරු වූ ජේසුනි, අන්‍යයන්ගේ ආදරය ලබා ගැනීමට ඇති ආශාවෙන්, අන්‍යයන්ගේ ප්‍රශංසාව ලබා ගැනීමට ඇති ආශාවෙන්, අන්‍යයන්ගේ ගෞරවය ලබා ගැනීමට ඇති ආශාවෙන්, අන්‍යයන්ට වඩා සැලකිළි ලැබීමට ඇති ආශාවෙන්, අන්‍යයන් මගෙන් කරුණු විමසිය යුතුය යන ආශාවෙන් මා නිදහස් කළ මැනව. අන්‍යයන්ගෙන් අවමන් විඳීමට ඇති බියෙන්, අන්‍යයන්ගේ උපහාසයට ලක් වීමට ඇති බියෙන්, අන්‍යයන්ගේ චෝදනාවන්ට ලක් වීමට ඇති බියෙන්, අන්‍යයන්ගේ සිනාවට ලක් වේය යන බියෙන්, අන්‍යයන් විසින් මා අමතක කරාවි යන බියෙන්, අන්‍යයන් විසින් මා සැක කරාවි යන බියෙන් මා මුදාලන්න. එමෙන්ම ජේසුස් වහන්ස, මට වඩා අන් අය ආදරය ලබනවා දකින්නට, මට වඩා අන් අය ගරු බුහුමන් ලබනවා දකින්නට, බහුජන මතය අනුව අනෙක් අය දියුණු වන අතර මා පහත් වෙනවා දැකීමට, මා කොන්කර අන් අය තෝරනු ලබනවා දැකීමට, අන් අය පැසසුම් ලබා මා ගණන් නොගෙන සිටිනවා දැකීමට, සැම දෙයකින් ම මට වඩා අන් අය සලකනවා දැකීමට, මට වඩා අන් අය ශුද්ධවන්ත ජීවිතයක් ගතකරනවා දැකීමට සලස්වන්න.'' (කතෝලික ශුද්ධවන්තයකුගේ යැදුමක්)

**3**

# යාගික පිළිවෙත තුළින් දිව්‍ය සත්ප්‍රසාදය අප වෙත ලබා දෙන දිව්‍ය පූජාව

ඕනෑ ම ආගමක් අදහන හෝ කිසි ම ආගමක් නොඅදහන සියල්ලන් කතෝලික දෙව් මැදුරක පැවැත්වෙන විවාහ දිව්‍ය පූජාවකට එක් වරක් හෝ සහභාගි වී තිබෙන්නට පුළුවන. එහි දී දිව්‍ය පූපය දකින විට මැවුම්කරුවාණන් වහන්සේ මිනිසාට ඇති අපරිමිත ප්‍රේමය නිසා උන්වහන්සේ මිනිසාගේ ආහාරය වූ බව වැටහුණොත්, පිය තුමා පූපය කඩන විට ඔබ ද මමත්වයට කැඩෙන්නට අවශ්‍ය බව වැටහුණොත්, පිය තුමා පූපය බෙදන විට ඔබගේ ජීවිතය ද එකිනෙකාගේ හිත සුව පිණිස බෙදී යා යුතු බව වැටහුණොත් එය ද විමුක්තිය පිළිබඳ මහා පණිවුඩයකි.

දිව්‍ය පූජාව වචනයේ උත්සවය යි. එය පියවර තුනකින් මෙ ලෙස විස්තර කළ හැකිය. 1. දෙවියන් වහන්සේගේ වචනය කියවා කඩා බෙදා ආහාර කර දීම 2. දෙවියන් වහන්සේගේ වචනයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කඩා බෙදා ආහාර කර දීම 3. වචනයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ ප්‍රථම ත්‍යාගය වන ශුද්ධාත්මයාණන් අප වෙත දානය කරමින් එදින මෙනෙහි කළ දේව වචනය අප තුළ ආත්මගත කරගෙන එය පල දරන්නට අත දීම. (එය සිදු වන්නේ දිව්‍ය පූජාවට සම්පූර්ණයෙන් සහභාගි වෙමින් ජේසු සමිඳුන් තුළින් එය අර්ථවත් කරගන්නා තරමට යි.)

දිව්‍ය පූජාව වචනයේ උත්සවය නිසා එහි පළමු වන පියවර නිසි පරිදි සිදු වන්නට නම් බෙදා ගන්නා දේව වචනය දිව්‍ය පූජාවට සහභාගි වන සියල්ලන්ට ඉතා පැහැදිළිව ඇසෙන්නට සැලැස්විය යුතුය. එදිනට නියමිත පූජා කියවීම්, තෝරාගත යුතුය. පූජා කියවීම් සියල්ල ම එකක් හෝ අඩු නොකර ගීතාවලිය කොටස පවා ඉදිරිපත් කළ යුතුය. ඉන්පසු ඒ වචනය කඩා බෙදා ආහාර කර දිය යුතුය. හෙවත් පූජා කියවීම් සියල්ල ම කැටිකර කෙටි අර්ථවත් දේශනයක් දිය යුතුය. සභාවේ වසර ඇරඹෙන්නේ ආගමන කාලයේ පළමු වන ඉරිදාවෙනි. ඉරිදා පූජා කියවීම් පළමු වන වසර, දෙවන වසර, තුන් වන වසර වශයෙන් ද දිනපතා පූජා කියවීම් පළමු වන වසර, දෙවන වසර වශයෙන් ද සැලසුම් කර ඇත. ඉරු දින තුන් වන වසර අවසන් වූ විට නැවත පළමු වන වසරට පිවිසේ. දිනපතා පූජා කියවීම් දෙවන වසර අවසන් වූ පසු පළමු වසරට පිවිසේ. මෙම දිව්‍ය පූජා කියවීම් තුළ ශුද්ධ බයිබලයේ මුළු හරය ම අන්තර්ගත කර ඇත.

දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමය කිසි ම මනුෂ්‍ය මනසකට මුළුමනින් එකවර ගෝචර කරගත නොහැකිය. එනිසා සභා මාතාව ශුද්ධාත්මානුභාවය තුළින් දිව්‍ය පූජා කියවීම් ගොනු කරමින් තම දරුවන් කෙරෙහි අනගි දිව්‍ය පූජා කියවීම් සැලැස්මක් ඉදිරිපත් කරන්නීය. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමයේ එක සුලක්ෂණයක් හෝ දෙවියන් වහන්සේගේ ප්‍රේමයට අපගේ ප්‍රති ප්‍රේමය දීම පිළිබඳ එක සුලක්ෂණයක් හෝ තෝරාගෙන සභා මාතාව සෑම දින, සෑම දිව්‍ය පූජාවකදීම එය උත්සවාකාරයෙන් පවත්වන්නීය. යම් ඉරු දිනක දිව්‍ය පූජාව උත්සවාකාරයෙන් පවත්වන්නේ දෙවියන් වහන්සේගේ සමාව දීමේ ප්‍රේමය ගැන යැයි අපි සිතමු. එවිට පළමු වන කියවීම වශයෙන් තෝරාගෙන ඇත්තේ දෙවියන් වහන්සේගේ සමාව දීමේ ප්‍රේමය පිළිබඳ ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ (දේව අනාවරණයේ ප්‍රාථමික අවස්ථාවේ) කොටසකි. තුන් වන කියවීම සුවිශේෂ පොත් ඇසුරෙනි. එය සමාව දීමේ ප්‍රේමය ක්‍රිස්තුස් වහන්සේ පරිපූර්ණත්වයට පත්කළ අවස්ථාව යි. දෙවන කියවීමට අඩංගු වන්නේ පළමු හා තෙවන කියවීම් අත්දුටු මුල් සභාවේ ජීවිත සාක්ෂිය යි. (දිනපතා පූජා කියවීම්වල මෙම රටාවේ වෙනසක් දැකිය හැක්කේ ජේසු සමිඳුන්ගේ උත්ථානයේ මංගල්ලයේ සිට ශුද්ධාත්ම මංගල්ලය දක්වා පමණි.)

බොහෝ දෙනා ක්‍රිස්තුස් වහන්සේගේ ජීවමාන බව අත්දකින ජීවිත මාරුවකට පිවිසෙන්නේ මනස්ස්ථාපන මෙහෙය, කැපවීමේ මෙහෙය හා ශුද්ධාත්ම මෙහෙය තුළිනි. එම අවස්ථා තුන ම දිව්‍ය පූජාවක අන්තර්ගත වේ. දිව්‍ය පූජාවට මුල පිරෙන්නේ මනස්ස්ථාපන මෙහෙය තුළිනි. පඬුරු (පූපය හා මිදිරස) පිදීමට සූදානම් වන මොහොතේ සිට දිවරහස්

කිරීම තුළින් ජේසුගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හැරෙමින් ජේසු සමිඳුන්ගේ සුරතින් දෙව් පියාණන්ට ඔප්පු කරන මොහොත දක්වා කැපවීමේ මෙහෙයයි. එය නිමාවට පත්වන්නේ මහා ආමෙන් කීමෙනි. පඬුරු පිදිමට සූදානම් වන විට ඔබ ද ඔබගේ ජීවිතය ඔබගේ සියල්ලන් හා සියල්ල, රටේ ලෝකයේ ගැටළු වේදනා ඒ සමග එක්කර පුදන්න. එවිට ඒ සියල්ල ජේසු සමිඳුන් සුරතින් දෙව් පියාණන් වෙත එසවෙනු ඇත. දිව්‍ය සත්ප්‍රසාදය තුළින් ජේසු සමිඳාණෝ ශුද්ධාත්මයාණන් දානය කරති. එය ශුද්ධාත්ම මෙහෙය යි. මනස්ස්ථාපන මෙහෙය තුළින් ජේසු සමිඳුන්ගේ ගැළවීමදායක ශ්‍රී රුධිරයට සම්බන්ධ වී කැපවීමේ මෙහෙය තුළින් ඔබගේ ජීවිතය දෙව් පියාණන්ට ඔප්පු කළ විට දෙවියන් වහන්සේට 'පියාණෙනි' යනුවෙන් අමතන්නට ඔබ සුදුසු වනු ඇත.

දිව්‍ය පූජාව අතීත සිද්ධියක් (ජේසු සමිඳුන්ගේ කල්වාරියේ උත්තම පූජක දිවි පිදීම) නැවත සිහි කිරීමක් පමණක් නො වේ. ''මාගේ රුධිර කුසලාන උතුරා යන්නේය'' යි ජේසු සමිඳාණෝ අද ද ලොව සිසාරා මොරගසති. මිනිස් සංහතියේ වේදනා තුළ ජේසු සමිඳාණෝ වේදනා විඳිති. එනිසා ජේසු සමිඳාණෝ සදාතනික ව කුරුසිය දරති. දිව්‍ය පූජාව තුළින් අපි ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රී රුධිරයේ පිං කුසල්වලට සහභාගි වෙමු.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් මහා බ්‍රහස්පතින්දා අන්තිම රාත්‍රි භෝජනය මගින් ද, මහ සිකුරාදා කුරුසිය මත තම දිවි පිදීම මගින් ද මිනිසාට අත්පත් කර දුන් ඒ මහා දීමනාවන් යළි පූජාසනය මත අලුත් වෙමින් ඔප්පු වන දිව්‍ය පූජා යාගය විකෘති කිරීමක් සිදු වන දිනයක් උදා කරන්නට නපුරා බලවත් වෙහෙසක් දරයි. දෙව් පියාණන්ගේ අභිමතය පරිදි මිනිස් සංහතියේ විමුක්තිය උදෙසා වූ තම පුතණුවන්ගේ ජීවිත යාගය හා බැඳුන යාගික වත්පිළිවෙත ලොව පුරා සිදු වන දිව්‍ය පූජාව මගින් සැම මොහොතක් පාසාම දෙව් පියාණන් අබියස රාව ප්‍රතිරාව නංවනු පෙනේ. දේව ජනතාව ඒ පිං කුසල්වලට සහභාගි වෙති. ස්වර්ගයේ නිරන්තර උත්සවය ද '**මරනු ලැබූ බැටළු පැටවාණන්ගේ උත්සවය යි**.' එම යාගික වත්පිළිවෙත මගින් දෙව් පියාණන්ගේ දයානුකම්පාව මුළු මැවීම වෙතට ගලා එයි. එනිසා දෙව් පියාණන්ට ප්‍රසන්න යාගික වත්පිළිවෙත් කොටස දිව්‍ය පූජාවෙන් ඉවත් කර දිව්‍ය සත්ප්‍රසාදය හුදු භෝජනය බෙදා ගැනීමේ තත්ත්වයකට පත්කරන්නට නිසැකව ම නපුරා මහත් සේ වෙහෙසෙයි. <u>සුළු කලකට හෝ කරළියට පැමිණෙන නපුරා එවැන්නක් සඳහා ක්‍රියා කරනු ඇද්දැ යි දේව ජනතාව අවදියෙන් සිටිය යුත්තාහ.</u> යාගික පිළිවෙත මගින් සිදු වන දෙව් පියාණන්ගේ කරුණාව මුළු මැවීම වෙත ගලා ඒම නැවතුනහොත් අද ලොව සිදුවන පාපය දෙස බලන විට උන්වහන්සේගේ උදහස කඩාබිඳගෙන ඇතුළු වීම වැළැක්විය නොහැකිය.

## ඔමෙගා මුදුන (Omega Point - පරිනාමයේ අවසාන උච්ච අවස්ථාව)

නූතන යුගයේ ප්‍රධාන ලක්ෂණය නම් මනුෂ්‍ය සදාචාරයේ පිරිහීම ඉතාමත් උච්චාවස්ථාවට පැමිණ තිබීම යි. මෙය කලියුගයකි යි සමහරුන් කියන්නේ එබැවිනි. මේ යුගයේ පහළ වී ඇති සදාචාර පරිහානිය කෙබඳු දැ යි කිවහොත් එය මීට වඩා පිරිහෙන්නට ඉඩක් නැත. ෂාර්ඩෑන් පිය තුමා මනුෂ්‍ය වර්ගයාගේ මානසික ස්තරය ඉතා තියුණු අන්දමින් ඉහළ ස්තරයකට මාරුවීමට නියමිත බව සඳහන් කර ඇත. මෙම අධි මානසික, අධි ආධ්‍යාත්මික විපර්යාසය සිදු වීම සඳහා ව්‍යසනය හා මරණයට මුහුණ දී සිටින සමාජ පසුබිමක් අත්‍යවශ්‍ය බැව් පෙනේ. ධර්ම ප්‍රතිෂ්ඨාපනය (ධර්මය නැවත පිහිටුවීම) සිදු වන්නේ එවැනි පසුබිමක් තුළ ය. ''**පාපය අධික වන විට දෙවියන් වහන්සේගේ අනුග්‍රහය ඊට ද වඩා අධික වන මොහොත පැමිණ ඇතැ**'' යි ශුද්ධවර පාවුලු තුමා සඳහන් කරන්නේ එබැවිනි. (ශුද්ධ බයිබලය - රෝම 5:20) සමිඳාණෝ නපුරා වසර දහසකට බැඳ දමන්නට ධර්මිෂ්ඨ දහස් වසරක් උදා කරන්නට පොරොන්දු වෙති. ''දෙවියන් වහන්සේ අල්ෆා ද ඔමෙගා ද වන සේක.'' (ශුද්ධ බයිබලය - එළිදරව් 1:8) එහි අරුත දෙවියන් වහන්සේ ආරම්භය ද පරම අවසානය ද වෙති. දැන් මැවීම ඔමෙගා මුදුනට පිවිසීමේ මොහොත පැමිණෙමින් ඇත. විශ්වයේ සියලු විඳවීම් හා දෙදරීම් ඒ මහා උපත සඳහා ප්‍රසව වේදනාවකි.

''..... පරිනාම විද්‍යාව හා දර්ශනය අනුව ඔමෙගා අවස්ථාවක් ඇති බවට නිගමනය කිරීමට පුළුවන..... මෙයට කිතුනු විශ්වාසයේ ආලෝකය යොමු කළ විට එය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ස්වරූපය ආකෘතිය හා මුහුණත ගනී. දෙවියන් වහන්සේගෙන් ආරම්භ වූ විශ්වය (Cosmos) එය සමග මාංශගත වූ දෙවි-මිනිස් ජේසුස් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පැමිණ නැවත පෙරලා උන්වහන්සේ වෙතට ම පැමිණෙනු ඇත. විශ්වයේ ම අංශුවකට සම කළ හැකි තරමට ම දෙවියන් වහන්සේ ඒ තුළට බැසීමෙන් උන්වහන්සේ එම ලෝකය ඒකත්වයට හා පූර්ණත්වයට පමුණු වන සේක.''

''දෙවියන් වහන්සේ මෙ ලෙස ලෝකයේ හදවත සහ උච්චස්ථානයේ වැඩසිට, පරිනාමය ලෙස අප හඳුන්වන මිනිසාගේ ඉහළ සහ ඉදිරි ගමන සියතට ගෙන පාලනය කරන සේක. සියලුම කේන්ද්‍රයන් එකට එක් වී අභිචලිත වී පූර්ණත්වයට පත්කරන්නා වූ අග්‍ර කේන්ද්‍රය එනම්, පරිනාම ක්‍රියාවලියේ අක්ෂයත්, ලෝකාන්තර ලෝකෝත්තර ධ්‍රැවය හෙවත් අවසාන අවස්ථාව වන ඔමෙගා අවස්ථාව යන දෙක ම ක්‍රිස්තුස් වහන්සේ වන සේක. එහෙයින් සියලුම කේන්ද්‍රයන් අභිචලිත වී පූර්ණත්වයට පත්කරන අග්‍ර කේන්ද්‍රය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය. මෙම අග්‍ර කේන්ද්‍රය අන් සැම කේන්ද්‍රයක් ම පණ ගන්වන ප්‍රේම ජනක සම්බන්ධතාවයක් වෙත ඇදගන්නා වූ අගපේ නමැති මහා ආදර කේන්ද්‍රය යි. දැනටමත් සක්‍රියව පවත්නා වූ මෙම ප්‍රේම කේන්ද්‍රය චින්තන ගෝලය එකමුතු කිරීමෙන්, දියුණු කිරීමෙන්, යහපත් කිරීමෙන් එහි අවසාන පරිසමාප්තිය සහ පූර්ණත්වය වෙත යොමු කරමින් සිටී.''

''මෙය ෂාර්ඩැන් පිය තුමා මෙසේ විස්තර කරයි. ''එකමුතුකමට හා අති උදාර බවට පත්කිරීමේ නිරන්තර ක්‍රියාවන් මගින් උන්වහන්සේ පෘථිවිය පූර්ණ චෛතසික භාවය උන්වහන්සේ වෙත රැස්කර ගන්නා සේක. මෙසේ සියලු දේ එකට එක්රැස් කර සියලු දේ පූර්ණකර උන්වහන්සේගේ සිය ජයග්‍රහණය තමන් වහන්සේ ම අයිතිකර ගන්නා සේක. එවිට අවසාන වශයෙන් උන්වහන්සේ කිසි දිනක අත්නොහැරිය තමන් වහන්සේගේ දිව්‍යමය මධ්‍යස්ථානයට නැවත පෙරලා පැමිණෙන සේක. මේ අනුව ශුද්ධවර පාවුලු තුමා පවසන පරිදි දෙවියන් වහන්සේ සියල්ල කෙරෙහි සියල්ල වන සේක.''

''පුද්ගලයාගේ මට්ටමෙන් සිදු වූ ක්‍රියාවලිය දැන් සමාජ මට්ටමින් පෘථිවිතලය වසාගෙන ඇත්තා වූ මානව චින්තන පටලය තුළ සිදු වෙමින් පවතී. මෙය මිනිස් සංහතියේ පොදු සාමුහික සවිඥාන මට්ටම ඉහළ නැංවීමකි..... මෙය වනාහි පෘථිවි මට්ටමින් පූර්ණ සාමුහික පෞරුෂත්වයක් කරා ගෙන යන මානව ඒකරාශි කිරීමේ ක්‍රියාවලියක් හැටියට පෙනේ. ෂාර්ඩැන් පිය තුමා විසින් Omega Point හැටියට මෙය හඳුන්වනු ලැබේ. .... මින් අදහස් වන්නේ මුළු පෘථිවිය ම චින්තන පටලයකින් ආවරණය වෙමින් පවත්නා වූ විවිධ පුද්ගල සිතුම්-පැතුම් ඒකරාශි වී අන්‍යෝන්‍ය ශක්තිමත් කිරීමක් මගින් එකිනෙකා තහවුරු කරමින් එක ම සුවිශාල චින්තනයක් බවට පත්වීම යි. මෙම පෘථිවිය මත මානව කරණය වඩවඩා එකමුතු කරන ක්‍රියාවලියක් ඔස්සේ නිශ්චිත කේන්ද්‍රයක් කරා ගමන් කරයි. මෙම කේන්ද්‍රය එම ක්‍රියාවලියේ අවසාන උච්ච අවස්ථාව යි. .... පෙර දී පැවති වෙන් වෙන් වශයෙන් එකිනෙකාට වෙනස් ප්‍රතිවිරුද්ධ ඒකකයන් හා බලයන් පසුකලක දී ඉහළ මට්ටමකින් ඒකේන්ද්‍රාභිමුඛ වේ.''

''...... අනාගත විශ්ව සවිඥානය අන් කිසිවක් නො ව අධි පෞද්ගලික විඥානයේ ආධ්‍යාත්මික ඒකරාශි වීමකි. මෙය ඔමෙගා අවස්ථාව යි. ..... ආගම් හෝ ජාතීන් වශයෙන් පුද්ගලයන් හා කංඩායම් තුළ ඇතිවන්නා වූ සිය පුද්ගලිකත්වය හා අනන්‍යතාවය එකමුතුවීමේ ක්‍රියාවලිය කරණකොට ගෙන නැති වේ යැයි ඇති වන බියෙන් එයට විරෝධය පෑ හැකි බව ෂාර්ඩැන් පිය තුමා පෙන්වා දෙයි. ..... මෙම බන්ධ වීම්වලට මූලික හේතුව වනුයේ මෙම කංඩායම් තුළ සිය අනන්‍යතාවය නැති වී යන බවට පවතින හිතිය යි. මානව වර්ගයාගේ විමුක්තියත් පූර්ණත්වයත් නියත වශයෙන්ම රඳා පවතින්නේ වැඩි වැඩියෙන් එකමුතුවීමත් සංස්ලේෂණය වීමත් මත ය. කෙසේ වෙතත් මෙසේ එකමුතු විය යුත්තේ මිනිසාට ඔබින මානව පිළිවෙලකිනි. එනම් බාහිර වශයෙන් නො ව අභ්‍යාන්තරයෙන් ද ද්‍රව්‍යමය වශයෙන් නො ව ආධ්‍යාත්මික වශයෙන් ද බලහත්කාරයෙන් නො ව නිදහස් කැමැත්තෙන් ද විය යුතු වේ.

(ඔමෙගා මුදුන (Omega Point) ගැන ලිවීමේ දී එහි සියලුම උපුටා ගැනීම් ගරු ටෙයියාඩ් ඩෙ ෂාර්ඩෑන් පියතුමාගේ 'Phenomenan of Man' (මානව සංසිද්ධිය) පොත ඇසුරෙන් ආචාර්ය මර්වින් ප්‍රනාන්දු පිය තුමා විසින් ලියන ලද 'මිනිසාගේ ඉතිහාසය සහ අනාගතය' පොතෙනි.)

ප්‍රකාශන - අංක 03
1999 - දෙසැම්බර්
මෙම ප්‍රකාශනය පිළිබඳ වගකීම "දහම් නවෝදය"